# සිංහල භාෂාව හා සාහිත්‍යය

## 11 ශ්‍රේණිය

## ගුරු මාර්ගෝපදේශය

(2016 සිට ක්‍රියාත්මක වේ.)



සිංහල භාෂා දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය
ශ්‍රී ලංකාව.
www.nie.lk

# සිංහල භාෂාව හා සාහිත්‍යය

## ගුරු මාර්ගෝපදේශය

## 11 ශ්‍රේණිය

(2016 සිට ක්‍රියාත්මක වේ.)

**සිංහල භාෂා දෙපාර්තමේන්තුව**
**භාෂා මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය**
**ජාතික අධ්‍යාපන ආයතනය**
**ශ්‍රී ලංකාව.**

**සිංහල භාෂාව හා සාහිත්‍යය**

11 ශ්‍රේණිය

ගුරු මාර්ගෝපදේශය

ප්‍රථම මුද්‍රණය 2016

© ජාතික අධ්‍යාපන ආයතනය

සිංහල භාෂා දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය
ශ්‍රී ලංකාව

වෙබ් අඩවිය : www.nie.lk
විද්‍යුත් තැපැල : info@nie.lk

## අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවිඩය

ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව මගින් නිර්දේශ කරන ලද ජාතික මට්ටමේ නිපුණතා සංවර්ධනය කිරීමේ මූලික අරමුණ සහිත ව එවකට පැවති අන්තර්ගතය පදනම් වූ අධ්‍යාපනය වෙනුවට වර්ෂ අටකින් යුතු චක්‍රයකින් සමන්විත නව නිපුණතා පාදක විෂයමාලාවෙහි පළමු අදියර වර්ෂ 2007 දී ශ්‍රී ලංකාවේ ද්විතීයික අධ්‍යාපන ක්ෂේත්‍රයට හඳුන්වා දෙන ලදි.

නව විෂයමාලා චක්‍රයේ දෙවන අදියර 2016 වර්ෂයේ දී හත් වන සහ එකොළොස් වන ශ්‍රේණි සඳහා හඳුන්වා දීම කළ යුතු ව තිබේ. මේ සඳහා පර්යේෂණවලින් අනාවරණය වූ කරුණු ද අධ්‍යාපනය පිළිබඳ ව අවධානය යොමු කරන විවිධ පාර්ශවයන්ගේ යෝජනා ද පදනම් කොට ගෙන විෂය නිර්දේශ තාර්කිකරණය කිරීමේ ක්‍රියාවලියක් ජාතික අධ්‍යාපන ආයතනය විසින් හඳුන්වා දෙනු ලැබී ය.

මෙම තාර්කිකරණ ක්‍රියාවලියේ දී සියලු ම විෂයයන්ගේ නිපුණතා මට්ටම්, පදනම් මට්ටමේ සිට උසස් මට්ටම දක්වා ක්‍රමානුකූල ව ගොඩ නැගීම සඳහා පහළ සිට ඉහළට ගමන් කරන සිරස් සංකලනය භාවිත කරන ලදි. විවිධ විෂයයන්හි දී එක ම විෂය කරුණු නැවත නැවත ඉදිරිපත් වීම හැකිතාක් අවම කිරීම, වැඩි බර පැටවීම්වලින් යුක්ත විෂය අන්තර්ගතයන් අඩු කිරීම සහ ක්‍රියාත්මක කළ හැකි ශිෂ්‍ය මිතුරු විෂයමාලාවක් සැකසීම සඳහා තිරස් සංකලනය භාවිත කර ඇත.

ගුරු භවතුන් සඳහා පාඩම් සැලසුම් කිරීම, ඉගැන්වීම, ක්‍රියාකාරකම් කර ගෙන යෑම, මැනීම් හා ඇගයීම් යනාදි අංශ සඳහා අවශ්‍ය වන්නා වූ මාර්ගෝපදේශය ලබා දීමේ අරමුණින් මෙම නව ගුරු මාර්ගෝපදේශය හඳුන්වා දී ඇත. පන්ති කාමරය තුළ දී වඩාත් ඵලදායී ගුරුවරයකු ලෙස කටයුතු කිරීමට මෙම මාර්ගෝපදේශය උපකාර වනු ඇත. සිසුන්ගේ නිපුණතා වර්ධනය කිරීම සඳහා ගුණාත්මක යෙදවුම් හා ක්‍රියාකාරකම් තෝරා ගැනීමට ගුරුවරුන්ට අවශ්‍ය නිදහස මෙමගින් ලබා දී තිබේ. එමෙන් ම නිර්දේශිත පාඨ ග්‍රන්ථවල ඇතුළත් වන විෂය කරුණු පිළිබඳ ව වැඩි බර තැබීමක් මෙම ගුරු මාර්ගෝපදේශවල අන්තර්ගත නො වේ. එම නිසා මෙම ගුරු මාර්ගෝපදේශය වඩාත් ඵලදායී වීමට නම් අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව විසින් සකසා ඇති අදාළ පාඨ ග්‍රන්ථ සමග සමගාමී ව භාවිත කිරීම අත්‍යවශ්‍ය වේ.

තාර්කිකරණය කරන ලද විෂය නිර්දේශ, නව ගුරු මාර්ගෝපදේශ හා අලුතින් සංවර්ධනය කර ඇති පාඨ ග්‍රන්ථවල මූලික අරමුණු වන්නේ ගුරු කේන්ද්‍රීය අධ්‍යාපන රටාවෙන් සිසු කේන්ද්‍රීය අධ්‍යාපන රටාවකට හා වඩාත් ක්‍රියාකාරකම් මත පදනම් වූ අධ්‍යාපන රටාවකට වෙනස් වීමෙන් වැඩ ලෝකයට අවශ්‍ය වන නිපුණතා හා කුසලතාවලින් යුක්ත මානව සම්පතක් බවට ශිෂ්‍ය ප්‍රජාව සංවර්ධනය කිරීම ය.

මෙම ගුරු මාර්ගෝපදේශ සම්පාදනය කිරීමේ දී ජාතික අධ්‍යාපන ආයතනයේ ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලය ද ආයතනයේ සභාව ද නන් අයුරින් දායකත්වය ලබා දුන් සියලු ම සම්පත්දායකයන් හා අනිකුත් පාර්ශවයන්ගේ ඉමහත් කැපවීම ඇගැයීමට ද මෙය අවස්ථාවක් කර ගනු කැමැත්තෙමි.

අධ්‍යක්ෂ ජනරාල්,
ජාතික අධ්‍යාපන ආයතනය.

## නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් හිමිගේ පණිවිඩය

ඉගෙනුම පුළුල් ක්ෂේත්‍රයක විහිද යන්නකි. එය ජීවිත අතිමහත් බවට ද, ඉතා ම සරල බවට ද පත් කරයි. මනුෂ්‍යයා ඉගෙනුම් කුසලතාවෙන් උත්කෘෂ්ට ය. මානව සමාජ සංවර්ධනය කේන්ද්‍ර කොට ගත් රටක්, සමාජයක් බුද්ධිය විසින් හඳුනා ගත් අසම්මතයන් බැහැර කිරීමට ද සුභාවිතයන් මගින් නව ලොවක් නිර්මාණය කර ගැනීමට ද මෙවලම කර ගනු ලබන්නේ ඉගෙනුම යි.

ඉගෙනුම සඳහා වටිනා යමක් ද, ඉගෙනුම් ක්‍රමවේද හා පහසුකම් ද අධ්‍යාපනය වටා නිර්මාණය විය යුතු ය. විෂය මාලාව, විෂය නිර්දේශය, මාර්ගෝපදේශ හා සුසාධ්‍යකරුවන් ඉගෙනුම් ක්ෂේත්‍රයට එක් වනුයේ මේ ආකාරයෙනි.

නූතන ශ්‍රී ලංකාව ගෝලීය ප්‍රවණතා මෙන් ම පුරාතන උරුමය ද සම්මිශ්‍රණය කර ගනිමින් ස්වීය අධ්‍යාපන රටාවක් හිමි කර ගෙන ඇත. කාලීන අවශ්‍යතා මත ප්‍රතිසංස්කරණ මගින් වසර අටකට වරක් යාවත්කාලීන වන විෂයමාලාවේ ඉගෙනුම් සම්පතක් ලෙස මෙම ගුරු මාර්ගෝපදේශය නිර්මාණය වේ.

විෂයයෙහි අරමුණුවල සංගතතාව ජාතික මට්ටමින් පවත්වා ගත යුතු ය. එහෙත් ගුරු මාර්ගෝපදේශවල ඉගෙනුම් ක්‍රමවේද, අකුරක්වත් වෙනස් නො කොට පිළිපැදිය යුත්තක් නම් නො වේ. විෂය නිර්දේශයෙහි නිපුණතා, නිපුණතා මට්ටම් සාධනය වීම සඳහා අන්තර්ගතය මගින් ඉගෙනුම් පල සම්ප්‍රාප්තිය පිණිස ඉගෙනුම් ක්‍රමවේද නිර්මාණශීලී ව වෙනස් කර ගැනීමට සුසාධ්‍යකරුවන්ට පැහැදිලි ව ම ඉඩක් ඇති බව සඳහන් කරමි. ශිෂ්‍ය සාධන ප්‍රතිශතය ඉහළ මට්ටමකට ගැනීම සඳහා උදව් වන, පහසුකම් සලසන ගුරු භූමිකාවට කිසියම් ප්‍රවේශයක් සඳහා නිර්මාණය වන ගුරු මාර්ගෝපදේශ ශික්ෂකයාහට ද දෙගුරුනට ද භාවිත කළ හැකි ය. අදාළ පෙළ පොතට සහකරුවකු වන ගුරු මාර්ගෝපදේශය තවත් පෙළ පොතක් නොවන බව දැන ගුරුභවතුන් පෙළ පොත හා ගුරු මාර්ගෝපදේශ යන සම්පත් ද්‍රව්‍ය දෙක ම භාවිත කළ යුතු ය.

ඒ ඒ විෂයයන්හි සාධනය පිළිබඳ ඇගයීම් සිදු කරන ජාතික මට්ටමේ පරීක්ෂකවරයෙකු වුව ද අපේක්ෂා කරන සාධනයන්, විෂය ඉගැන්වීමට මග පෙන්වන සුසාධ්‍යකරුවන් විසින් පාඩම අවසානයෙහි පන්ති කාමරයේ දී දරුවන් සමග ප්‍රත්‍යක්ෂකරණයට පත් විය යුතු ය. එම ඒකාත්මික වීම සඳහා වූ ප්‍රබෝධාත්මක සංස්කෘතියක් ගොඩනගා ගැනීමට ගුරු මාර්ගෝපදේශය යාත්‍රාවක් කර ගනු ඇතැයි ආයාචනා පූර්වක ව අපේක්ෂා කරමි.

පීඨාධිපති, නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්,
භාෂා මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය,
ජාතික අධ්‍යාපන ආයතනය.

# විෂයමාලා කමිටුව

**උපදේශකත්වය හා අනුමැතිය :** ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලය,
ජාතික අධ්‍යාපන ආයතනය.

**සම්බන්ධීකරණය :** පී. ඒ. ඩී. රුවනි සිසිජා,
සහකාර කථිකාචාර්ය,
සිංහල භාෂා දෙපාර්තමේන්තුව,
ජාතික අධ්‍යාපන ආයතනය.

**භාෂා සංස්කරණය** තිස්ස ජයවර්ධන,
විශ්‍රාමික මහාචාර්ය,
කොළඹ විශ්වවිද්‍යාලය,
කොළඹ.

**අභ්‍යන්තර ලේඛක මණ්ඩලය :** ඩී.ඩබ්. දිසානායක,
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය,
සිංහල භාෂා දෙපාර්තමේන්තුව,
ජාතික අධ්‍යාපන ආයතනය.

ඊ. ආර්. නිමල් ප්‍රේමකුමාර,
කථිකාචාර්ය,
සිංහල භාෂා දෙපාර්තමේන්තුව,
ජාතික අධ්‍යාපන ආයතනය.

එම්. ජී. මුණසිංහ,
කථිකාචාර්ය,
සිංහල භාෂා දෙපාර්තමේන්තුව,
ජාතික අධ්‍යාපන ආයතනය.

තිලිනි රත්නායක,
කථිකාචාර්ය,
සිංහල භාෂා දෙපාර්තමේන්තුව,
ජාතික අධ්‍යාපන ආයතනය.

ඩබ්ලිව්. පී. මංගල ගුණරත්න,
සහකාර කථිකාචාර්ය,
සිංහල භාෂා දෙපාර්තමේන්තුව,
ජාතික අධ්‍යාපන ආයතනය.

පී. ඒ. ඩී. රුවනි සිසිජා,
සහකාර කථිකාචාර්ය,
සිංහල භාෂා දෙපාර්තමේන්තුව,
ජාතික අධ්‍යාපන ආයතනය.

බාහිර ලේඛක මණ්ඩලය :

එච්. එල්. ශ්‍රියානි අබේවික්‍රම,
නියෝජ්‍ය අධ්‍යක්ෂ,
ජාතික භාෂා හා මානව ශාස්ත්‍ර අංශය,
අධ්‍යාපන අමාත්‍යාංශය,
බත්තරමුල්ල.

එස්. ඕ. ප්‍රනාන්දු,
විශ්‍රාමික අධ්‍යක්ෂ,
සිංහල භාෂා දෙපාර්තමේන්තුව,
ජාතික අධ්‍යාපන ආයතනය,
මහරගම.

එච්. පී. සුසිල් සිරිසේන,
කථිකාචාර්ය,
හාපිටිගම් අධ්‍යාපන විද්‍යාපීඨය,
මීරිගම.

ඩබ්. කරුණාරත්න,
කථිකාචාර්ය,
ගුරු මධ්‍යස්ථාන කළමනාකරු,
ගුරු මධ්‍යස්ථානය,
ගිරාගම,
පිළිමතලාව.

ගයා වැයිහේන,
ගුරු උපදේශක,
කොට්ඨාශ අධ්‍යාපන කාර්යාලය,
පාදුක්ක.

සුනිල් බියන්විල,
ගිරි/වික්‍රමශිලා ජාතික පාසල,
ගිරිඋල්ල.

විෂය නිර්දේශ සම්පාදනය:

මහාචාර්ය රත්නසිරි අරංගල,
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය,
නුගේගොඩ.

මහාචාර්ය ජයන්ත අමරසිංහ,
රුහුණු විශ්වවිද්‍යාලය,
මාතර.

පූජ්‍ය කුකුරම්පොළ ඥාණවිමල හිමි, කථිකාචාර්ය,
සිංහල භාෂා දෙපාර්තමේන්තුව,
ජාතික අධ්‍යාපන ආයතනය,
මහරගම.

එම්. ජී. මුණසිංහ, කථිකාචාර්ය,
සිංහල භාෂා දෙපාර්තමේන්තුව,
ජාතික අධ්‍යාපන ආයතනය,
මහරගම.

තිලිනි රත්නායක, කථිකාචාර්ය,
සිංහල භාෂා දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය,
මහරගම.

ඩබ්ලිව්. පී. මංගල ගුණරත්න, සහකාර කථිකාචාර්ය,
සිංහල භාෂා දෙපාර්තමේන්තුව,
ජාතික අධ්‍යාපන ආයතනය,
මහරගම.

පී. ඒ. ඩී. රුවනි සිසිජා, සහකාර කථිකාචාර්ය,
සිංහල භාෂා දෙපාර්තමේන්තුව,
ජාතික අධ්‍යාපන ආයතනය,
මහරගම.

එස්. ඕ. ප්‍රනාන්දු, විශ්‍රාමික අධ්‍යක්ෂ,
සිංහල භාෂා දෙපාර්තමේන්තුව,
ජාතික අධ්‍යාපන ආයතනය,
මහරගම.

එච්. එල්. ශ්‍රියානි අබේවික්‍රම,
නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ,
ජාතික භාෂා හා මානව ශාස්ත්‍ර අංශය,
අධ්‍යාපන අමාත්‍යාංශය, ඉසුරුපාය,
බත්තරමුල්ල.

එච්. පී. සුසිල් සිරිසේන, කථිකාචාර්ය,
හාපිටිගම ජාතික අධ්‍යාපන
විද්‍යාපීඨය,
මීරිගම.

ගයා වැයිහේන, ගුරු උපදේශක,
කොට්ඨාස අධ්‍යාපන කාර්යාලය,
පාදුක්ක.

සුනිල් බියන්විල, ගුරුසේවය,
ගිරි/වික්‍රමශිලා ජාතික පාසල,
ගිරිඋල්ල.

## ගුරු මාර්ගෝපදේශය පරිශීලනය සඳහා උපදෙස්

සිංහල භාෂාව හා සාහිත්‍යය විෂයට අදාළ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සාර්ථක ව ඉටු කර ගැනීම සඳහා මෙම ගුරු මාර්ගෝපදේශය සම්පාදනය කර ඇත. මෙහි ඉගැන්වීම් ක්‍රියාකාරකම්වලට අනුකූල ව පාඩම් සැලසුම් සකස් කර ගැනීමට කටයුතු කිරීම ඵලදායී වේ යැයි අපේක්ෂා කෙරේ.

දැනට පාසල් පද්ධතිය තුළ ක්‍රියාත්මක වනුයේ නිපුණතා පාදක විෂයමාලාවකි. මෙහි ඇතුළත් සියලු පාඩම් සැලසුම් ඉදිරිපත් කර ඇත්තේ ඊට අනුරූප වන පරිදි ය. නිපුණතාව, නිපුණතා මට්ටම හා විෂය අන්තර්ගතයට අදාළ කාලච්ඡේද සංඛ්‍යාව හා ඉගෙනුම් පල ද ඒ අනුව ඇතුළත් කර තිබේ. පාඩම් සැලසුම් කිරීම සඳහා උපදෙස් ද, භාවිත කළ හැකි ගුණාත්මක යෙදවුම් ද, ඇගයීම හා තක්සේරුකරණය සඳහා වන උපදෙස් ද ඉදිරිපත් කර ඇත්තේ නිපුණතා සංවර්ධනය සඳහා ඉවහල් වන පරිද්දෙනි. ශ්‍රේණියට අදාළ විෂය අන්තර්ගතය ඒ ඒ වාරවලට අනුව බෙදා දක්වන ලද සටහනක් ද මේ සමග ඉදිරිපත් කර ඇත්තේ ගුරු භවතාගේ පහසුව පිණිස ය.

මාර්ගෝපදේශයෙහි උපදෙස් අනුව එදිනෙදා ඉගැන්වීම් කාර්යය සඳහා උචිත පාඩම් සැලසුම් ගුරුභවතාගේ අභිමතය පරිදි සකස් කර ගත යුතු ය. මෙහි දී ශිෂ්‍යයන්ගේ දැනුම, කුසලතා සහ ආකල්ප වර්ධනය වන පරිදි හා නිපුණතා සාක්ෂාත් වන පරිදි නිර්මාණශීලී ඉගෙනුම් අවස්ථා සම්පාදනය කර ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය වඩාත් අර්ථ සම්පන්න බවට පත් කිරීම ඔබගේ යුතුකම වන්නේ ය. ගුණාත්මක යෙදවුම් යටතේ ගුරුවරයාගේ පරිශීලනය සඳහා ඉදිරිපත් කර ඇති පොතපත ඉවහල් කරගෙන ශිෂ්‍ය ඉගෙනුම් අත්දැකීම් තව දුරටත් පුළුල් කිරීම සඳහා කටයුතු කිරීම ද වැදගත් වනු ඇත. ඔබට විවිධ ගුරු භූමිකා හෝ විවිධ ක්‍රමවේද හෝ භාවිත කළ හැකි ය. එහෙත් අර්ථසම්පන්න ඉගෙනුම් පරිසරයක් පන්ති කාමරය තුළ නිර්මාණය කිරීම ඔබගේ කාර්යයයි.

ඔබ හඳුනාගත් ශිෂ්‍යයන්ගේ නිර්මාණශීලී කුසලතා වර්ධනය සඳහා කටයුතු කිරීමේ දී මෙහි සඳහන් පාසල් ප්‍රතිපත්ති හා වැඩසටහන් යටතේ නිර්දේශ කර ඇති දේශන, වාද විවාද, සාකච්ඡා ආදිය ද අවස්ථානුකූල ව යොදා ගත හැකි ය. ඉගෙනුම් ක්‍රියාවලිය තාක්ෂණය හා බද්ධ කර ගැනීම කාලෝචිත වනු ඇත. එනිසා හැකි සෑම අවස්ථාවක දී ම එවැනි තාක්ෂණික ඉගෙනුම් ආධාරක හෝ මෙවලම් හෝ භවිත කිරීම මගින් ඔබගේ ඉගැන්වීම් කාර්යයෙහි ගුණාත්මක බව වර්ධනය කර ගත හැකි ය. සෑම පාඩම් සැලසුමක් අවසානයේ දී ම ඇගයීම් හා තක්සේරුකරණ ක්‍රියාවලිය සඳහා අවශ්‍ය උපදෙස් ඉදිරිපත් කර ඇත. එම නිර්ණායක මැනෙන පරිදි සුදුසු ඇගයීම් වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කිරීමෙන් ඉගෙනුම් කාර්යය සඵල වනවා මෙන් ම ශිෂ්‍ය සාධන මට්ටම් ද ඉහළ යනු ඇත. භාෂා විෂයයේ වැදගත් ක්ෂේත්‍ර වන ශ්‍රවණ හා කථන කුසලතා මැනෙන පරිදි වාචික පරීක්ෂණ සැලසුම් කොට ක්‍රියාත්මක කිරීම ද භාෂා අධ්‍යයනය වඩාත් ඵලදායී වීමට හේතු වනු ඇත.

මෙම මාර්ගෝපදේශයෙහි අන්තර්ගත උපදෙස් ක්‍රියාත්මක කිරීමේ දී ශිෂ්‍යයන්ට උචිත පරිදි නිර්මාණශීලී ඉගැන්වීම් ක්‍රම ක්‍රියාත්මක කිරීම සඳහා ඔබට අවකාශ සලසා ඇති අතර, ඒ අනුව කටයුතු කිරීමෙන් ඔබගේ ඉගෙනුම් ඉගැන්වීම් කාර්යය සාර්ථක කර ගැනීමට හැකි වේවා යනු අපගේ ප්‍රාර්ථනයයි.

ලේඛක මණ්ඩලය

| වාරය | පෙළ පොතේ පාඩම් අංකය | ගුරු මාර්ගෝපදේශයේ ක්‍රියාකාරකම් අංකය | නිපුණතා මට්ටම් | විෂය අන්තර්ගතය | කාලච්ඡේද |
|---|---|---|---|---|---|
| 1 | 1 | 1<br>2 | 9.1<br>4.2 | දළදා පෙරහැර<br>වචන වෙන් කොට ලිවීම | 2<br>1 |
| | 2 | 3 | 1.3 | දුකට කියන කවි සීපද | 2 |
| | 3 | 4<br>5 | 3.1<br>3.3 | අක්ෂර මාලාව<br>අක්ෂර වින්‍යාසය | 2<br>2 |
| | 4 | 6<br>7 | 3.2<br>5.1 | ශබ්දකෝෂ හා විශ්වකෝෂ භාවිතය<br>වාක්කෝෂය පිළිබඳ පරිචය | 2<br>1 |
| | 5 | 8 | 2.2 | රසින් රස මවන.. (මහා කපි ජාතකය) | 3 |
| | 6 | 9 | 6.5 | වාක්‍ය රීති | 5 |
| | 7 | 10 | 8.1 | වාක්‍ය රචනය | 2 |
| | 8 | 11<br>12 | 11.2, 11.3<br>8.3 | සාහිත්‍ය රසවින්දනය හා විචාරය<br>සාරාංශකරණය | 4<br>2 |
| | 9 | 13 | 1.4 | දියවර සිරිසර (ගුවන්විදුලි වැඩසටහන) | 2 |
| 2 | 10 | 14 | 2.3 | ශ්‍රීමත් අයිවර් ජෙනිංස් | 2 |
| | 11 | 15 | 6.1 | විභක්ති | 2 |
| | 12 | 16<br>17 | 1.5, 1.6<br>7.1 | බස ඉපදුණු සැටි... (විද්වත් සාකච්ඡා)<br>රාජකාරි ලිපි | 3<br>1 |
| | 13 | 18<br>19 | 1.7<br>8.2 | බහුවිධ මාධ්‍ය භාවිතය<br>බිත්ති පුවත්පත් හා සඟරා ලිපි | 3<br>2 |
| | 14 | 20<br>21 | 5.3<br>6.4 | රට වටා පද රටා (සිංහල ජන වහර)<br>සන්ධි | 2<br>2 |
| | 15 | 22 | 6.1 | සමාස | 3 |
| | 16 | 23 | 10.1 | ශෝකයත් රසයක් කළ.. (ශේක්ෂ්පියර්) | 2 |
| | 17 | 24 | 6.1 | ප්‍රත්‍යයාර්ථ නාම | 4 |
| | 18 | 25 | 9.3 | මිහි ලිය නළලේ (දේශාභිමානී ගීතය) | 2 |
| 3 | 19 | 26<br>27 | 9.5<br>6.2 | බලංගොඩ ආනන්ද මෛත්‍රේය හිමි<br>ක්‍රියා පද | 2<br>2 |
| | 20 | 28<br>29 | 10.3<br>6.3 | අද්‍යතන සාහිත්‍ය නිර්මාණයන්හි භාෂාව<br>අව්‍යය පද | 2<br>2 |
| | 21 | 30<br>31 | 11.1<br>12.2 | වතුර මල (කෙටිකතාව)<br>කෙටිකතා නිර්මාණය | 2<br>2 |
| | 22 | 32<br>33 | 7.2<br>7.2 | පුවත්පත් වාර්තා රචනය<br>ප්‍රායෝගික ලේඛන | 2<br>2 |
| | 23 | 34 | 9.2 | සුභාෂිතය | 3 |
| | 24 | 35 | 12.1 | අත්දැකීම් ප්‍රති නිර්මාණය (පද්‍ය නිර්මාණය) | 2 |
| | 25 | 36<br>37 | 10.2<br>4.1 | ශ්‍රී ලංකාවේ.. (භූ ගවේෂණය)<br>විරාම ලකුණු | 2<br>2 |
| | 26 | 38 | 9.4 | මුස්ලිම් ජනතාවගේ සිරිත් විරිත් | 2 |
| | 27 | 39<br>40 | 12.3<br>5.2 | තල මල පිපිලා<br>සාම්ප්‍රදායික යෙදුම් | 2<br>2 |

# පටුන


| | පිටුව |
|---|---|
| අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවිඩය | iii |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් හිමිගේ පණිවිඩය | iv |
| විෂයමාලා කමිටුව | v - vii |
| ගුරු මාර්ගෝපදේශය පරිශීලනය සඳහා උපදෙස් | viii - ix |
| පටුන | x |
| විෂය නිර්දේශයේ අන්තර්ගතය | xi - xxxi |
| ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස් | 1 |
| දළදා පෙරහැර | 2 |
| වචන වෙන් කොට ලිවීම | 3 |
| දුකට කියන කවි සීපද | 4 - 5 |
| අක්ෂර මාලාව | 6 - 7 |
| අක්ෂර වින්‍යාසය | 8 - 9 |
| ශබ්දකෝෂ හා විශ්වකෝෂ භාවිතය | 10 |
| වාක්කෝෂය පිළිබඳ පරිචය | 11 |
| රසින් රස මවන බස් මහිමය (මහා කපි ජාතකය) | 12 |
| වාක්‍ය රීති | 13 |
| වාක්‍ය රචනය | 14 - 15 |
| සාහිත්‍ය රසවින්දනය හා විචාරය | 16 |
| සාරාංශකරණය | 17 - 18 |
| දියවර සිරිසර (විද්‍යුත් මාධ්‍ය වැඩසටහන්වලට සවන් දීම) | 19 |
| ශ්‍රීමත් අයිවර් ජෙනිංස් | 20 |
| විභක්ති | 21 |
| බස ඉපදුණු සැටි අසනුය විස්තර (විද්වත් සාකච්ඡා) | 22 - 23 |
| රාජකාරි ලිපි | 24 |
| බහුවිධ මාධ්‍ය භාවිතය | 25 - 26 |
| බිත්ති පුවත් පත් ලිපි හා සඟරා ලිපි | 27 |
| රට වටා පද රටා (සිංහල ජන වහර) | 28 - 30 |
| සන්ධි | 31 |
| සමාස | 32 - 33 |
| ශෝකයත් රසයක් කළ මිනිසෙක් (විලියම් ශේක්ෂ්පියර්) | 34 - 35 |
| ප්‍රත්‍යයාර්ථ නාම | 36 |
| මිහි ලිය නළලේ ... (දේශාභිමානී ගීතය) | 37 |
| බලංගොඩින් ගැලූ පැණසර මෙත් ගඟුල (ආනන්ද මෛත්‍රේය හිමි) | 38 |
| ක්‍රියා පද | 39 - 41 |
| අද්‍යතන සාහිත්‍ය නිර්මාණයන්හි භාෂාව | 42 |
| අව්‍යය පද | 43 - 44 |
| වතුර මල (කෙටිකතාව) | 45 - 46 |
| නිර්මාණාත්මක ප්‍රබන්ධ රචනය (කෙටිකතා නිර්මාණය) | 47 - 48 |

පුවත්පත් වාර්තා රචනය 49
ප්‍රායෝගික ලේඛන 50
සුභාෂිතය 51
අත්දැකීම් ප්‍රතිනිර්මාණය (පද්‍ය නිර්මාණය) 52 - 55
ශ්‍රී ලංකාවේ ජුරාසික යුගය (භූ ගවේෂණය) 56
විරාම ලකුණු 57
මුස්ලිම් ජනතාවගේ සිරිත් විරිත් 58 - 59
නාට්‍ය පිටපත් රචනය (තල මල පිපිලා නාට්‍යය ඇසුරෙන්) 60 - 61
සාම්ප්‍රදායික යෙදුම් 62 - 63

# සිංහල භාෂාව හා සාහිත්‍යය

## විෂය නිර්දේශය

## 11 ශ්‍රේණිය

**(2016 සිට ක්‍රියාත්මක කෙරේ)**

සිංහල භාෂා දෙපාර්තමේන්තුව
භාෂා මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය
ශ්‍රී ලංකාව.

## හැඳින්වීම

අනාගත ලෝකයේ අභියෝග ජයගැනීමට සමත් දරු පරපුරක් රටට දායාද කිරීමේ කාර්ය භාරයේ වැඩි වගකීම හිමිවන්නේ අධ්‍යාපනයට ය. ශීඝ්‍රයෙන් ව්‍යාප්ත වන දැනුම උකහා ගැනීම සඳහා අවශ්‍ය භාෂා කුසලතා සංවර්ධනය කිරීම අත්‍යවශ්‍ය කරුණකි. සිංහල භාෂාව, ශ්‍රී ලංකාවේ පාසල් අධ්‍යාපනයේ ප්‍රධාන මාධ්‍ය භාෂාව වේ. සිංහල භාෂාව ඇතුළු ව අනෙකුත් විෂය හැදෑරීම සඳහා සිංහල භාෂාව පිළිබඳ නිවැරදි දැනුම අත්‍යවශ්‍ය ය. භාෂාවේ චතුර්විධ කුසලතා වර්ධනය කර ගැනීමෙන් විෂය සාධන මට්ටම ඉහළ තලයකට නංවාලිය හැකි ය. සියලු විෂයන්හි සාධන මට්ටම වර්ධනය සඳහා භාෂා දැනුම අවශ්‍ය හෙයින් සිංහල භාෂාව පිළිබඳ කුසලතා සංවර්ධනය කිරීම මවුබස සිංහල විෂයයේ වගකීමක් ලෙස හඳුනා ගෙන ඇත.

සිංහල භාෂාව සියවස් ගණනාවක් තිස්සේ විකාශනය වූ භාෂාවකි. ඒ නිසා ම එහි විවිධ වාක්‍ය රීති මෙන් ම භාෂා ව්‍යවහාර ද දක්නට ලැබේ. ඒවා අධ්‍යයනය කිරීමෙන් භාෂා මාමකත්වයෙන් යුතු ව කටයුතු කිරීමට යොමු වනු ඇතැයි අපේක්ෂා කෙරේ. සිංහල සාහිත්‍යය, සිංහල භාෂා විෂය සමග ඒකාබද්ධ වූ විෂය කොටසකි. දයාව, කරුණාව ආදි මානව ගුණධර්මවලින් හෙබි සුබනම්‍ය මනසකින් හා සමබර පෞරුෂයකින් යුතු සංවේදී දරු පරපුරක් බිහි කිරීම සඳහාත් සාහිත්‍ය සේවනය අත්‍යවශ්‍ය සාධකයකි.

නව විෂය නිර්දේශය සකස් කිරීම සඳහා දැනට ක්‍රියාත්මක විෂය නිර්දේශය පාදක කර ගෙන ඇත. ඒ අනුව නව විෂය නිර්දේශය ද නිපුණතා පාදක ව ඉදිරිපත් කෙරේ. මෙම විෂය නිර්දේශය සකස් කිරීමේ දී ආචාර්ය ජැනට් රෙනෝල්ඩ්ස් මහත්මියගේ සහ ආචාර්ය සෙනරත් නානායක්කාර මහතාගේ ශ්‍රී ලංකාවේ 6 - 9 ශ්‍රේණි සඳහා විෂය ප්‍රමිති රාමුව (Standards for grade 6 - 9 subjects in Sri Lankan Schools. Authors - Dr. Janet Reynolds and Dr. Senarath Nanayakkara) නමැති ලේඛනයේ ඇතැම් අංග උචිත පරිදි යොදා ගෙන ඇත.

## ජාතික පොදු අරමුණු

පුද්ගලයාට හා සමාජයට අදාළ වන ප්‍රධාන ජාතික අරමුණු කරා ළඟා වීම සඳහා පුද්ගලයන්ට සහ කණ්ඩායම්වලට ජාතික අධ්‍යාපන පද්ධතියට සහාය විය යුතු ය.

වසර ගණනාවක් මුළුල්ලේ ශ්‍රී ලංකාවේ ප්‍රධාන අධ්‍යාපන වාර්තා සහ ලේඛන මගින් පුද්ගල හා ජාතික අවශ්‍යතාවන් සපුරා ලීම සඳහා අරමුණු නියම කරනු ලැබී ය. සමකාලීන අධ්‍යාපන ව්‍යුහයන් හා ක්‍රියාවලිය තුළ දැකිය හැකි දුර්වලතා නිසා ධරණීය මානව සංවර්ධන සංකල්ප රාමුව ඇතුළත අධ්‍යාපනයෙන් ළඟා කර ගත යුතු පහත දැක්වෙන අරමුණු සපුරා ගැනීම අධ්‍යාපන පද්ධතිය සඳහා වූ තම ඉදිරි දැක්ම ලෙසට ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් ප්‍රත්‍යක්ෂ කොට ගෙන ඇත.

I මානව අභිමානයට ගරු කිරීමේ සංකල්පයක් මත පිහිටා ශ්‍රී ලාංකික බහුවිධ සමාජයේ සංස්කෘතික විවිධත්වය අවබෝධ කර ගනිමින් ජාතික ඒකාබද්ධතාව, ජාතික ඍජු ගුණය, ජාතික සමගිය, එකමුතුකම සහ සාමය ප්‍රවර්ධනය කිරීමෙන් ජාතිය ගොඩ ගැනීම සහ ශ්‍රී ලාංකීය අනන්‍යතාව තහවුරු කිරීම.

II වෙනස් වන ලෝකයක අභියෝගයන්ට ප්‍රතිචාර දක්වන අතර ජාතික උරුමයේ මාහැඟි දායාද හඳුනා ගැනීම සහ සංරක්ෂණය කිරීම.

III මානව අයිතිවාසිකම් ගරු කිරීම, යුතුකම් හා වගකීම් පිළිබඳ දැනුවත් වීම, හෘදයාංගම බැඳීමකින් යුතු ව එකිනෙකා කෙරෙහි සැලකිලිමත් වීම යන ගුණාංග ප්‍රවර්ධනය කිරීමට ඉවහල් වන සමාජ සාධාරණත්ව සම්මතයන් සහ ප්‍රජාතන්ත්‍රික ජීවන රටාවක් ගැබ් වූ පරිසරයක් නිර්මාණ කිරීම සහ පවත්වා ගෙන යාමට සහාය වීම.

IV පුද්ගලයන්ගේ මානසික හා ශාරීරික සුව සම්පත සහ මානව අගයන්ට ගරු කිරීම මත පදනම් වූ තිරසාර ජීවන ක්‍රමයක් ප්‍රවර්ධනය කිරීම.

V සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාපණ හැකියාව, ආරම්භක ශක්තිය විචාරශීලී චින්තනය, වගකීම හා වගවීම ඇතුළු වෙනත් ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය කිරීම.

VI පුද්ගලයාගේ සහ ජාතියේ ජීවගුණය වැඩිදියුණු කෙරෙන සහ ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය සඳහා දායක වන ඵලදායි කාර්යයන් සඳහා අධ්‍යාපනය මගින් මානව සම්පත් සංවර්ධනය කිරීම.

VII ශීඝ්‍රයෙන් වෙනස් වන ලෝකයක් තුළ සිදු වන වෙනස්කම් අනුව හැඩගැස්වීමට හා ඒවා පාලනය කර ගැනීමට පුද්ගලයින් සූදානම් කිරීම සහ සංකීර්ණ හා අනපේක්ෂිත අවස්ථාවන්ට සාර්ථක ව මුහුණ දීමේ හැකියාව වර්ධනය කිරීම.

VIII ජාත්‍යන්තර ප්‍රජාව අතර ගෞරවනීය ස්ථානයක් හිමි කර ගැනීමට දායක වන යුක්තිය සමානත්වය සහ අන්‍යෝන්‍ය ගරුත්වය මත පදනම් වූ ආකල්ප

## මූලික නිපුණතා

අධ්‍යාපනය මගින් වර්ධනය කෙරෙන පහත දැක්වෙන මූලික නිපුණතා ඉහත සඳහන් ජාතික අරමුණු ඉටුකර ගැනීමට දායක වනු ඇත

(I) සන්නිවේදන නිපුණතා

සාක්ෂරතාව, සංඛ්‍යා පිළිබඳ දැනුම, රූපක භාවිතය සහ තොරතුරු තාක්ෂණ ප්‍රවීණතාව යන අනුකාණ්ඩ 4ක් මත සන්නිවේදන නිපුණතා පදනම් කර ගනී.

සාක්ෂරතාව : සාවධාන ව ඇහුම්කන් දීම පැහැදිලි ව කථා කිරීම, තේරුම් ගැනීම සඳහා කියවීම, නිවැරදී ව සහ නිරවුල් ව ලිවීම, ඵලදායි අයුරින් අදහස් හුවමාරු කර ගැනීම

සංඛ්‍යා පිළිබඳ දැනුම : භාණ්ඩ, අවකාශය හා කාලය, ගණන් කිරීම, ගණනය සහ මිනුම් සඳහා ක්‍රමානුකූල ඉලක්කම් භාවිතය

රූපක භාවිතය : රේඛා සහ ආකෘති භාවිතයෙන් අදහස් පිළිබිඹු කිරීම සහ රේඛා, ආකෘති සහ වර්ණ ගළපමින් විස්තර, උපදෙස් හා අදහස් ප්‍රකාශනය හා වාර්තා කිරීම

තොරතුරු තාක්ෂණ ප්‍රවීණතාව : පරිගණක දැනුම සහ ඉගෙනීමේ දී ද සේවා පරිශ්‍රයක් තුළ දී ද පෞද්ගලික ජීවිතයේ දී ද තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය උපයෝගි කර ගැනීම

(II) පෞරුෂත්ව වර්ධනයට අදාළ නිපුණතා

- නිර්මාණශීලී බව, අපසාරී චින්තනය, ආරම්භක ශක්තීන්, තීරණ ගැනීම, ගැටලු නිරාකරණය කිරීම, විචාරශීලී හා විග්‍රහාත්මක චින්තනය, කණ්ඩායම් හැඟීමෙන් කටයුතු කිරීම, පුද්ගලාන්තර සබඳතා, නව සොයා ගැනීම් සහ ගවේෂණය වැනි වර්ගීය කුසලතා
- ඍජු ගුණය, ඉවසා දරා සිටීමේ ශක්තිය සහ මානව අභිමානයට ගරු කිරීම, වැනි අගයන්
- චිත්තවේගී බුද්ධිය

(III) පරිසරයට අදාළ නිපුණතා
මෙම නිපුණතා සාමාජික ජෛව සහ භෞතික පරිසරයට අදාළ වේ.

සමාජ පරිසරය : ජාතික උරුමය පිළිබඳ අවබෝධය, බහුවාර්ගික සමාජයක සමාජිකයන් වීම හා සම්බන්ධ සංවේදීතාව හා කුසලතා, සාධාරණ යුක්තිය පිළිබඳ හැඟීම, සමාජ සම්බන්ධතා, පෞද්ගලික චර්යාව, සාමාන්‍ය හා නෛතික සම්ප්‍රදායන්, අයිතිවාසිකම්, වගකීම්, යුතුකම් සහ බැඳීම්

ජෛව පරිසරය : සජීව ලෝකයක, ජනතාව සහ ජෛව පද්ධතිය, ගස් වැල්, වනාන්තර, මුහුදු ජලය, වාතය සහ ජීවය - ශාක, සත්ත්ව හා මිනිස් ජීවිතයට සම්බන්ධ වූ අවබෝධය, සංවේදී බව හා කුසලතා.

භෞතික පරිසරය : අවකාශය, ශක්තිය, ඉන්ධන, ද්‍රව්‍ය, භාණ්ඩ සහ මිනිස් ජීවිතයට එවායේ ඇති සම්බන්ධතාව, ආහාර, ඇඳුම්, නිවාස, සෞඛ්‍ය, සුව පහසුව, ශ්වසනය, නින්ද, නිස්කලංකය, විවේකය, අපද්‍රව්‍ය සහ මලපහ කිරීම යනාදිය හා සම්බන්ධ වූ අවබෝධය, සංවේදිතාව හා කුසලතාව

ඉගෙනීම, වැඩ කිරීම සහ ජීවත් වීම සඳහා මෙවලම් සහ තාක්ෂණය ප්‍රයෝජනයට ගැනීමේ කුසලතා මෙහි අඩංගුවේ.

(IV) වැඩ ලෝකයට සුදානම් වීමේ නිපුණතා

ආර්ථික සංවර්ධනයට දායක වීම.
තම වෘත්තීය ළැදියා සහ අභියෝග්‍යතා හඳුනා ගැනීම.
හැකියාවන්ට සරිලන අයුරින් රැකියාවක් තෝරා ගැනීම සහ
වාසිදායක හා තිරසාර ජීවනෝපායක නිරත වීම,
යන හැකියා උපරි ම කිරීමට හා ධාරිතාව වැඩි කිරීමට අදාළ සේවා නියුක්තිය හා සම්බන්ධ කුසලතා.

(V) ආගම සහ ආචාර ධර්මයන්ට අදාළ නිපුණතා

පුද්ගලයන්ට තම දෛනික ජීවිතයේ දී ආචාර ධර්ම, සදාචාරාත්මක හා ආගමානුකූල හැසිරීම් රටාවන්ට අනුගත වෙමින් වඩාත් උචිත දේ තෝරා එයට සරිලන සේ කටයුතු කිරීම සඳහා අගයයන් උකහා ගැනීම හා ස්වීයකරණය.

(VI) ක්‍රීඩාව සහ විවේකය ප්‍රයෝජනයට ගැනීමේ නිපුණතා

සෞන්දර්යය, සාහිත්‍යය, සෙල්ලම් කිරීම, ක්‍රීඩා හා මලල ක්‍රීඩා, විනෝදාංශ හා වෙනත් නිර්මාණාත්මක ජීවන රටාව මගින් ප්‍රකාශ වන විනෝදය, සතුට, ආවේග සහ එවන් මානුෂික අත්දැකීම්.

(VII) "ඉගෙනීමට ඉගෙනුම" පිළිබඳ නිපුණතා

ශීඝ්‍රයෙන් වෙනස් වන සංකීර්ණ හා එකිනෙකා මත යැපෙන ලෝකයක පරිවර්තන ක්‍රියාවලියක් හරහා වෙනස්වීම් හසුරුවා ගැනීමේ දී හා ඊට සංවේදී ව හා සාර්ථක ව ප්‍රතිචාර දැක්වීමත් ස්වාධීන ව ඉගෙන ගැනීමත් සඳහා පුද්ගලයන්ට ශක්තිය ලබා දීම.

## විෂය අරමුණු

1. චතුර්විධ භාෂා කුසලතා හා නිර්මාණාත්මක කුසලතා වර්ධනය කර ගැනීම.

2. නිරවද්‍ය හා සම්මත භාෂා භාවිතයෙහි පරිචිත භාවය අත්පත් කොට ගැනීම.

3. සාහිත්‍ය පරිශීලනයෙන් නිර්මාණාත්මක ලේඛන ශෛලි හා ශිල්පීය මූලධර්ම පිළිබඳ දැනුම හා අවබෝධය ලබා ගැනීම සහ වාංමාලාව පෝෂණය කර ගැනීම.

4. විශ්ව විශ්‍රැත සාහිත්‍යික, දාර්ශනික, විද්‍යාත්මක හා තාක්ෂණික ඥානය උකහා ගත හැකි වන පරිදි අවබෝධාත්මක පරිශීලනයට යොමු කිරීම.

5. සාහිත්‍ය කෘති පරිශීලනයෙන් සාහිත්‍ය විචාර මූලධර්ම අවබෝධ කොට ගෙන, වින්දනාත්මක හා විචාරාත්මක කුසලතා වර්ධනය කරගනිමින් රසාස්වාදයට යොමු වීම හා ජීවිත පරිඥානය අත්පත් කොට ගැනීම.

6. සිංහල සාහිත්‍ය ඉතිහාසය පිළිබඳ දැනුම පුළුල් කරගනිමින් සමාජ, සංස්කෘතික වටිනාකම් හඳුනා ගැනීම සඳහා පුරාතන හා නූතන සිංහල සාහිත්‍ය කෘති පරිශීලනය.

7. සාහිත්‍යයේ පදනම වන භෂාවෙන් නිරූපිත භාෂාමය අනන්‍යතාව හා තදනුබද්ධ සංස්කෘතික අනන්‍යතාව හැදෑරීම.

## සිංහල භාෂාව හා සාහිත්‍යය 11 ශ්‍රේණිය - විෂය නිර්දේශය

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 1.0 සන්නිවේදනය සාර්ථක කර ගැනීම සඳහා ශ්‍රවණ හා කථන කුසලතා ඵලදායි ලෙස යොදා ගනියි. | 1.3 සාහිත්‍ය නිර්මාණවලට සවන් දී රස විඳියි. | • දුකට කියන කවි සීපද (කවි පෙළ) - මහගම සේකර | • පද්‍ය පන්තියට සවන් දී අදහස පැහැදිලි කරයි.<br>• පද්‍ය නිර්මාණයේ කාව්‍යමය ලක්ෂණ අගය කරයි.<br>• පද්‍ය නිර්මාණයක ශබ්ද රසය හා අර්ථ රසයේ වැදගත්කම ප්‍රකාශ කරයි.<br>• පද්‍ය නිර්මාණය රසවිඳිමින් විචාරය කරයි. | 02 |
| | 1.4 සාවධාන ව සවන් දී තොරතුරු රැස් කරයි. | • කාලීන ගුවන්විදුලි/රූපවාහිනී වැඩසටහන් ඇසුරෙන් | • විද්‍යුත් මාධ්‍ය වැඩසටහන්වලට සාවධාන ව සවන් දී ප්‍රතිචාර දක්වයි.<br>• විද්‍යුත් මාධ්‍ය වැඩසටහන්වලට සාවධාන ව සවන් දීමේ වැදගත්කම විස්තර කරයි.<br>• විද්‍යුත් මාධ්‍ය වැඩ සටහන්වලට සවන් දී රැස් කර ගත් තොරතුරු ඉදිරිපත් කරයි. | 02 |
| | 1.5 දේශන සාකච්ඡා ආදියට විචාරශීලී ව සවන්දීමේ කුසලතාව ප්‍රදර්ශනය කරයි. | • විද්වත් දේශන/සාකච්ඡා | • දේශන /සාකච්ඡාවලට සවන් දී ප්‍රතිචාර දක්වයි.<br>• දේශනයේ/සාකච්ඡාවේ ඇතුළත් කරුණු උපුටා දක්වයි<br>.• දේශනයේ/සාකච්ඡාවේ ඇතුළත් කරුණු පිළිබඳ තම මතය ප්‍රකාශ කරයි. | 03 |
| | 1.6 නිරවුල් ව හා නිවැරදි ලෙස බස හසුරුවමින් හඬ පාලනයෙන් යුතු ව කතා කරයි. | • බුද්ධි මණ්ඩල සාකච්ඡා<br>• මාතෘකානුකූල කතා (ක්‍රියාකාරකම්) | • සබකෝලයෙන් තොර ව කතා කරයි.<br>• නිවැරදි ව හා පැහැදිලි ව කතා කිරීමේ හැකියාව ප්‍රදර්ශනය කරයි.<br>• උචිත පරිදි අංග චලන යොදා ගනිමින් කතා කරයි. | 03 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | | | • අන්‍යයන්ගේ අවධානය දිනා ගනිමින් කතා කරයි. | |
| | 1.7 බහුවිධ මාධ්‍ය යොදා ගනිමින් ඉදිරිපත් කිරීමේ කුසලතා ප්‍රදර්ශනය කරයි. | • භූමිකා රංගන<br>• පෝස්ටර්<br>• පිටු පෙරළන<br>• උහිස් ප්‍රක්ෂේපණ (OHP Presentations )<br>• බහු මාධ්‍ය ප්‍රක්ෂේපණ ( Multimedia Presentations )<br>ආදී විවිධ මාධ්‍ය අවස්ථානුකූල ව යොදා ගෙන සිදු කරන ඉදිරිපත් කිරීම්. | • ඉදිරිපත් කිරීම් සඳහා යොදා ගත හැකි විවිධ මාධ්‍ය හඳුනා ගෙන විස්තර කරයි.<br>• ඉදිරිපත් කිරීම් සඳහා බහුවිධ මාධ්‍ය යොදා ගැනීමේ වැදගත්කම ප්‍රකාශ කරයි.<br>• ඉදිරිපත් කිරීමේ දී බහුවිධ මාධ්‍ය නිවැරදි ව භාවිත කරයි.<br>• තාක්ෂණික මෙවලම් හැසිරවීමේ හුරුව ප්‍රදර්ශනය කරයි. | 03 |

## සිංහල භාෂාව හා සාහිත්‍යය 11 ශ්‍රේණිය - විෂය නිර්දේශය

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 2.0<br>ජීවන අත්දැකීම් පුළුල් කර ගැනීම සඳහා කියවීමේ පුරුදු අර්ථවත් ව යොදා ගනියි. | 2.2 විවිධ ශෛලියෙන් රචිත පොත පත කියවයි. | • ජාතක කතාවක්<br>- මහා කපි ජාතකය | • විවිධ ශෛලිවලට අනුව ලියන ලද පොත පත හඳුනා ගෙන ඉදිරිපත් කරයි.<br>• වින්දනාත්මක ව කියවීමේ අගය ප්‍රකාශ කරයි.<br>• තේමාව හා ශෛලිය අතර සම්බන්ධතාව හඳුනා ගෙන පැහැදිලි කරයි.<br>• ලේඛනයේ ශෛලිය හඳුනා ගෙන නිවැරදි ව කියවයි. | 04 |
| | 2.3 නිශ්ශබ්ද ව කියවා අවබෝධ-කරගත් කරුණු ඉදිරිපත් කරයි. | • චරිත කතා<br>- ශ්‍රීමත් අයිවර් ජෙනිංස් චරිතය ඇසුරින් | • අර්ථාවබෝධයෙන් යුතු ව පොත පත කියවයි.<br>• කියවා අවබෝධ කරගත් කරුණු ඉදිරිපත් කරයි.<br>• කියවීමෙන් ලත් දැනුම අවස්ථෝචිත ව භාවිත කරයි.<br>• කාලය අර්ථවත් ව ගත කිරීම සඳහා නිශ්ශබ්ද ව කියවීම යොදා ගනියි. | 02 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 3.0<br>සිංහල අක්ෂර මාලාව හඳුනා ගෙන ලේඛනයේ දී නිවැරදි ව භාවිත කරයි. | 3.1 සිංහල අක්ෂර මාලාව හඳුනා ගෙන විවිධ ප්‍රභේද යටතේ වර්ග කරයි. | • සිංහල අක්ෂර මාලාව හඳුනා ගෙන විවිධ ප්‍රභේද යටතේ වර්ග කිරීම. (ක්‍රියාකාරකම්) | • සිංහල අක්ෂරමාලාව හඳුනා ගෙන ඉදිරිපත් කරයි.<br>• උප්පත්ති ස්ථාන අනුව අකුරු වර්ග කරයි.<br>• අක්ෂර මාලාව ස්වර, ව්‍යඤ්ජන වශයෙන් බෙදා දක්වයි.<br>• හ්‍රස්ව, දීර්ඝ වශයෙන් ස්වර වෙන් කොට දක්වයි.<br>• අල්ප ප්‍රාණ, මහා ප්‍රාණ අක්ෂර හඳුනා ගෙන ඉදිරිපත් කරයි.<br>• වර්ගාක්ෂර නම් කරයි.<br>• සඤ්ඤක අකුරු හඳුනා ගෙන කියයි.<br>• අන්තඃස්ථාක්ෂර හඳුනා ගෙන නම් කරයි.<br>• ඌෂ්මාක්ෂර වෙන් කොට හඳුනා ගෙන කියයි.<br>• අනුස්වාරය හා විසර්ගය හඳුනා ගෙන කියයි.<br>• අක්ෂර මාලාව නිවැරදි රූපාකාරයෙන් ලියයි. | 02 |
| | 3.2 ප්‍රායෝගික භාෂා කාර්යය මැනවින් ඉටුකර ගැනීම සඳහා සිංහල අකරාදි පිළිවෙළ භාවිත කරයි. | • ශබ්දකෝෂ භාවිතය<br>• විශ්වකෝෂ භාවිතය<br>• අකාරාදි පිළිවෙළට වචන සකස් කිරීම. | • සිංහල අකාරාදි පිළිවෙළ මතකයෙන් ඉදිරිපත් කරයි.<br>• වචන ගොනු, නාම ලේඛන ආදිය ආකාරාදි පිළිවෙළට සකස් කරයි.<br>• ශබ්දකෝෂ විශ්වකෝෂ ආදි ග්‍රන්ථ පරිශීලනයේ දී අකාරාදිය පිළිබඳ දැනුම උපයෝගී කර ගනියි. | 02 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 3.3 නිවැරදි අක්ෂර වින්‍යාසයෙන් යුතු ව ලියයි. | • අක්ෂර වින්‍යාසය රීති හා භාවිතය<br>• ලේඛන නිවැරදි කිරීම.<br>• නිවැරදි අක්ෂර වින්‍යාසය<br>• අක්ෂර වින්‍යාසය වෙනස් වීම අර්ථ ව්‍යාකූලත්වයට හේතු වන බව. | • අක්ෂර වින්‍යාසය පිළිබඳ රීති අනුගමනය කරමින් ලියයි.<br>• අක්ෂර වින්‍යාසය වෙනස් වීමෙන් අර්ථය වෙනස් වන අයුරු පැහැදිලි කරයි.<br>• අක්ෂර වින්‍යාසය රීතිවලට අනුගත ව ලේඛන නිවැරදි කිරීමට යොමු වෙයි. | 02 |
| 4.0<br>ශිල්පීය දක්ෂතා ඉස්මතු කරමින් නිවැරදි ව ලේඛන කාර්යයේ යෙදෙයි. | 4.1 විරාම ලකුණු නිවැරදි ව භාවිත කරමින් ලියයි. | • විරාම ලකුණු භාවිතය (මෙතෙක් උගත් විරාම ලකුණු ඇසුරෙන් ක්‍රියාකාරකම්) | • විරාම ලක්ෂණ නිවැරදි ව හඳුනා ගෙන නම් කරයි.<br>• විරාම ලක්ෂණ නිවැරදි ව යෙදීමේ වැදගත්කම පැහැදිලි කරයි.<br>• විධිමත් ලේඛනයේ දී නිවැරදි ව විරාම ලකුණු භාවිත කරයි. | 01 |
| | 4.2 පද බෙදීමේ රීති අනුගමනය කරමින් ලියයි. | • සමාස පද එක් ව ලිවීම<br>• විශේෂණ පද වෙන් ව ලිවීම. | • පද බෙදීමේ රීති හඳුනා ගෙන විස්තර කරයි.<br>• සමාස තනි වචනයක් සේ ලියයි.<br>• විශේෂණ පද වෙන් ව ලියයි. | 01 |
| 5.0<br>භාෂාමය කාර්යයේ දී වාක්කෝෂය, භාෂා සම්ප්‍රදාය හා භාෂා ව්‍යවහාර පිළිබඳ දැනුම | 5.1 වාක්කෝෂීය දැනුම ප්‍රදර්ශනය කරයි. | • වාක්කෝෂය (ක්‍රියාකාරකම්) | • විවිධ ලිපි ලේඛන කියවා හඳුනා ගත් වචන ඉදිරිපත් කරයි.<br>• හඳුනාගත් වචනවල අර්ථ නිවැරදි ව ප්‍රකාශ කරයි.<br>• භාෂා භාවිතයේ දී එම වචන අර්ථවත් ව යොදයි. | 01 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 5.2 සාම්ප්‍රදායික යෙදුම් භාෂාමය කාර්යයේ දී උචිත පරිදි භාවිත කරයි. | • ප්‍රස්තාව පිරුළු<br>• රූඪී (ඉඟි වැකි)<br>• යුගල පද | • සාම්ප්‍රදායික යෙදුම් හඳුනා ගෙන ඉදිරිපත කරයි.<br>• සාම්ප්‍රදායික යෙදුම් භාවිතයෙන් අදහස් රසවත් ව ඉදිරිපත් කළ හැකි අයුරු විස්තර කරයි.<br>• අදහස් ප්‍රකාශනයේ දී සාම්ප්‍රදායික යෙදුම් භාවිත කරයි.<br>• සාම්ප්‍රදායික යෙදුම් එක් රැස් කිරීමට පෙලඹෙයි. | 02 |
| | 5.3 භාෂා ව්‍යවහාරයේ විවිධතා හඳුනා ගෙන භාෂාව භාවිත කරයි. | • ප්‍රාදේශීය හා පරිමිත භාෂා ව්‍යවහාර<br>• ප්‍රත්‍යයාර්ථ නාම | • උපභාෂා ව්‍යවහාර හඳුනා ගෙන නම් කරයි.<br>• විවිධ භාෂා ව්‍යවහාර පිළිබඳ ව අදහස් ප්‍රකාශ කරයි.<br>• ප්‍රාදේශීය හා පරිමිත භාෂා දැනුමෙන් සන්නිවේදනය පහසු කර ගනියි.<br>• ප්‍රාදේශීය භාෂා පිළිබඳ අවබෝධයෙන් යුතු ව කටයුතු කරයි. | 02 |



• ප්‍රත්‍යයාර්ථ නාම හඳුනා ගෙන නම් කරයි.

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 6.0<br>සම්මත භාෂා රීති අනුගමනය කරමින් ලේඛන කාර්යයේ යෙදෙයි. | 6.1 නාම පද සහ එහි ප්‍රභේද පිළිබඳ අවබෝධයෙන් යුතු ව ලේඛනයේ යෙදෙයි. | (තද්ධිත නාම හා කෘදන්ත නාම)<br>● සමාස<br>● විභක්ති | ● තද්ධිත පද සෑදෙන අයුරු විස්තර කරයි.<br>● කෘදන්ත පද සෑදෙන අයුරු විස්තර කරයි.<br>● තද්ධිත හා කෘදන්ත හඳුනා ගෙන ලේඛනයේ යෙදෙයි.<br>● සමාස නම් කරයි.<br>● විවිධ ක්‍රම යටතේ පද සමාස වන අයුරු විස්තර කරයි.<br>● පද සමාස කර දක්වයි.<br>● අවබෝධයෙන් යුතු ව සමාස භාවිත කරයි.<br>● විභක්ති අනුව නාම පද නිවැරදි ව යොදමින් ලේඛන කාර්යයේ යෙදෙයි. | 09 |
| | 6.2 ක්‍රියා පද සහ එහි ප්‍රභේද පිළිබඳ අවබෝධයෙන් යුතුව ලේඛන කාර්යයයේ යෙදෙයි. | ● ක්‍රියා පද සම්බන්ධ ක්‍රියාකාරකම් | ● ක්‍රියා පද හඳුනා ගෙන නම් කරයි.<br>● ක්‍රියා පදවල ප්‍රභේද ඇති බව පැහැදිලි කරයි.<br>● ක්‍රියා පද නිවැරදි ව භාවිත කර ලේඛන කාර්යයේ යෙදෙයි. | 02 |
| | 6.3 අව්‍යය පද නිවැරදි ව භාවිත කරයි. | ● අව්‍යය පද (ව්‍යවහාරයේ පවතින නිපාත හා උපසර්ග) | ● අව්‍යය පද යනු මොනවා ද නම් කරයි.<br>● නිපාත හා උපසර්ග හඳුනා ගෙන ඉදිරිපත් කරයි.<br>● ලේඛනයේ දී නිවැරදි අවබෝධයෙන් යුතු ව නිපාත භාවිත කරයි.<br>● උපසර්ග අර්ථවත් ව පදවල යොදයි. | 02 |
| | 6.4 පද සන්ධි කිරීමේ හැකියාව ප්‍රදර්ශනය කරයි. | ● ව්‍යවහාරයේ පවතින සන්ධි (ක්‍රියාකාරකම්) | ● විවිධ සන්ධි වර්ග හඳුනා ගෙන නම් කරයි.<br>● විවිධ ක්‍රම යටතේ පද සන්ධි වන අයුරු විස්තර කරයි.<br>● පද නිවැරදි ව සන්ධි කරයි. | 02 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 6.5 සම්මත රීතිවලට අනුගත ව වාක්‍ය ලියයි. | • කර්තෘ කාරක, කර්ම කාරක වාක්‍ය රීති<br>• විශේෂ වාක්‍ය රීති<br>• ශංසයාර්ථය<br>• ඇත, නැත යෝගය<br>• හා, සහ නිපාත යෝගය<br>• සමඟ කැටුව නිපාත යෝගය<br>• විකල්පාර්ථ නිපාත යෝගය<br>• සමානාර්ථ නිපාත යෝගය<br>• උපමාවාචී නිපාත යෝගය | • කාල භේදය පිළිබඳ ව සැලකිලිමත් වෙමින් ක්‍රියා පද නිවැරදි ව භාවිත කරයි.<br>• වාක්‍ය රීති පිළිබඳ දැනුම ප්‍රදර්ශනය කරයි.<br>• සම්මත රීති අනුගමනය කරමින් වාක්‍ය ලියයි.<br>• විවිධ රීතිවලට අයත් වාක්‍ය නිවැරදි ව ලිවීමේ හැකියාව ප්‍රදර්ශනය කරයි. | 05 |
| 7.0 භාෂාව නිරවුල් ව හා නිවැරදි ව භාවිත කරමින් ලේඛනයේ යෙදෙයි. | 7.1 තොරතුරු සන්නිවේදනය සඳහා ලිපි ලියයි. | • රාජකාරී ලිපි (ක්‍රියාකාරකම්) | • රාජකාරි ලිපි හා ව්‍යාපාරික ලිපි ලිවීමේ අවශ්‍යතාව පැහැදිලි කරයි.<br>• රාජකාරි හා ව්‍යාපාරික ලිපිවල ස්වරූපය හඳුනා ගෙන විස්තර කරයි.<br>• ශිල්පීය උපක්‍රම අනුගමනය කරමින් ලේඛනයේ යෙදෙයි.<br>• ආකෘතිය පිළිබඳ අවබෝධයෙන් යුක්ත ව ලිපි ලියයි. | 01 |
| | 7.2 ප්‍රායෝගික අවශ්‍යතා සඳහා ලේඛන සකස් කරයි. | • දැන්වීම්<br>• වෙළෙඳ දැන්වීම්<br>• පුවත්පත් වාර්තා<br>• ආකෘති පත්‍ර සකස් කිරීම හා සම්පූර්ණ කිරීම | • විවිධ ප්‍රායෝගික ලේඛන වර්ග හඳුනා ගෙන ප්‍රකාශ කරයි.<br>• ප්‍රායෝගික ලේඛන සඳහා උචිත ආකෘතිභාවිත කිරීමේ අවශ්‍යතාව පැහැදිලි කරයි.<br>• ප්‍රායෝගික ලේඛනයේ දී ශිල්පීය උපක්‍රම අනුගමනය කරයි.<br>• අවශ්‍යතා අනුව විවිධ ප්‍රායෝගික ලේඛන සකස් කරයි. | 04 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 8.0<br>භාෂාව නිරවුල් ව හා නිවැරදි ව භාවිත කරමින් නිර්මාණාත්මක ලේඛනයේ යෙදෙයි. | 8.1 කරුණු සංවිධානය කරගනිමින් මාතෘකානුකූල ව රචනා ලියයි. | • මාතෘකානුකූල රචනා ලිවීම | • රචනා මාතෘකාවට අදාළ ව කරුණු රැස් කරයි.<br>• රැස් කර ගත් කරුණු තර්කානුකූල ව පෙළගස්වයි.<br>• ශිල්පීය දක්ෂතා අනුගමනය කරමින් රචනා ලියයි.<br>• නිර්මාණාත්මක ව ලේඛනයේ යෙදෙයි. | 02 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 8.2 පාඨකයා ආකර්ෂණය වන පරිදි අදහස් ඉදිරිපත් කරමින් නිර්මාණාත්මක ව ලියයි. | • බිත්ති පුවත්පත්/පුවත්පත් ලිපි<br>• සඟරා ලිපි<br>• විශේෂාංග ලිපි (ක්‍රියාකාරකම්)<br>• කතු වැකි<br>• තීරු ලිපි | • නිර්මාණාත්මක ලේඛනයක ලක්ෂණ පැහැදිලි කරයි.<br>• නිර්මාණාත්මක ලේඛන කුසලතා ප්‍රදර්ශනය කරයි.<br>• කරුණු ගොනු කරමින් ලියයි<br>• උචිත භාෂා ශෛලියක් භාවිත කරයි.<br>• සෙසු අය ආකර්ෂණය කර ගත හැකි වන පරිදි ලියයි. | 02 |
| | 8.3 සංස්ලේෂණ හැකියා ප්‍රදර්ශනය කරමින් සාරාංශකරණයේ යෙදෙයි. | • ලේඛන සාරාංශකරණය<br>- මුල් ලේඛනයේ අදහස වචන තුනෙන් එකකට සාරාංශ කිරීම. | • ලිපි ලේඛනවලින් වැදගත් කරුණු වෙන් කොට දක්වයි.<br>• වැදගත් කරුණු අර්ථවත් ව ගළපා ඉදිරිපත් කරයි.<br>• මුල් ලේඛනයේ අදහස් ආරක්ෂා වන පරිදි සාරාංශ කර දක්වයි. | 02 |
| 9.0 සංස්කෘතිය හා සාරධර්ම හඳුනා ගනිමින් සහජීවනය හා ජාතිකාභිමානය ගොඩනගා ගැනීම සඳහා භාෂාව භාවිත කර ගනියි. | 9.1සංස්කෘතික උරුමය හා හරපද්ධති පිළිබඳ ව අවබෝධය ලබා ගැනීම සඳහා ලිපි ලේඛන පරිශීලනය කරයි. | • සංස්කෘතික උරුමය හා හර පද්ධති පිළිබඳ ලියැවුණු ලිපියක්<br>- දළදා පෙරහැර | • දළදා පෙරහැර හා බැඳුණු සිරිත් විරිත් හඳුනා ගෙන ඉදිරිපත් කරයි.<br>• දළදා පෙරහැර හා සම්බන්ධ සිරිත් විරිත් අගය කරයි.<br>• දළදා පෙරහැරේ සිරිත් විරිත් පවත්වා ගෙන යාමේ අවශ්‍යතාව පැහැදිලි කරයි.<br>• ජාතික උරුමයන්ගේ වටිනාකම පැහැදිලි කරමින් කතා කරයි. | 02 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 9.2 පොත පත පරිශීලනයෙන් සාරධර්ම වර්ධනය කර ගනියි. | • සුභාෂිතය (තෝරාගත් කවි 6 ක්) | • සාහිත්‍ය නිර්මාණවල ප්‍රකට වන යහ සිරිත් හඳුනා ගෙන ඉදිරිපත් කරයි.<br>• යහ සිරිත් අනුගමනය කිරීම අගය කරයි.<br>• පොතපතින් හඳුනා ගත් යහ සිරිත් අනුගමනය කරයි. | 03 |
| | 9.3 දේශිහිමානී හැඟීම් දනවන සාහිත්‍ය නිර්මාණ ඇසුරු කරයි. | • දේශාභිමානී ගීතයක් | • දේශාභිමානී ගීයට සවන් දී අදහස් ප්‍රකාශ කරයි.<br>• ගීතය ඇසුරෙන් දේශිහිමානී හැඟීම් දනවන භාෂාත්මක යෙදුම් හඳුනා ගනියි.<br>• හඳුනා ගත් භාෂාත්මක යෙදුම් භාවිත කරමින් අදහස් ප්‍රකාශ කරයි.<br>• දේශාභිමානී ගීය රස විඳියි. | 02 |
| | 9.4 විවිධ ජන කොටස්වලට අයත් සිරිත් විරිත් හඳුනා ගැනීම සඳහා ලිපි ලේඛන ඇසුරු කරයි. | • මුස්ලිම් සිරිත් විරිත් ගැන ලියැවුණු ලිපියක් | • මුස්ලිම් ජනතාවගේ සිරිත් විරිත් පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි.<br>• මුස්ලිම් ජනතාවගේ යහ සිරිත් අගය කරයි.<br>• සිරිත් විරිත් හඳුනා ගෙන සහජීවනයෙන් යුක්ත ව කටයුතු කරයි. | 02 |
| | 9.5 විවිධ ආගමික නායකයන්ගේ චරිත කතා පරිශීලනය කරයි. | • බලංගොඩ ආනන්ද මෛත්‍රේය හිමියන්ගේ චරිතය ඇසුරෙන් | • බලංගොඩ ආනන්ද මෛත්‍රේය චරිතාපදානය කියවයි.<br>• උන්වහන්සේගේ ජාතික ආගමික හා ශාස්ත්‍රීය සේවාව අගය කරයි.<br>• ආනන්ද මෛත්‍රේය හිමියන්ගේ චරිතයේ සුවිශේෂ ලක්ෂණ හඳුනා ගෙන ඉදිරිපත් කරයි. | 02 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 10.0 සාහිත්‍යික, දාර්ශනික, විද්‍යාත්මක හා තාක්ෂණික තොරතුරු ඇතුළත් නිර්මාණ පරිශීලනයෙන් ලබාගත් දැනුම විවිධ භාෂා කාර්යයන් සඳහා යොදා ගනියි | 10.1 සාහිත්‍යික හා දාර්ශනික තොරතුරු ඇතුළත් ලිපි ලේඛන ඇසුරු කරයි. | • විලියම් ශේක්ෂ්පියර්ගේ චරිතය ඇසුරින් සකස් කළ ලිපියක් | • විලියම් ශේක්ෂ්පියර්ගේ චරිත කතාව කියවයි.<br>• විලියම් ශේක්ෂ්පියර්ගේ දාර්ශනික චින්තනය පිළිබඳ අදහස් ප්‍රකාශ කරයි.<br>• විලියම් ශේක්ෂ්පියර්ගේ සේවය අගය කරයි.<br>• කියවීමෙන් ලත් දැනුම උචිත පරිදි භාවිත කරයි. | 02 |
| | 10.2 දැනුම ලබා ගැනීම සඳහා විද්‍යාත්මක හා තාක්ෂණික තොරතුරු ඇතුළත් පොතපත පරිශීලනය කරයි. | • භූ ගවේෂණය පිළිබඳ ව ලියැවුණ ලිපියක් | • පොතපත පරිශීලනයෙන් ලබා ගත් තොරතුරු ඉදිරිපත් කරයි.<br>• පාරිභාෂික වචනවල අර්ථ පැහැදිලි කිරීමට යොමුවෙයි.<br>• පාරිභාෂික වචන අර්ථවත් ව භාවිත කරයි.<br>• විද්‍යාත්මක හා තාක්ෂණික තොරතුරු ඇතුළත් වෙනත් පොතපත කියවීමට පෙලඹෙයි. | 02 |
| | 10.3 අද්‍යතන සාහිත්‍ය නිර්මාණවලින් ප්‍රකටවන සුවිශේෂතා හඳුනා ගෙන බස හසුරුවයි. | • අද්‍යතන සාහිත්‍ය නිර්මාණවල භාෂාවේ සුවිශේෂතා | • අද්‍යතන සාහිත්‍ය නිර්මාණ පරිශීලනය කර අදහස් ප්‍රකාශ කරයි.<br>• භාෂාවේ සුවිශේෂතා හඳුනා ගෙන ඉදිරිපත් කරයි.<br>• අර්ථාන්විත ව භාෂාව භාවිත කරයි. | 02 |

## සිංහල භාෂාව හා සාහිත්‍යය 11 ශ්‍රේණිය - විෂය නිර්දේශය

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 11.0 රසඥතා වර්ධනය සඳහා සාහිත්‍ය නිර්මාණ පරිශීලනය කරයි. | 11.1 සාහිත්‍ය නිර්මාණ පරිශීලනයෙන් හඳුනා ගත් මානව අත්දැකීම් ප්‍රකාශ කරයි. | • වතුර මල (කෙටිකතාව) - ඇරැව්වල නන්දිමිත්‍ර | • කෙටිකතාව කියවා අදහස් පළ කරයි.<br>• කෙටිකතා නිර්මාණයට පදනම් වූ මානව අත්දැකීම් විස්තර කරයි.<br>• සාහිත්‍ය නිර්මාණවලින් ප්‍රකට වන මානුෂික ගුණාංග හඳුනා ගෙන ඉදිරිපත් කරයි.<br>• සාහිත්‍ය නිර්මාණ අගය කරයි. | 02 |
| | 11.2 සාහිත්‍ය නිර්මාණ රසාස්වාදයේ යෙදෙයි. | • සාහිත්‍ය නිර්මාණ රසවින්දනය සඳහා මග පෙන්වීම | • සාහිත්‍ය නිර්මාණ කියවා අදහස් ප්‍රකාශ කරයි.<br>• ඒ ඒ සාහිත්‍ය නිර්මාණයට අදාළ වූ ලක්ෂණ හඳුනා ගෙන ඉදිරිපත් කරයි.<br>• සාහිත්‍ය නිර්මාණ සඳහා පාදක වූ අත්දැකීම් හඳුනා ගෙන ඉදිරිපත් කරයි.<br>• නිර්මාණවලින් ප්‍රකට වන සාහිත්‍යමය ලක්ෂණ අගය කරයි.<br>• විවිධ සාහිත්‍ය නිර්මාණ රසාස්වාදය කරයි. | 02 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 11.3 සාහිත්‍ය නිර්මාණ අධ්‍යයනය කර විචාර හැකියා ප්‍රදර්ශනය කරයි. | • සාහිත්‍ය නිර්මාණ විචාරය සඳහා මග පෙන්වීම. | • සාහිත්‍ය නිර්මාණ පරිශීලනය කරයි.<br>• සාහිත්‍ය නිර්මාණ පිළිබඳව තම අදහස් ඉදිරිපත් කරයි.<br>• විචාරය පිළිබඳ පොතපත කියවා ලබා ගත් දැනුම ප්‍රදර්ශනය කරයි.<br>• සාහිත්‍ය නිර්මාණ පිළිබඳ ව විචාරාත්මකව අදහස් පළ කරයි. | 02 |
| 12.0 අත්දැකීම් පාදක කර ගනිමින් නිර්මාණ කාර්‍යයේ යෙදෙයි. | 12.1 පද්‍ය නිර්මාණය කරයි. | • විමලරත්න කුමාරගම<br>• මහගම සේකර<br>• මොනිකා රුවන් පතිරණ<br>• දයාසේන ගුණසිංහ<br>යන කවීන්ගේ නිර්මාණ ඇසුරින් පද්‍ය නිර්මාණයට මග පෙන්වීම | • පද්‍ය නිර්මාණය සඳහා සුදුසු අත්දැකීම් තෝරා ගෙන ඉදිරිපත් කරයි.<br>• උචිත කාව්‍ය සම්ප්‍රදායක් තෝරා ගනියි.<br>• පද්‍ය නිර්මාණය සඳහා උචිත භාෂා ව්‍යවහාරය යොදා ගනියි.<br>• ඖචිත්‍යයෙන් යුතු ව කාව්‍ය උපක්‍රම භාවිත කරයි.<br>• පද්‍ය නිර්මාණයේ යෙදෙයි. | 02 |
| | 12.2 නිර්මාණාත්මක ප්‍රබන්ධ-කරණයේ යෙදෙයි. | • කෙටිකතා නිර්මාණය<br>-ඇරැව්වල නන්දිමිත්‍රගේ 'වතුර මල' කෙටිකතාව ඇසුරින් කෙටිකතා නිර්මාණයට මග පෙන්වීම හා උපදෙස් ලබා දීම | • කෙටිකතා නිර්මාණයට සුදුසු අත්දැකීම් තෝරා ගනියි.<br>• සාර්ථක කෙටිකතාවක තිබිය යුතු අංග පැහැදිලි කරයි.<br>• කෙටිකතාවේ තේමාවට උචිත ලෙස සිද්ධි හා චරිත ගොනු කරයි.<br>• කෙටිකතා නිර්මාණය කරයි. | 02 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 12.3 නාට්‍ය පිටපත් රචනයේ යෙදෙයි. | • නාට්‍ය පිටපත් රචනය<br>- ජයලත් මනෝරත්නගේ 'තල මල පිපිලා' නාට්‍යය ඇසුරෙන් නාට්‍ය පිටපත් රචනයට මග පෙන්වීම හා උපදෙස් ලබා දීම | • නාට්‍ය රචනය සඳහා උචිත කතා වස්තුවක් තෝරා ගනියි.<br>• නාට්‍යෝචිත අවස්ථා මතුකර ගනී.<br>• නාට්‍ය රසය කුළු ගැන්වෙන පරිදි සිද්ධි පෙළගස්වයි.<br>• උචිත දෙබස් භාවිත කරමින් නාට්‍ය පිටපත් රචනා කරයි. | 02 |

# ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස්

# 01. දළදා පෙරහැර

**නිපුණතාව :** 9.0 සංස්කෘතිය හා සාරධර්ම හඳුනා ගනිමින් සහජීවනය හා ජාතිකාභිමානය ගොඩනගා ගැනීම සඳහා භාෂාව භාවිත කරයි.

**නිපුණතා මට්ටම :** 9.1 සංස්කෘතික උරුමය හා හර පද්ධති පිළිබඳ ව අවබෝධය ලබා ගැනීම සඳහා ලිපි ලේඛන පරිශීලනය කරයි.

**කාලච්ඡේද :** 02 යි.

**ඉගෙනුම් පල :**

- දළදා පෙරහැර හා බැඳුණු සිරිත් - විරිත් හඳුනා ගෙන ඉදිරිපත් කරයි.
- දළදා පෙරහැර හා සම්බන්ධ සිරිත් - විරිත් අගය කරයි.
- දළදා පෙරහැරේ සිරිත් - විරිත් පවත්වා ගෙන යෑමේ අවශ්‍යතාව පැහැදිලි කරයි.
- ජාතික උරුමයන්ගේ වටිනාකම පැහැදිලි කරමින් කතා කරයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස් :**

- දළදා පෙරහැර පිළිබඳ ඡායාරූප, චිත්‍ර හෝ දෘශ්‍ය පටයක් නැරඹීමට ශිෂ්‍යයන්ට අවස්ථාව ලබා දෙන්න.
- පෙළ පොතේ පාඩම කියවීමට ශිෂ්‍යයන් යොමු කරන්න.
- ඒ ඇසුරින් දළදා පෙරහැර සම්බන්ධ ව පහත සඳහන් කරුණු සාකච්ඡා කරන්න.
    - පෙරහැරේ ආරම්භය හා විකාශනය
    - පෙරහැරේ අංග
    - සිරිත් විරිත් හා සම්ප්‍රදාය
    - සංස්කෘතික වටිනාකම
    - ශ්‍රී ලාංකික අනන්‍යතාව
- පෙළ පොතේ සඳහන් අභ්‍යාසවල ශිෂ්‍යයන් නිරත කරවන්න.

**මූලික වදන්/සංකල්ප :**

- තේවාව - නියමිත දින නියමිත වේලාවේ පවත්වන පූජාව
- කප් සිටුවීම - කණුවක් සිටුවා විධිමත් පූජා පවත්වා සිදු කරන චාරිත්‍රයක්
- රන් දෝලි - 'රනින් කළ' දෝලාව, දේවාභරණ ගෙන යන දෝලාව
- කුඹල් පෙරහැර - රන්දෝලි පෙරහැර
- දිය කැපීම - පෙරහැරේ අවසන් අවස්ථාව, ජලය කැපීම
- නානුමුර මංගල්‍යය - දේව ප්‍රතිමා, දේවාභරණ නාවන උත්සවය

**ගුණාත්මක යෙදවුම් :**

- දළදා පෙරහැරේ ඡායාරූප, චිත්‍ර හෝ වීඩියෝ දර්ශන
- දළදා පෙරහැර පිළිබඳ ලියැවුණු ලිපි

**ඇගයීම හා තක්සේරුකරණය :**

- දළදා පෙරහැර පිළිබඳ තොරතුරු විස්තර කරයි.
- සංස්කෘතික උරුමයක් ලෙස දළදා පෙරහැර අගය කරයි.
- ජාතික හා ආගමික සහජීවනය සඳහා දළදා පෙරහැරේ දායකත්වය පැහැදිලි කරයි.
- දළදා පෙරහැර පිළිබඳ ලිපි ලේඛන පරිශීලනය කරයි.

# 02. වචන වෙන් කොට ලිවීම (පද බෙදීම)

**නිපුණතාව :** 4.0 ශිල්පීය දක්ෂතා ඉස්මතු කරමින් නිවැරදි ව ලේඛන කාර්යයේ යෙදෙයි.

**නිපුණතා මට්ටම :** 4.2 පද බෙදීමේ රීති අනුගමනය කරමින් ලියයි.

**කාලච්ඡේද ගණන :** 01 යි.

**ඉගෙනුම් පල :**

- පද බෙදීමේ රීති හඳුනා ගෙන විස්තර කරයි.
- සමාස එක් වචනයක් ලෙස ලියයි.
- විශේෂණ පද වෙන් ව ලියයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස් :**

- වචන බෙදා ලිවීමේ වැදගත්කම ශිෂ්‍යයන් සමග සාකච්ඡා කරන්න.
- වචන බෙදා ලිවීම පිළිබඳ ශිෂ්‍යයන් මේ වන විට ඉගෙන ගෙන ඇති පහත සඳහන් රීති නැවත සිහිපත් කරන්න.
  - නාම, ක්‍රියා සහ නිපාත වෙන් ව ලිවීම
  - පදයක මුලට යෙදෙන උපසර්ග මෙන් ම අගට යෙදෙන ප්‍රත්‍ය එක් ව ලිවීම
  - සංඛ්‍යා ශබ්ද ලිවීමේ දී වර්ග දක්වන පද සමාස කොට එකිනෙක වෙන් ව ලිවීම
  - ඉලක්කමෙන් සංඛ්‍යා දැක්වීමේ දී; *ක්, ක, කින්, න්* සහ *හි* අදාළ ඉලක්කම හා වෙන් නො කොට ලිවීම
  - සම්බන්ධාර්ථවාචී යි, ත්, එක් ව ලිවීම
  - වචනයකට පෙරටුව යෙදෙන *නො* වෙන් කොට ලිවීම
  - උපකාරක ක්‍රියා පද වෙන් කිරීම
  - 'දී' නිපාතය වෙන් කිරීම
- 11 ශ්‍රේණියට නියමිත පද බෙදීම පිළිබඳ රීතිය උදාහරණ සහිත ව පැහැදිලි කරන්න.
  - සමාස පද එක් ව ලිවීම
    උදා : රත්මල්, තුනපහ
  - විශේෂණ පද වෙන් ව ලිවීම
    උදා : රතු මල, නිල් අහස
- නිවැරදි ව පද බෙදා ලිවීම සඳහා 'දළදා පෙරහැර' පාඩමෙන් උපුටා ගත් කුඩා ඡේදයක් කියවන විට ලිවීමේ අභ්‍යාසයක් ලබා දෙන්න.

**ගුණාත්මක යෙදවුම් :**

**ගුරුභවතාගේ පරිශීලනය සඳහා-**

- සිංහල ලේඛන රීතිය - ජාතික අධ්‍යාපන ආයතනය

**ඇගයීම හා තක්සේරුකරණය :**

- පද බෙදීමේ රීති විස්තර කරයි.
- පද බෙදීමේ රීතිවල වැදගත්කම අවධාරණය කරයි.
- රීතිවලට අනුව පද බෙදා ලියයි.
- පද බෙදීමේ රීති අනුගමනය කරමින් ලේඛන නිවැරදි කරයි.

## 03. දුකට කියන කවි සීපද

**නිපුණතාව :** 1.0 සන්නිවේදනය සාර්ථක කර ගැනීම සඳහා ශ්‍රවණ හා කථන කුසලතා ඵලදායි ලෙස යොදා ගනියි.

**නිපුණතා මට්ටම :** 1.3 සාහිත්‍ය නිර්මාණවලට සවන් දී රස විඳියි.

**කාලච්ඡේද ගණන :** 02 යි.

**ඉගෙනුම් පල :**

- පද්‍ය පන්තියට සවන් දී අදහස පැහැදිලි කරයි.
- පද්‍ය පන්තියෙහි කාව්‍යමය ලක්‍ෂණ අගය කරයි.
- පද්‍ය නිර්මාණයක ශබ්ද රසයේ හා අර්ථ රසයේ වැදගත්කම ප්‍රකාශ කරයි.
- පද්‍ය නිර්මාණය රස විඳිමින් විචාරය කරයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස් :**

- මහගම සේකරයන්ගේ 'දුකට කියන කවි සීපද' (පිළේ පැදුර) පද්‍ය නිර්මාණය සුදුසු ක්‍රමවේදයක් මගින් ශිෂ්‍යයන්ට සවන් දීමට හා ගායනය කිරීමට අවස්ථාව සලස්වන්න.
- සවන් දීමේ දී හා ගායනයේ දී ශිෂ්‍යයන් තුළ ඇති වූ හැඟීම් පිළිබඳ සාකච්ඡා කරන්න.
- කවි පෙළෙහි අන්තර්ගත පහත සඳහන් ලක්ෂණ කෙරෙහි ශිෂ්‍යයන්ගේ අවධානය යොමු කර ඒවා කවි පෙළ රසවත් වීමට හේතු වූ ආකාරය සාකච්ඡා කරන්න.

  **ශබ්ද රසය -**
  - තාලය
  - රිද්මය
  - එළිසමය
  - අනුප්‍රාසය
  - ගීතවත් බව

  **අර්ථ රසය -**
  - උපමා
  - රූපක
  - ගැමි වදන්
  - සරල බව
  - ජනකවි ලක්‍ෂණ
- කවි පෙළ රස විඳීම සඳහා ශිෂ්‍යයන් යොමු කරන්න.

**මූලික වදන් / සංකල්ප :**

ශබ්ද රසය - ශබ්දය අනුව ඇති වන ප්‍රියජනක හැඟුම නිසා දැනෙන ආස්වාදය. තාලය, රිද්මය, එළිසමය, වචන, අකුරු යන අංග ශබ්ද රසයට හේතු වේ. කනට විෂය වේ.

අර්ථ රසය - කවියෙහි අර්ථය අවබෝධ වූ විට රසවත් බවක් ජනිත වේ. එය අර්ථ රසයයි. කාව්‍යෝක්ති, අලංකාර, නව නළු රස අර්ථ රසය තීව්‍ර කරයි. මනසට විෂය වේ.

**ගුණාත්මක යෙදවුම් :**

- කවි පෙළ ඇතුළත් ශ්‍රව්‍ය පටයක් හෝ සජීවී ගායනයක්

**ගුරුභවතාගේ ප්‍රයෝජනය සඳහා**

- සාහිත්‍ය විද්‍යාව - එදිරිවීර සරච්චන්ද්‍ර
- කල්පනා ලෝකය - එදිරිවීර සරච්චන්ද්‍ර
- විචාර විලාශය - ඒ. වී. සුරවීර

**ඇගයීම හා තක්සේරුකරණය :**

- පද්‍ය පන්තියට සවන් දී එහි මූලික අදහස පැහැදිලි කරයි.
- ශබ්ද රසය හා අර්ථ රසය යනු කුමක් දැයි පැහැදිලි කරයි.
- පැදි පෙළෙහි ශබ්ද රසය හා අර්ථ රසය මතු වන තැන් විස්තර කරයි.
- පැදි පෙළෙහි කාව්‍යමය ලක්ෂණ අගය කරයි.

## 04. අක්ෂර මාලාව

**නිපුණතාව :** 3.0 සිංහල අක්ෂර මාලාව හඳුනා ගෙන ලේඛනයේ දී නිවැරදි ව භාවිත කරයි.

**නිපුණතා මට්ටම :** 3.1 සිංහල අක්ෂර මාලාව හඳුනා ගෙන විවිධ ප්‍රභේද යටතේ වර්ග කරයි.

**කාලච්ඡේද ගණන :** 02 යි.

**ඉගෙනුම් පල :**

- සිංහල අක්ෂර මාලාව හඳුනා ගෙන ඉදිරිපත් කරයි.
- උත්පත්ති ස්ථාන අනුව අකුරු වර්ග කරයි.
- අක්ෂර මාලාව ස්වර, ව්‍යඤ්ජන වශයෙන් බෙදා දක්වයි.
- හ්‍රස්ව දීර්ඝ වශයෙන් ස්වර වෙන් කොට දක්වයි.
- අල්ප ප්‍රාණ, මහා ප්‍රාණ අක්ෂර හඳුනා ගෙන ඉදිරිපත් කරයි.
- වර්ගාක්ෂර නම් කරයි.
- සඤ්ඤක අකුරු හඳුනා ගෙන කියයි.
- අන්තඃස්ථාක්ෂර හඳුනා ගෙන නම් කරයි.
- ඌෂ්මාක්ෂර වෙන් කොට හඳුනා ගෙන කියයි.
- අනුස්වාරය හා විසර්ගය හඳුනා ගෙන කියයි.
- අක්ෂර මාලාව නිවැරදි රූපාකාරයෙන් ලියයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස් :**

- සිංහල අක්ෂර මාලාව (සිංහල ලේඛන රීතිය කෘතියෙහි සඳහන්) පන්තියේ ප්‍රදර්ශනය කරන්න.
- අක්ෂර මාලාවේ වර්ගීකරණ පිළිබඳ පසුගිය ශ්‍රේණිවල දී උගත් කරුණු ඇසුරෙන් ශිෂ්‍යයන්ගේ දැනුම අවදි කරන්න.
- ඒ සඳහා ඇමුණුමේ සඳහන් ප්‍රශ්න එක් එක් ශිෂ්‍යයාගෙන් විමසන්න.
- දැනුම තහවුරු කිරීම සඳහා අවශ්‍ය අවස්ථාවල දී කරුණු පැහැදිලි කරන්න.
- පන්තියේ ශිෂ්‍යයන් කණ්ඩායම් දෙකකට බෙදා අකෂර මාලාව ඇසුරින් ප්‍රශ්න විචාරාත්මක වැඩසටහනක් සංවිධානය කරන්න.

**ගුණාත්මක යෙදවුම් :**

- සිංහල අක්ෂර මාලාව සඳහන් පුවරුවක්
- ඇමුණුමේ සඳහන් ප්‍රශ්නාවලිය

**ගුරුභවතාගේ පරිශීලනය සඳහා-**

- සිංහල ලේඛන රීතිය - ජාතික අධ්‍යාපන ආයතනය

**ඇගයීම හා තක්සේරුකරණය :**

- අක්ෂර මාලාව මතකයෙන් ඉදිරිපත් කරයි.
- සම්මත වර්ගීකරණවලට අනුව අක්ෂර මාලාව බෙදා දක්වයි.
- අක්ෂර මාලාව පිළිබඳ දැනුම නිවැරදි ව භාවිත කරයි.
- සිංහල අක්ෂර මාලාව පිළිබඳ දැනුවත්භාවය වර්ධනය කර ගනියි.

ඇමුණුම 1

**සිංහල අක්ෂර මාලාව පිළිබඳ ප්‍රශ්න**

01. සිංහල අක්ෂර මාලාවේ අක්ෂර ගණන කොපමණ ද?
02. ස්වර අකුරු කීය ද?
03. ව්‍යඤ්ජන අකුරු කීය ද?
04. හ්‍රස්ව ස්වර අකුරු කීය ද?
05. දීර්ඝ ස්වර අකුරු කීය ද?
06. මහා ප්‍රාණ අකුරු දෙකක් නම් කරන්න.
07. සඤ්ඤක අකුරු දෙකක් නම් කරන්න.
08. ඌෂ්මාක්ෂර අකුරු දෙකක් නම් කරන්න.
09. අන්තඃස්ථාක්ෂර දෙකක් නම් කරන්න.
10. නාසික්‍ය අකුරු දෙකක් නම් කරන්න.
11. අනුස්වාරය යනු කුමක් ද?
12. විසර්ගය යනු කුමක් ද?
13. උගුරෙන් උපදින අකුරුවලට ව්‍යවහාර වන නම කුමක් ද?
14. තල්ලෙන් උපදින අකුරුවලට ව්‍යවහාර වන නම කුමක් ද?
15. මුදුනෙන් උපදින අකුරුවලට ව්‍යවහාර වන නම කුමක් ද?
16. දත්වලින් උපදින අකුරුවලට ව්‍යවහාර වන නම කුමක් ද?
17. තොල්වලින් උපදින අකුරුවලට ව්‍යවහාර වන නම කුමක් ද?
18. අන්තඃස්ථාක්ෂර හඳුන්වන තවත් නමක් කියන්න.
19. සිංහල අක්ෂර මාලාවේ මහා ප්‍රාණ අකුරු කීය ද?
20. පාපිල්ල යෙදීමේ දී හැඩය වෙනස් වන්නේ කුමන අක්ෂරයේ ද?
21. ස්වර අකුරු නම් කරන්න.
22. ව්‍යඤ්ජන අකුරු නම් කරන්න.
23. හ්‍රස්ව ස්වර නම් කරන්න.
24. දීර්ඝ ස්වර නම් කරන්න.
25. වර්ගාක්ෂර නම් කරන්න.
26. සඤ්ඤක අක්ෂර නම් කරන්න.
27. නාසික්‍ය අක්ෂර නම් කරන්න.
29. අල්ප ප්‍රාණ අක්ෂර නම් කරන්න.
30. අන්තඃස්ථාක්ෂර නම් කරන්න.
31. ඌෂ්මාක්ෂර නම් කරන්න.
32. විසර්ගය හා අනුස්වාරය නම් කරන්න.
33. කණ්ඨජ අක්ෂර නම් කරන්න.
34. තාලුජ අක්ෂර නම් කරන්න.
35. මූර්ධජ අක්ෂර නම් කරන්න.
36. දන්තජ අක්ෂර නම් කරන්න.
37. ඕෂ්ඨජ අක්ෂර නම් කරන්න.
38. අක්ෂර මාලාවේ සඳහන් එහෙත් දැනට භාවිත නො වන අකුරු දෙකක් නම් කරන්න.
39. සිංහල අක්ෂර මාලාවේ ඝෝෂාක්ෂර නම් කරන්න.
40. ස්වර අකුරු හඳුන්වන තවත් නමක් කියන්න.

## 05. අක්ෂර වින්‍යාසය

**නිපුණතාව :** 3.0 සිංහල අක්ෂර මාලාව හඳුනා ගෙන ලේඛනයේ දී නිවැරදි ව භාවිත කරයි.

**නිපුණතා මට්ටම :** 3.3 නිවැරදි අක්ෂර වින්‍යාසයෙන් යුතු ව ලියයි.

**කාලච්ඡේද ගණන :** 02 යි.

**ඉගෙනුම් පල :**

- අක්ෂර වින්‍යාසය පිළිබඳ රීති අනුගමනය කරමින් ලියයි.
- අක්ෂර වින්‍යාසය වෙනස් වීමෙන් අර්ථය වෙනස් වන අයුරු පැහැදිලි කරයි.
- අක්ෂර වින්‍යාස රීතිවලට අනුගත ව ලේඛන නිවැරදි කිරීමට යොමු වෙයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස් :**

- පහත සඳහන් අක්ෂර වින්‍යාස රීති පිළිබඳ ශිෂ්‍යයන්ගේ පෙර දැනුම විමසන්න.
  - ණ, න, ළ, ල, භේදය
  - ශ, ෂ, ස, භේදය
  - අල් ප්‍රාණ - මහා ප්‍රාණ භේදය
  - සඤ්ඤක අකුරු භාවිතය
- ඇමුණුම 1හි සඳහන් වචනවලට සවන් දී ඒවා නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත ව ලිවීමට ශිෂ්‍යයන් යොමු කරන්න.
- ඒ ඇසුරෙන් අක්ෂර වින්‍යාස රීති පිළිබඳ දැනුම තහවුරු කරන්න.
- වැරදි අක්ෂර වින්‍යාසය සහිත ඡේදයක් ලබා දී එය නිවැරදි කිරීමට ශිෂ්‍යයන් යොමු කරන්න.

**ගුණාත්මක යෙදවුම් :**

- සිංහල ලේඛන රීතිය - ජාතික අධ්‍යාපන ආයතනය

**ගුරුභවතාගේ පරිශීලනය සඳහා-**

- සමකාලීන සිංහලය - ජේ. බී. දිසානායක

**ඇගයීම හා තක්සේරුකරණය :**

- සිංහල අක්ෂර වින්‍යාසය පිළිබඳ රීති හඳුනා ගෙන ප්‍රකාශ කරයි.
- නිවැරදි අක්ෂර වින්‍යාසයෙන් යුතු ව ලියයි.
- අක්ෂර වින්‍යාස රීති පිළිබඳ දැනුවත් භාවයෙන් ලේඛන නිවැරදි කරයි.

ඇමුණුම 1

වචන මාලාව

| | | | |
|---|---|---|---|
| 01. | පුස්තකාලය | 21. | පොදු දේපළ |
| 02. | මද්‍යසාර | 22. | ලේකම්වරයා |
| 03. | සෞන්දර්යය | 23. | පරිගණකය |
| 04. | සමස්ත ලංකා | 24. | ස්වාභාවික |
| 05. | කථිකාචාර්ය | 25. | සියලු |
| 06. | දූරකථනය | 26. | අග්ගළා |
| 07. | ආභාසය | 27. | යගුළිය |
| 08. | කැලණිය | 28. | සෙබළා |
| 09. | ළමා කැල | 29. | කොට්ඨාසය |
| 10. | කාර්යාලය | 30. | පාරිභෝජනය |
| 11. | කාලය | 31. | විදුලි බුබුළ |
| 12. | ජනගහනය | 32. | කතිකාවත |
| 13. | ඖෂධ | 33. | කෲරත්වය |
| 14. | පැළෑටි වර්ග | 34. | කනගාටුව |
| 15. | සෞඛ්‍යය | 35. | ක්‍රීඩාංගණය |
| 16. | අර්බුද | 36. | ප්‍රස්තාව පිරුළු |
| 17. | සුළැඟිල්ල | 37. | සම්භාෂණය |
| 18. | ලකුණු | 38. | විශ්වාසවන්ත |
| 19. | මාණවිකාව | 39. | ලේඛන |
| 20. | මලල ක්‍රීඩාව | 40. | ප්‍රවීණතාව |

## 06. ශබ්දකෝෂ හා විශ්වකෝෂ භාවිතය (ආකාරාදි පිළිවෙළ)

**නිපුණතාව :** 3.0 සිංහල අක්ෂර මාලාව හඳුනා ගෙන ලේඛනයේ දී නිවැරදි ව භාවිත කරයි.

**නිපුණතා මට්ටම :** 3.2 ප්‍රායෝගික භාෂා කාර්යය මැනවින් ඉටුකර ගැනීම සඳහා සිංහල අකාරාදි පිළිවෙළ භාවිත කරයි.

**කාලච්ඡේද ගණන :** 02 යි

**ඉගෙනුම් පල :**

- සිංහල අකාරාදි පිළිවෙළ මතකයෙන් ඉදිරිපත් කරයි.
- වචන ගොනු, නාම ලේඛන ආදිය අකාරාදි පිළිවෙළට සකස් කරයි.
- ශබ්දකෝෂ විශ්වකෝෂ ආදි ග්‍රන්ථ පරිශීලනයේ දී අකාරාදිය පිළිබඳ දැනුම උපයෝගි කර ගනියි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස් :**

- 'අ' අක්ෂරයේ සිට 'ෆ' අක්ෂරය දක්වා හෝඩියේ අක්ෂර පිළිවෙළට වචන පෙළ ගැස්වීම අකාරාදි පිළිවෙළින් සැකසීම යන්නෙන් අදහස් වන බව පෙන්වා දෙන්න.
- වචන ගොනුවක් ගෙන එය අකාරාදි පිළිවෙළට සකස් කරමින් ආදර්ශනයක යෙදෙන්න.
- වචන ගොනු ලබා දී අකාරාදි පිළිවෙළට සකස් කිරීමේ අභ්‍යාසවල ශිෂ්‍යයන් නිරත කරවන්න.
  (පෙළපොතේ සඳහන් අභ්‍යාස ද මේ සඳහා යොදා ගන්න.)
- ශබ්දකෝෂයක් හෝ විශ්වකෝෂයක් ගෙන එය භාවිත කරන ආකාරය පැහැදිලි කරන්න. ශබ්දකෝෂ හා විශ්වකෝෂ පරිහරණයේ වටිනාකම පැහැදිලි කරන්න.
- ශබ්දකෝෂ හා විශ්වකෝෂ ද අකාරාදි පිළිවෙළට අනුව සකස් කර ඇති බව පැහැදිලි කරන්න.

**ගුණාත්මක යෙදවුම් :**

- ශ්‍රී සුමංගල ශබ්දකෝෂය - වැලිවිටියේ සෝරත හිමි
- මහා සිංහල ශබ්දකෝෂය - හරිශ්චන්ද්‍ර විජයතුංග
- නූතන සිංහල පාරිභාෂික ශබ්දකෝෂය - හරිශ්චන්ද්‍ර විජයතුංග
- සිංහල ශබ්දකෝෂය - සංස්කෘතික දෙපාර්තමේන්තුව

**ඇගයීම හා තක්සේරුකරණය :**

- අකාරාදි පිළිවෙළ යනු කුමක් ද යි පැහැදිලි කරයි.
- වචන මාලා අකාරාදි පිළිවෙළට සකස් කරයි.
- ශබ්දකෝෂ හා විශ්වකෝෂ පරිහරණයේ දී අකාරාදි පිළිවෙළ අනුගමනය කරයි.

## 07. වාක්කෝෂය පිළිබඳ පරිචය

**නිපුණතාව :** 5.0 භාෂාමය කාර්යයේ දී වාක්කෝෂය, භාෂා සම්ප්‍රදාය හා භාෂා ව්‍යවහාර පිළිබඳ දැනුම ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම :** 5.1 වාක්කෝෂීය දැනුම ප්‍රදර්ශනය කරයි.

**කාලච්ඡේද ගණන :** 01 යි.

**ඉගෙනුම් පල :**

- විවිධ ලිපි ලේඛන කියවා හඳුනා ගත් වචන ඉදිරිපත් කරයි.
- හඳුනා ගත් වචනවල අර්ථ නිවැරදි ව ප්‍රකාශ කරයි.
- භාෂා භාවිතයේ දී එම වචන අර්ථවත් ව යොදයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස් :**

- පෙළපොතේ පාඩමක් තෝරා ගෙන, එම පාඩමේ සඳහන් දුරවබෝධ වචනවල අරුත් දැන ගැනීම සඳහා ශබ්දකෝෂ භාවිතයට අවස්ථාව ලබා දෙන්න.
- ගුණාත්මක යෙදවුම්වල සඳහන් කර ඇති ශබ්දකෝෂයක් මේ සඳහා යොදා ගන්න.
- වචනයක ඇති විවිධ අර්ථ හඳුනා ගෙන ඒවා වාක්‍යවල යෙදීමේ අභ්‍යාසවල ශිෂ්‍යයන් යොදවන්න.

**ගුණාත්මක යෙදවුම් :**

- ශ්‍රී සුමංගල ශබ්දකෝෂය - වැලිවිටියේ සෝරත හිමි
- මහා සිංහල ශබ්දකෝෂය - හරිශ්චන්ද්‍ර විජයතුංග
- සිංහල ශබ්දකෝෂය - සංස්කෘතික දෙපාර්තමේන්තුව

**ඇගයීම හා තක්සේරුකරණය :**

- ශබ්දකෝෂ පරිහරණය කර වචනවල විවිධාර්ථ පැහැදිලි කරයි.
- වචනයක විවිධාර්ථ නැගෙන පරිදි වාක්‍ය නිර්මාණය කරයි.
- විවිධ ලිපි ලේඛන පරිශීලනයෙන් වාක්කෝෂය වර්ධනය කර ගනියි.

## 08. රසින් රස මවන බස් මහිමය (මහා කපි ජාතකය)

**නිපුණතාව :** 2.0 ජීවන අත්දැකීම් පුළුල් කර ගැනීම සඳහා කියවීමේ පුරුදු අර්ථවත් ව යොදා ගනියි.

**නිපුණතා මට්ටම :** 2.2 විවිධ ශෛලියෙන් රචිත පොත පත කියවයි.

**කාලච්ඡේද ගණන :** 03 යි.

**ඉගෙනුම් පල :**

- විවිධ ශෛලිවලට අනුව ලියන ලද පොතපත හඳුනා ගෙන ඉදිරිපත් කරයි.
- වින්දනාත්මක ව කියවීමේ අගය ප්‍රකාශ කරයි.
- තේමාව හා ශෛලිය අතර සම්බන්ධතාව හඳුනා ගෙන පැහැදිලි කරයි.
- ලේඛනයේ ශෛලිය හඳුනා ගෙන නිවැරදි ව කියවයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස් :**

- ගුණාත්මක යෙදවුම්වල සඳහන් විවිධ ශෛලියෙන් ලියූ කොටස් සුදුසු ක්‍රමවේදයක් මගින් සවන් දීමට ශිෂ්‍යයන් යොමු කරන්න.
- පැරණි පොත පතෙහි මෙන් ම, වර්තමාන පොත පතෙහි ද විවිධ ශෛලි ඇති බව පැහැදිලි කරන්න.
- කියවීමේ දී ඒවායේ විවිධතා පවතින බව සාකච්ඡා කරන්න.
- ලේඛනයේ ශෛලිය හඳුනා ගෙන නිවැරදි ව කියවන ආකාරය නිදර්ශනාත්මක ව පැහැදිලි කරන්න.
- තේමාවට අනුව ශෛලිය තෝරා ගැනීමේ වැදගත්කම පැහැදිලි කර දෙන්න.
- පෙළ පොතෙහි ඇතුළත් 'මහා කපි ජාතකය' පාඩම නිශ්ශබ්ද ව කියවීමට යොමු කර පසුව අහඹු ලෙස ශබ්ද නඟා කියවීමට අවස්ථාව ලබා දෙන්න.
- උචිත ශෛලිය අනුගමනය කිරීමට උපදෙස් දෙන්න.
- ජාතක කතාවේ අර්ථය පැහැදිලි කර ගැනීමට මග පෙන්වන්න.
- ජාතක කතාව රසවින්දනයට යොමු කරන්න.

**මූලික/ වදන් සංකල්ප :**

- ශෛලිය - ප්‍රකාශන විලාසය, වාග්මාලාව, වාගාලංකාර මෙයට අයත් ය.
- තේමාව - ප්‍රධාන අදහස

**ගුණාත්මක යෙදවුම් :**

- මනමේ නාට්‍යයෙන් කොටසක්
- සද්ධර්ම රත්නාවලියෙන් කොටසක්
- ජාතක කතාවක කොටසක්

**ඇගයීම හා තක්සේරුකරණය :**

- විවිධ ශෛලියෙන් රචිත පොත පත කියවීමට යොමුවෙයි.
- තේමාව හා ශෛලිය අතර සබඳතාව පැහැදිලි කරයි.
- විවිධ ශෛලිවලින් කියවා රස විඳීමට හැකි බව ප්‍රකාශ කරයි.
- විවිධ ශෛලී අගය කරමින් කතා කරයි.

## 09. වාක්‍ය රීති

**නිපුණතාව :** 6.0 සම්මත භාෂා රීති අනුගමනය කරමින් ලේඛන කාර්යයේ යෙදෙයි.

**නිපුණතා මට්ටම :** 6.5 සම්මත රීතිවලට අනුගත ව වාක්‍ය ලියයි.

**කාලච්ඡේද ගණන :** 05 යි.

**ඉගෙනුම් පල :**

- කාල භේදය පිළිබඳ ව සැලකිලිමත් වෙමින් ක්‍රියා පද නිවැරදි ව භාවිත කරයි.
- වාක්‍ය රීති පිළිබඳ දැනුම ප්‍රදර්ශනය කරයි.
- සම්මත රීති අනුගමනය කරමින් වාක්‍ය ලියයි.
- විවිධ රීතිවලට අයත් වාක්‍ය නිවැරදි ව ලිවීමේ හැකියාව ප්‍රදර්ශනය කරයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස් :**

- පුවත්පත් ලිපියක හෝ පෙළ පොතේ පාඩමක ඡේදයක් තෝරා ගෙන එහි ඇති වාක්‍යවලට අදාළ රීති හඳුනා ගැනීමට සලස්වමින් වාක්‍ය රීති පිළිබඳ ශිෂ්‍යයන්ගේ මතකය අවදි කරන්න.
- වාක්‍ය ලිවීමේ දී අනුගමනය කරන පහත සඳහන් සම්මත රීති උදාහරණ සහිත ව පැහැදිලි කරන්න.
  - කර්තෘ කාරක, කර්ම කාරක වාක්‍ය රීති
  - විශේෂ වාක්‍ය රීති
    - සංශයාර්ථය
    - ඇත, නැත යෝගය
    - හා, සහ නිපාත යෝගය
    - සමග, කැටුව නිපාත යෝගය
    - විකල්පාර්ථ නිපාත යෝගය
  - සමානාර්ථ නිපාත යෝගය
  - උපමාවාචී නිපාත යෝගය
- එක් රීතියක් සඳහා උදාහරණ තුනක්වත් සපයන්න.
- එක් රීතියක් පැහැදිලි කිරීමෙන් අනතුරු ව ඊට අදාළ අභ්‍යාසයක ශිෂ්‍යයන් නිරත කරවන්න. (වාක්‍ය රීතියට අදාළ අභ්‍යාස සකස් කර ගන්න.)
- නිවැරදි වාක්‍ය රීති පුහුණු වීම සඳහා පෙළ පොතේ ඇති අභ්‍යාසවල ද ශිෂ්‍යයන් නිරත කරවන්න.

**ගුණාත්මක යෙදවුම් :**

**ගුරුභවතාගේ අතිරේක පරිශීලනය සඳහා -**

- සිංහල ලේඛන රීතිය - ජාතික අධ්‍යාපන ආයතනය
- සිංහල භාෂා ව්‍යාකරණය - ඩබ්. එස්. කරුණාතිලක
- සිංහල රචනය හා රසාස්වාදය - පී. තේනබඳු

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

- වාක්‍ය රීති හඳුනා ගෙන ප්‍රකාශ කරයි.
- වාක්‍ය රීතිවලට නිදර්ශන සපයයි.
- රීතිවලට අනුව වාක්‍ය ලියයි.
- වාක්‍යයක ඇතුළත් රීතිය කුමක් දැ යි විස්තර කරයි.

## 10. වාක්‍ය රචනය

**නිපුණතාව :** 8.0 භාෂාව නිරවුල් ව හා නිවැරදි ව භාවිත කරමින් නිර්මාණාත්මක ලේඛනයේ යෙදෙයි.

**නිපුණතා මට්ටම :** 8.1 කරුණු සංවිධානය කර ගනිමින් මාතෘකානුකූල ව රචනා ලියයි.

**කාලච්ඡේද ගණන :** 02 යි.

**ඉගෙනුම් පල :**

- රචනා මාතෘකාවට අදාළ ව කරුණු රැස් කරයි.
- රැස් කරගත් කරුණු තර්කානුකූල ව පෙළගස්වයි.
- ශිල්පීය දක්ෂතා අනුගමනය කරමින් රචනා ලියයි.
- නිර්මාණාත්මක ව ලේඛනයේ යෙදෙයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස් :**

- රචනාව යනු කුමක් ද යි පැහැදිලි කරන්න.
  (කිසියම් මාතෘකාවක් ඔස්සේ අදහස්, කරුණු හා හැඟීම් ක්‍රමවත් ව සංවිධානාත්මක ව හා නිර්මාණාත්මක ව ලේඛන මාධ්‍යයෙන් ඉදිරිපත් කිරීම වාක්‍ය රචනය යි.)
- රචකයා තුළ පැවතිය යුතු ලක්ෂණ හඳුන්වා දෙන්න.
  - රචනා මාතෘකාවට අදාළ ව අදහස් හා කරුණු ගොනු කිරීමේ හැකියාව
  - උචිත වාංමාලාවෙන් පොහොසත් බව
  - මනා ලේඛන කුසලතාව
- සාර්ථක රචනයක පැවතිය යුතු ලක්ෂණ හඳුන්වා දෙන්න.
  - අදහස් හා කරුණුවල අදාළ බව
  - තර්කානුකූල බව
  - හරවත් බව
  - සංවිධානාත්මක බව
  - නිර්මාණාත්මක බව
  - ප්‍රමාණාත්මක බව
- රචනා මාතෘකා වර්ග හඳුන්වා දෙන්න.
  - වෘත්තාන්ත
  - වර්ණනාත්මක
  - විචාරාත්මක
  - උපදේශාත්මක
  - කාල්පනික
- විවිධ තේමා ඔස්සේ රචනා මාතෘකා සැකසීමට උපදෙස් දෙන්න.
  (ආර්ථික, සාමාජීය, දේශපාලනික, ආධ්‍යාපනික, සංස්කෘතික, විද්‍යාත්මක, තාක්ෂණික ආදි)
- කරුණු රැස් කිරීමට අවශ්‍ය මග පෙන්වන්න.
  - පුවත් පත් මගින්
  - ගුවන් විදුලිය හා රූපවාහිනිය මගින්
  - සඟරා සහ පොතපත මගින්
  - සාකච්ඡා හා සම්මන්ත්‍රණ මගින්
- රචනාවක සැලකිල්ලක් සකසා ගැනීමට මග පෙන්වන්න.
  - හැඳින්වීම
  - රචනා ශරීරය (එක කරුණකට එක් ඡේදය බැගින්)
  - අවසානය

- රචනය ලිවීමේ දී ශිල්පීය ප්‍රයෝග කෙරෙහි අවධානය යොමු කළ යුතු බව පහදා දෙන්න.
  - උක්ත ආඛ්‍යාත පද සම්බන්ධය
  - අක්ෂර වින්‍යාසය
  - අත් අකුරුවල ස්වරූපය
  - පද බෙදීම
  - විරාම ලක්ෂණ
- රචනය රසවත් ව ලිවීම සඳහා සාම්ප්‍රදායික යෙදුම් හා භාෂා ප්‍රයෝග උචිත ලෙස යොදා ගැනීම කෙරෙහි අවධානය යොමු කරන්න.
  - වියත් කියමන්
  - ප්‍රස්තාව පිරුළු
  - රූඪී
  - ආප්තෝපදේශ
  - පොත්පත්වලින් උපුටාගත් උද්ධෘත

**ගුණාත්මක යෙදවුම් :**

- පුවත් පත්
- ශාස්ත්‍රීය සඟරා
- විවිධ ග්‍රන්ථ

**ඇගයීම හා තක්සේරුකරණය :**

- දෙන ලද තේමාවට අදාළ ව රචනා මාතෘකා සකසයි.
- රචනා සැලකිල්ලක් සාර්ථක ව නිර්මාණය කරයි.
- සංවිධානාත්මක ව කරුණු ගොනු කරමින් ලියයි.
- ශිල්පීය දක්ෂතා මැනවින් යොදා ගනියි.
- නිර්මාණාත්මක ව හා තර්කානුකුල ව අදහස් ඉදිරිපත් කරයි.

## 11. සාහිත්‍ය රසවින්දනය හා විචාරය

**නිපුණතාව :** 11.0 රසඥතා වර්ධනය සඳහා සාහිත්‍ය නිර්මාණ පරිශීලනය කරයි.

**නිපුණතා මට්ටම :** 11.2 සාහිත්‍ය නිර්මාණ රසාස්වාදයේ යෙදෙයි.

11.3 සාහිත්‍ය නිර්මාණ අධ්‍යයනය කර විචාර හැකියා ප්‍රදර්ශනය කරයි.

**කාලච්ඡේද ගණන :** 04 යි.

**ඉගෙනුම් පල :**

- සාහිත්‍ය නිර්මාණ සඳහා පාදක වූ අත්දැකීම් හඳුනා ගෙන ඉදිරිපත් කරයි.
- නිර්මාණවලින් ප්‍රකට වන සාහිත්‍යමය ලක්ෂණ අගය කරයි.
- සාහිත්‍ය නිර්මාණ පිළිබඳ ව තම අදහස් ඉදිරිපත් කරයි.
- විචාරය පිළිබඳ පොත පත කියවා ලබා ගත් දැනුම ප්‍රදර්ශනය කරයි.
- විවිධ සාහිත්‍ය නිර්මාණ රසාස්වාදයේ යෙදෙයි.
- සාහිත්‍ය නිර්මාණ පිළිබඳ ව විචාරාත්මක ව අදහස් පළ කරයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස් :**

- රසාස්වාදය හා විචාරය පිළිබඳ ශිෂ්‍යයන්ගේ අදහස් මතු කර ගැනීම සඳහා සාකච්ඡාවක නිරත වන්න.
- පෙළ පොතේ පාඩම ඇසුරෙන් රසාස්වාදය හා විචාරය යන්න අවබෝධ කර ගැනීමට මග පෙන්වන්න.
- වාර්තාවක් හා සාහිත්‍ය නිර්මාණයක් අතර වෙනස සාකච්ඡා කරන්න.
- පාඩමේ ඇතුළත් සාහිත්‍ය සංකල්ප උදාහරණ සහිත ව පැහැදිලි කරන්න.
- පෙළ පොතේ ඇතුළත් ගද්‍ය හා පද්‍ය නිර්මාණ කිහිපයක් රස විඳීමට හා විචාරය කිරීමට අවස්ථාව ලබා දෙන්න.

**මූලික වදන් / සංකල්ප :**

- වාච්‍යාර්ථ - ඍජු ව ම (කෙළින් ම) ප්‍රකාශ කෙරෙන අර්ථය
- ව්‍යංග්‍යාර්ථ - වක්‍ර ව ප්‍රකාශ කෙරෙන අර්ථය
- වෘත්තය - මාත්‍රා ආදිය අනුව පද්‍යයක් රචනා කිරීමේ දී මෙන්ම ගායනා කිරීමේ දී ලැබෙන තාලය

**ගුණාත්මක යෙදවුම් :**

- සාහිත්‍ය විද්‍යාව - එදිරිවීර සරච්චන්ද්‍ර
- නවකවි සරණිය - විමල් දිසානායක
- සිංහල කාව්‍ය සංග්‍රහය - ආරිය රාජකරුණා
- සාහිත්‍ය විචාර ප්‍රදීපිකා - ඒ.වී.සුරවීර

**ඇගයීම හා තක්සේරුකරණය :**

- සාහිත්‍යය විචාරයේ මූලික සංකල්ප සරල ව පැහැදිලි කරයි.
- පද්‍ය නිර්මාණ රස වින්දනයේ යෙදෙයි.
- ගද්‍ය නිර්මාණ රස විඳියි.
- ගද්‍ය හා පද්‍ය නිර්මාණ විචාරයට ලක් කරයි.

## 12. සාරාංශකරණය

**නිපුණතාව :** 8.0 භාෂාව නිරවුල් ව හා නිවැරදි ව භාවිත කරමින් නිර්මාණාත්මක ලේඛනයේ යෙදෙයි.

**නිපුණතා මට්ටම :** 8.3 ලේඛන සාරාංශකරණයේ යෙදෙයි.

**කාලච්ඡේද ගණන :** 02 යි.

**ඉගෙනුම් පල :**

- ලිපි ලේඛනවලින් වැදගත් කරුණු වෙන් කොට දක්වයි.
- වැදගත් කරුණු අර්ථවත් ව ගළපා ඉදිරිපත් කරයි.
- මුල් ලේඛනයේ අදහස ආරක්ෂා වන පරිදි සාරාංශ කර දක්වයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස් :**

- 'සාහිත්‍ය රසවින්දනය හා විචාරය' පාඩමෙන් තෝරා ගත් ගද්‍ය කොටසක් ඇසුරෙන් සාරාංශකරණය හඳුන්වා දෙන්න.
- හොඳ සාරාංශයක ලක්ෂණ සාකච්ඡා කරන්න.
  - මුල් ලේඛනයේ මූලික අදහස සංක්ෂිප්ත කොට දැක්වීම
  - විස්තරාත්මක ප්‍රකාශ හා සාරාංශ කරන්නාගේ අදහස් ඇතුළත් නො වීම
  - අපේක්ෂිත වචන ප්‍රමාණයට සීමා වීම
- සාරාංශකරණයේ දී සැලකිලිමත් විය යුතු කරුණු සාකච්ඡා කරන්න.
  - සාරාංශ කළ යුතු ලේඛනය කිහිප වරක් කියවා මූලික අදහස තේරුම් ගැනීම
  - මුල් ලේඛනයෙන් ඉවත් කළ යුතු විස්තරාත්මක ප්‍රකාශ හඳුනා ගැනීම
  - උපමා, රූපක, අතිශයෝක්ති ආදි අලංකාර ඉවත් කිරීම
  - උපුටා ගැනීම්, පුද්ගල ප්‍රකාශ ආදියෙහි මූලික අදහස පමණක් ගෙන සාරාංශ කරන්නාගේ වචනයෙන් ලිවීම
  - නිවැරදි උක්ත ආඛ්‍යාත සම්බන්ධය හා පද බෙදීම ආදි ශිල්පීය උපක්‍රම භාවිත කිරීම
  - උපදෙස් මගින් අපේක්ෂිත වචන ප්‍රමාණයක් නියම කොට ඇත්නම් ඒ අනුව හෝ එසේ නොමැති විට මුල් ලේඛනයේ වචනවලින් 1/3 ක් වන සේ හෝ සාරාංශ ලිවීම
- ඇමුණුම 1හි සඳහන් අභ්‍යාසයෙහි ශිෂ්‍යයන් නිරත කරවන්න.

**ගුණාත්මක යෙදවුම් :**

- සාරාංශ කිරීම සඳහා ඡේද කිහිපයක්
- සිංහල රචනය හා සාහිත්‍ය රසාස්වාදය - පී. තේනබදු

**ඇගයීම හා තක්සේරුකරණය :**

- සාරාංශකරණයේ දී අනුගමනය කළ යුතු කරුණු පැහැදිලි කරයි.
- දී ඇති උපදෙස් අනුව ගද්‍ය ඡේදයක් සාරාංශ කරයි.
- ගද්‍ය ඡේද ඇසුරෙන් සාරාංශකරණය ප්‍රගුණ කරයි.
- අවස්ථෝචිත ව ලිපිලේඛන සාරාංශ කොට දක්වයි.

ඇමුණුම 1

- **පහත සඳහන් ගද්‍ය කොටස් ඒවායේ අන්තර්ගත වචන ප්‍රමාණයෙන් තුනෙන් එකක් වන සේ සාරාංශ කරන්න.**

01. අප්‍රසන්න දේ පහසුවෙන් අමතක වී යෑම චෛතසික ධර්මතාවක් බව පළමුවෙන් පෙන්වා දුන්නේ ෆ්‍රොයිඩ් ය. මනුෂ්‍යයාට ජීවත් විය හැක්කේ මේ චෛතසික ධර්මයේ පිහිටෙන් බව ද පෙනී යයි. මනුෂ්‍යයාට අප්‍රසන්න අත්දැකීම් නිතර සිහි වේ නම් ඔහුට ජීවත් විය නොහැකි බැවිනි. එහෙත් ෆ්‍රොයිඩ්ගේ මතවාදය අනුව මේ අප්‍රසන්න අත්දැකීම් උපවිඥානයෙහි සැඟවී තිබී නොයෙක් විකෘත චේෂ්ටාවන්ට හේතු වන බව ද පිළිගත යුතු ය. සමහර අවස්ථාවන්හි දී මෙසේ උපවිඥානයෙහි සැඟවී ඇති මේ අප්‍රසන්න සිතුවිලි සිහියට විත් මනුෂ්‍යයාගේ ක්‍රියාකාරිත්වයට බාධා කරයි. එසේ වූ කල ඔහුගේ ක්‍රියාකලාපය සාමාන්‍ය මනුෂ්‍යයාගේ ක්‍රියාකලාපයට වෙනස් වේ. මනෝ බාධක වශයෙන් හැඳින්විය හැකි මේ චිත්ත ධර්ම නොදැනුවත් ව බොහෝ අයගේ ජීවිතය කෙරෙහි බලපාන බව පෙනේ. මනෝ විග්‍රහයෙන් මෙවැනි මනෝ බාධකයන් උපවිඥානයෙන් එළියට ගෙන මිනිසුන් ප්‍රකෘතිමත් කරනු ලැබේ.

- සාහිත්‍ය විද්‍යාව, එදිරිවීර සරච්චන්ද්‍ර, 15 පිටුව -

02. මානව සන්නිවේදනය තාක්ෂණික අංශයෙන් හා මනෝවිද්‍යාත්මක අංශයෙන් ලබා ඇති දියුණුව ක්‍රම විද්‍යාත්මක අංශයෙන් තවමත් ලබා ඇති බව කිව නොහේ. සන්නිවේදන කාර්යය මැනවින් ඉටු කර ගැනීමට අවශ්‍ය යන්ත්‍රසූත්‍ර අප සතු ව තිබේ නම්, මානව සන්නිවේදනයෙහි මනෝවිද්‍යාත්මක මානයන් පිළිබඳ ගැඹුරු අවබෝධයක් අප තුළ ඇත් නම්, මේවායින් උපරිම ප්‍රයෝජනය ලබා ගන්නේ කෙසේ ද? ක්‍රම විධි වැදගත් වන්නේ මෙහි දී ය. පුවත්පත්, ගුවන්විදුලිය, චිත්‍රපටය, රූපවාහිනිය වැනි නවීන ජන මාධ්‍යයන් ජනතාව කෙරෙහි බලපාන ආකාරය පිළිබඳ වඩා නිවැරදි අවබෝධයක් ඇති කර ගැනීමට නම් ක්‍රම විධි මීට වඩා දියුණු විය යුතු ය. අප බොහෝ විට ජනමාධ්‍යයන්ගේ බලපෑම අරබයා යම් යම් නිගමනවලට එළඹෙන්නේ සම්පූර්ණයෙන් ම ශාස්ත්‍රානුකූල විධි නියමයන් අනුව නොව අන්තර්ග්‍රහයෙනි. එහෙත් මෙසේ ඇති කර ගනු ලබන දැනුම විද්‍යාත්මක පදනමක පිහිටා ලබාගත් දැනුමක් නො වේ. ජනමාධ්‍යවල බලපෑම, ජනතාව ඒවා කෙරෙහි දක්වන ප්‍රතික්‍රියා වඩාත් විද්‍යානුකූල ලෙස වටහා ගැනීමේ භාරධූර කාර්යය කෙරෙහි සන්නිවේදන විද්‍යාඥයින්ගේ සැලකිල්ල යොමු වෙමින් පවතී.

- මානව සන්නිවේදනය, විමල් දිසානායක, 82 පිටුව -

## 13. දියවර සිරිසර (විද්‍යුත් මාධ්‍ය වැඩසටහන්වලට සවන් දීම)

**නිපුණතාව :** 1.0 සන්නිවේදනය සාර්ථක කර ගැනීම සඳහා ශ්‍රවණ හා කථන කුසලතා ඵලදායී ලෙස යොදා ගනිති.

**නිපුණතා මට්ටම :** 1.4 සාවධාන ව සවන් දී තොරතුරු රැස් කරයි.

**කාලච්ඡේද ගණන :** 02 යි.

**ඉගෙනුම් පල :**

- විද්‍යුත් මාධ්‍ය වැඩසටහන්වලට සාවධාන ව සවන් දී ප්‍රතිචාර දක්වයි.
- විද්‍යුත් මාධ්‍ය වැඩසටහන්වලට සාවධාන ව සවන් දීමේ වැදගත්කම විස්තර කරයි.
- විද්‍යුත් මාධ්‍ය වැඩසටහන්වලට සවන් දී රැස් කර ගත් තොරතුරු ඉදිරිපත් කරයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස් :**

- උචිත ක්‍රමවේදයක් භාවිත කර පෙළපොතේ සඳහන් විද්‍යුත් මාධ්‍ය වැඩසටහනට හෝ වෙනත් සුදුසු වැඩසටහනකට හෝ සවන් දීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න. (මේ සඳහා ගුවන්විදුලිය, කැසට් පට, සංයුක්ත තැටි භාවිත කිරීම උචිත ය.)
- සවන් දුන් විද්‍යුත් මාධ්‍ය වැඩසටහනේ වැදගත් කරුණු හා තොරතුරු සටහන් කර ගැනීමට යොමු කරන්න.
- වැඩි ම තොරතුරු ප්‍රමාණයක් නිවැරදි ව සටහන් කර ගත් ශිෂ්‍යයින් ඇගයීමට ලක් කරන්න.
- විද්‍යුත් මාධ්‍ය වැඩසටහන්වලට සවන් දී රැස් කර ගත් තොරතුරු භාවිතයට ගැනීම සඳහා විවිධ භාෂා ක්‍රියාකාරකම්වල සිසුන් නිරත කරවන්න. (උදා: රචනා, පුවත්පත් ලිපි, විවාද, බුද්ධි මණ්ඩල සාකච්ඡා, සංවාද)

**ගුණාත්මක යෙදවුම් :**

- විද්‍යුත් මාධ්‍ය වැඩසටහනක් ඇතුළත් හඬ පටයක් හෝ සජීවී වැඩසටහනක්

**ඇගයීම හා තක්සේරුකරණය :**

- විද්‍යුත් මාධ්‍ය වැඩසටහන්වලට සාවධාන ව සවන් දී කරුණු එක් රැස් කරයි.
- සවන් දී රැස් කර ගත් කරුණු විවිධ භාෂා කාර්යයන්හි දී ප්‍රයෝජනයට ගනියි.
- සවන් දීමේ පරිචය මගින් සන්නිවේදනය ඵලදායි කර ගනී.

# 14. ශ්‍රීමත් අයිවර් ජෙනිංස්

**නිපුණතාව :** 2.0 ජීවන අත්දැකීම් පුළුල් කර ගැනීම සඳහා කියවීමේ පුරුදු අර්ථවත් ව යොදා ගනියි.

**නිපුණතා මට්ටම :** 2.3 නිශ්ශබ්ද ව කියවා අවබෝධ කරගත් කරුණු ඉදිරිපත් කරයි.

**කාලච්ඡේද ගණන :** 02 යි.

**ඉගෙනුම් පල :**

- අර්ථාවබෝධයෙන් යුතු ව පොත පත කියවයි.
- කියවා අවබෝධ කරගත් කරුණු ඉදිරිපත් කරයි.
- කියවීමෙන් ලත් දැනුම අවස්ථෝචිත ව භාවිත කරයි.
- කාලය අර්ථවත් ව ගත කිරීම සඳහා නිශ්ශබ්ද ව කියවීම යොදා ගනියි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස් :**

- නිශ්ශබ්ද ව කියවීමේ වැදගත්කම හා ප්‍රයෝජන පිළිබඳ ශිෂ්‍යයන් සමග සාකච්ඡා කරන්න.
  - කාලය ප්‍රයෝජනවත් ලෙස ගත කිරීමට
  - වැඩි තොරතුරු ප්‍රමාණයක් දැන ගැනීමට/එක් රැස් කර ගැනීමට
  - කියවන අතර සටහන් තබා ගැනීමට
  - කියවන අතර කියවන දේ පිළිබඳ ව විචාරාත්මක ව සිතීමට
  - කියවීමේ කුසලතාව හා වේගය වර්ධනය කර ගැනීමට
- ශ්‍රීමත් අයිවර් ජෙනිංස් පිළිබඳ පාඩම ඇසුරෙන් පහත සඳහන් කරුණු සාකච්ඡා කරන්න.
  - ආධ්‍යාපනික වශයෙන් ශ්‍රීමත් අයිවර් ජෙනිංස් මහතාගෙන් සිදු වූ සේවය
  - දේශපාලනමය වශයෙන් ඔහුගේ මැදිහත් වීම
  - ශ්‍රීමත් අයිවර් ජෙනිංස් චරිතයෙන් ලබා ගත හැකි ආදර්ශ
- පාඩමේ ඇතුළත් පාරිභාෂික වචන හඳුනා ගැනීමට හා ඒවායෙහි අර්ථාවබෝධයට ශිෂ්‍යයන් යොමු කරන්න.

**ගුණාත්මක යෙදවුම් :**

- ශ්‍රීමත් අයිවර් ජෙනිංස් මහතා පිළිබඳ වෙනත් ලිපි ලේඛන

**ඇගයීම හා තක්සේරුකරණය :**

- නිශ්ශබ්ද ව කියවීමේ ප්‍රයෝජන හඳුනා ගෙන ඉදිරිපත් කරයි.
- අර්ථවබෝධයෙන් යුතු ව කියවීම අගය කරයි.
- කරුණු රැස් කිරීම සඳහා නිශ්ශබ්දව කියවයි.
- කියවා අවබෝධ කරගත් කරුණු අවස්ථානුකූල ව යොදා ගනියි.

## 15. විභක්ති

**නිපුණතාව :** 6.0 සම්මත භාෂා රීති අනුගමනය කරමින් ලේඛන කාර්යයේ යෙදෙයි.

**නිපුණතා මට්ටම :** 6.1 නාම පද සහ එහි ප්‍රභේද පිළිබඳ අවබෝධයෙන් යුතු ව ලේඛනයේ යෙදෙයි.

**කාලච්ඡේද ගණන :** 02 යි.

**ඉගෙනුම් පල :**

- නාම පදවල ඇතුළත් විභක්ති ප්‍රත්‍ය හඳුනා ගෙන ප්‍රකාශ කරයි.
- විභක්ති අනුව නාම පද වර නැගීමේ යෙදෙයි.
- විභක්ති අනුව නාම පද නිවැරදි ව යොදමින් ලේඛන කාර්යයේ යෙදෙයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස් :**

- වාක්‍ය ලිවීමේ දී නාම පද විවිධ අර්ථ ප්‍රකාශ කිරීම සඳහා විවිධ ආකාරයට යොදා ගැනීමේ අවශ්‍යතාව උදාහරණ ඇසුරෙන් පැහැදිලි කරන්න.
- නාම පදයක විවිධ රූප (හෙවත් විභක්ති) ඇති බව ශිෂ්‍යයන් සමග සාකච්ඡා කරන්න.
- වාක්‍ය ගොඩනැගීමේ දී එම රූපවල අවශ්‍යතාව උදාහරණ සහිත ව පෙන්වා දෙන්න.
- විවිධ විභක්තිවලට අයත් නාම පද සහිත ඡේදයක් ශිෂ්‍යයන්ට ලබා දී ඒ ඇසුරෙන් විභක්ති නවය හඳුනා ගැනීමට අවස්ථාව ලබා දෙන්න.
- ඇමුණුම 1හි දක්වා ඇති අභ්‍යාසවල ශිෂ්‍යයන් නිරත කරවන්න.
- පෙළ පොතේ අභ්‍යාස ලබා දෙන්න.

**ගුණාත්මක යෙදවුම් :**

විභක්ති දැක්වෙන පුවරුවක්

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

- නාම පදයක විවිධ රූප ඇති බව විස්තර කරයි.
- අදහස් ප්‍රකාශ කිරීමේ දී නාම පදවල විවිධ රූප යොදා ගැනීමේ අවශ්‍යතාව පැහැදිලි කරයි.
- නාම පදයක ඇතුළත් විභක්තිය හඳුනා ගෙන ප්‍රකාශ කරයි.
- දෙන ලද නාම පද විභක්ති අනුව වර නගයි.
- විවිධ විභක්ති සහිත නාම පද ඇතුළත් වන සේ වාක්‍ය නිර්මාණය කරයි.

ඇමුණුම 1

**01. පහත සඳහන් ඡේදයේ ඉරි ඇඳි පද කුමන විභක්තිවලට අයත් දැයි ලියන්න.**

අම්මා දරුවා දෙස ආදරයෙන් බලා සිටියා ය. අනතුරු ව මව විසින් දරුවා සුරතල් කෙරිණි. මඳ වේලාවකින් මව දරුවාට කිරි පොවමින් නින්ද යන තුරු නැළවිලි ගී කිව්වා ය. දරුවා කරණ කොට අවශ්‍ය දෑ සූදානම් කළ ඈ දරුවාගෙන් ඉවත් වී දරුවාගේ කාමරය පිරිසිදු කිරීමෙහි නියැළුණා ය. නින්දෙන් අවදි වූ දරුවා වටපිට බලා මව සිටිනු දැක සිනාසුණේ ය. දරුවා කෙරෙහි මහත් සෙනෙහසින් යුතු ව එතැනට පැමිණි මව දරුවා නිසා මම යළි යළිත් උපන්නෙමි යනුවෙන් සෙමෙන් මිමිණුවා ය.

## 16. බස ඉපදුණු සැටි අසනුය විස්තර (විද්වත් සාකච්ඡා /බුද්ධි මණ්ඩල සාකච්ඡා)

**නිපුණතාව :** 1.0 සන්නිවේදනය සාර්ථක කර ගැනීම සඳහා ශ්‍රවණ හා කථන කුසලතා ඵලදායි ලෙස යොදා ගනියි.

**නිපුණතා මට්ටම :** 1.5 දේශන සාකච්ඡා ආදියට විචාරශීලී ව සවන් දීමේ කුසලතාව ප්‍රදර්ශනය කරයි.
1.6 නිරවුල් ව හා නිවැරදි ලෙස බස හසුරුවමින් හඬ පාලනයෙන් යුතු ව කතා කරයි.

**කාලච්ඡේද ගණන :** 03 යි.

**ඉගෙනුම් පල :**

- දේශන /සාකච්ඡාවලට සවන් දී ප්‍රතිචාර දක්වයි.
- දේශනයේ/සාකච්ඡාවේ ඇතුළත් කරුණු උපුටා දක්වයි
- දේශනයේ/සාකච්ඡාවේ ඇතුළත් කරුණු පිළිබඳ තම මතය ප්‍රකාශ කරයි.
- සබකෝලයෙන් තොර ව කතා කරයි.
- නිවැරදි ව හා පැහැදිලි ව කතා කිරීමේ හැකියාව ප්‍රදර්ශනය කරයි.
- උචිත පරිදි අංග චලන යොදා ගනිමින් කතා කරයි.
- සෙසු අයගේ අවධානය දිනා ගනිමින් කතා කරයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස් :**

- සුදුසු ක්‍රමවේදයක් යොදා ගෙන විද්වත් සාකච්ඡාවකට සවන් දීමට / නැරඹීමට ශිෂ්‍යයන්ට අවස්ථාව ලබා දෙන්න.
- විද්වත් සාකච්ඡාවට සවන් දීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු සාකච්ඡා කරන්න.
- සාකච්ඡාවේ ඇතුළත් වැදගත් කරුණු සටහන් කර ගැනීමට උපදෙස් දෙන්න.
- එක් එක් ශිෂ්‍යයන් සටහන් කරගත් විශේෂ කරුණු පන්තියට ඉදිරිපත් කිරීමට අවස්ථාව සලසා දෙන්න.
- බුද්ධි මණ්ඩල සාකච්ඡාවක ලක්ෂණ ශිෂ්‍යයන් සමග සාකච්ඡා කරන්න.
    - සාකච්ඡාව මෙහෙයවන පුද්ගලයෙකු සහ සාකච්ඡාවට සහභාගි වන පිරිසක් සිටීම
    - සාකච්ඡාව මෙහෙයවන්නා විසින් සාකච්ඡාවේ මාතෘකාව/තේමාව/අරමුණ පැහැදිලි කිරීම
    - එක් එක් දේශකයා විසින් කරුණු/අදහස් දැක්වීම
    - වරකට එක් අයෙකු බැගින් කතා කිරීම
    - අදහස් දැක්වීමට වරින් වර අවස්ථා කිහිපයක් ලබා දීම
    - සජීවී සාකච්ඡාවක දී නම් ශ්‍රාවක ප්‍රතිචාරවලට හා ප්‍රශ්නවලට අවස්ථාව ලබා දීම
- මෙහි දී ශිෂ්‍යයන් විද්‍යුත් මාධ්‍ය මගින් නරඹා ඇති බුද්ධි මණ්ඩල සාකච්ඡා පිළිබඳ මතකය අවදි කරන්න.
- ශිෂ්‍යයන් කණ්ඩායම්වලට බෙදා බුද්ධි මණ්ඩල සාකච්ඡාවකට ගැළපෙන මාතෘකා බෙදා දෙන්න.
- එක් කණ්ඩායමක් සාකච්ඡාව මෙහෙයවන විට අනෙක් කණ්ඩායම සවන් දීමට යොමු කරන්න.

- සාකච්ඡාවේ දී මතු වන වැදගත් කරුණු සටහන් කර ගැනීමට උපදෙස් දෙන්න.
- කථනයේ දී මතු වන දුර්වලතා දුරු කර ගැනීමට මග පෙන්වන්න.

**ගුණාත්මක යෙදවුම් :**

- විද්වත් සාකච්ඡාවක් ඇතුළත් සංයුක්ත තැටියක් හෝ සජීවී ආදර්ශනයක්

**ඇගයීම හා තක්සේරුකරණය :**

- සාවධාන ව සවන් දීමෙන් කරුණු ධාරණය කර ගත හැකි බව පැහැදිලි කරයි.
- විද්වත් සාකච්ඡාවට සවන් දී ග්‍රහණය කර ගත් කරුණු අවස්ථානුකූල ව යොදා ගනියි.
- සබකෝලයෙන් තොර ව කථා කරයි.
- මාතෘකාවට අදාළ ව අදහස් ඉදිරිපත් කරයි.
- සාකච්ඡාවේ දී අන් අයට බාධා නො වන ලෙස ක්‍රියාකාරී ව සහභාගි වෙයි.
- සුහදශීලී ලෙස බුද්ධි මණ්ඩල සාකච්ඡාවේ නිරත වෙයි.

# 17. රාජකාරි ලිපි

**නිපුණතාව :** 7.0 භාෂාව නිරවුල් ව හා නිවැරදි ව භාවිත කරමින් ලේඛනයේ යෙදෙයි.

**නිපුණතා මට්ටම :** 7.1 තොරතුරු සන්නිවේදනය සඳහා ලිපි ලියයි.

**කාලච්ඡේද ගණන :** 01 යි.

**ඉගෙනුම් පල :**

- රාජකාරි ලිපි හා ව්‍යාපාරික ලිපි ලිවීමේ අවශ්‍යතාව පැහැදිලි කරයි.
- රාජකාරි හා ව්‍යාපාරික ලිපිවල ස්වරූපය හඳුනා ගෙන විස්තර කරයි.
- ශිල්පීය උපක්‍රම අනුගමනය කරමින් ලේඛනයේ යෙදෙයි.
- ආකෘතිය පිළිබඳ අවබෝධයෙන් යුක්ත ව ලිපි ලියයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස් :**

- රාජකාරි ලිපි හා ව්‍යාපාරික ලිපි සම්බන්ධ ව පසුගිය ශ්‍රේණිවල දී උගත් කරුණු පිළිබඳ ශිෂ්‍යයන්ගේ මතකය අවදි කරන්න.
- රාජකාරි ලිපි හා ව්‍යාපාරික ලිපි අතර වෙනස පහදා දෙන්න.
- විවිධ අවශ්‍යතා ඉටුකර ගැනීමේ දී රාජකාරි හා ව්‍යාපාරික ලිපි ලිවීමේ වැදගත්කම පහදා දෙන්න.
- මෙම ලිපි පිළිගත් ආකෘතියකට අනුව ලිවීමේ අවශ්‍යතාව පෙන්වා දෙන්න.
- පාසලේ පැවැත්වෙන බුද්ධි මණ්ඩල සාකච්ඡාවක් ආවරණය කිරීම සඳහා පැමිණෙන ලෙස ඉල්ලමින් ජන මාධ්‍ය ආයතනයකට යවන රාජකාරී ලිපියක් ලිවීම සඳහා අභ්‍යාසයක් ශිෂ්‍යයන්ට ලබා දෙන්න.
- රාජකාරි ලිපි ලිවීම සඳහා සුදුසු තවත් අභ්‍යාස ශිෂ්‍යයන්ට ලබා දෙන්න.

**ගුණාත්මක යෙදවුම්**

- විවිධ ආයතනවලින් එවා ඇති රාජකාරි ලිපි කිහිපයක්
- පුද්ගලයන් ආයතන වෙත යැවූ ලිපි කිහිපයක්
- ව්‍යාපාරික ලිපි කිහිපයක්

**ඇගයීම හා තක්සේරුකරණය :**

- රාජකාරි ලිපි හා ව්‍යාපාරික ලිපිවල ඇති විශේෂ ලක්ෂණ හඳුනා ගෙන ඉදිරිපත් කරයි.
- රාජකාරිමය අවශ්‍යතා පහසුවෙන් ඉටුකර ගැනීම සඳහා ලිපි ලිවීමේ වැදගත්කම පැහැදිලි කරයි.
- ලිපි ලිවීමේ දී සම්මත ආකෘතිය අනුගමනය කරයි.
- විධිමත් ලෙස රාජකාරි ලිපි ලියයි.

## 18. බහුවිධ මාධ්‍ය භාවිතය

**නිපුණතාව :** 1.0 සන්නිවේදනය සාර්ථක කර ගැනීම සඳහා ශ්‍රවණ හා කථන කුසලතා ඵලදායි ලෙස යොදා ගනියි.

**නිපුණතා මට්ටම :** 1.7 බහු විධ මාධ්‍ය යොදා ගනිමින් ඉදිරිපත් කිරීමේ කුසලතා ප්‍රදර්ශනය කරයි.

**කාලච්ඡේද ගණන :** 03 යි.

**ඉගෙනුම් පල :**

- ඉදිරිපත් කිරීම් සඳහා යොදා ගත හැකි විවිධ මාධ්‍ය හඳුනා ගෙන ප්‍රකාශ කරයි.
- ඉදිරිපත් කිරීමේ කුසලතා වර්ධනය කර ගැනීමේ වටිනාකම පැහැදිලි කරයි.
- ඉදිරිපත් කිරීමේ දී බහුවිධ මාධ්‍ය නිවැරදි ව භාවිත කරයි.
- තාක්ෂණික මෙවලම් හැසිරවීමේ හුරුව ප්‍රදර්ශනය කරයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස් :**

- ඉදිරිපත් කිරීමේ කුසලතා වර්ධනය කර ගැනීමේ වටිනාකම පැහැදිලි කරන්න.
- ඉදිරිපත් කිරීමේ විවිධ මාධ්‍ය, උපකරණ හා ඒවා හසුරුවන ආකාරය පැහැදිලි කරන්න.
  - කථන මාධ්‍යය
  - භූමිකා රංගන
  - පිටු පෙරළන
  - උහිස් ප්‍රක්ෂේපණ (OHP Presentations)
  - බහු මාධ්‍ය ප්‍රක්ෂේපණ ( Multimedia Presentations)
  - පෝස්ටර්
  - චිත්‍ර

  ආදි මාධ්‍ය
- ඉදිරිපත් කිරීමක දී මාධ්‍ය එකකට වැඩි ගණනක් යොදා ගැනීමෙන් එම ඉදිරිපත් කිරීම වඩා ඵලදායී හා විචිත්‍රවත් කර ගත හැකි ආකාරය පැහැදිලි කරන්න.
- පෙළ පොතේ පාඩම් ඇසුරු කර ගෙන කේවල හෝ කණ්ඩායම් ඉදිරිපත් කිරීමක් සිදු කිරීම සඳහා උචිත පැවරුම් මාතෘකා ශිෂ්‍යයන්ට ලබා දෙන්න.

  උදා:
  - විලියම් ශේක්ෂ්පියර්ගෙන් කලා ක්ෂේත්‍රයට සිදු වූ සේවය
  - සිංහල භාෂාවේ සන්ධි
  - සාම්ප්‍රදායික යෙදුම්
- ඉදිරිපත් කිරීම සඳහා මාධ්‍ය එකකට වැඩි සංඛ්‍යාවක් යොදා ගැනීමට ශිෂ්‍යයන් උනන්දු කරවන්න.

**ගුණාත්මක යෙදවුම් :**

- විවිධ මාධ්‍ය යොදා ගෙන සිදු කරන ඉදිරිපත් කිරීමක ආදර්ශනයක්

**මූලික වදන්/සංකල්ප :**

- බහු විධ මාධ්‍ය භාවිතය - ඉදිරිපත් කිරීමක දී කථන, ලිඛිත, චිත්‍ර, අංග චලන, ගායන, රංගන ආදි මාධ්‍ය එකකට වැඩි ගණනක් භාවිත කිරීම.

උදා: - කථන මාධ්‍යය සමග චිත්‍ර/ පෝස්ටර් භාවිතය
- කථන මාධ්‍යය සමග බහු මාධ්‍ය ප්‍රක්ෂේපණ (Multimedia Presentations)

භාවිතය

- කථාවක් අතරතුර සතර අභිනය සහිත භූමිකා රංගන, ගීත ආදිය භාවිතය
- ඡායාරූප, චිත්‍ර, වගු, ප්‍රස්තාර ඇතුළත් කරමින් පුවත් පත් ලිපි හෝ විද්‍යුත් ලේඛන සැකසීම

**ඇගයීම හා තක්සේරුකරණය :**

- ඉදිරිපත් කිරීමේ විවිධ මාධ්‍ය නම් කරයි.
- ඉදිරිපත් කිරීම සඳහා උචිත මාධ්‍ය තෝරා ගනියි.
- විවිධ මාධ්‍ය මනාව හසුරුවයි.
- විවිධ මාධ්‍ය භාවිත කරමින් ඉදිරිපත් කිරීම් සිදු කරයි.

## 19. බිත්ති පුවත් පත් ලිපි හා සඟරා ලිපි

**නිපුණතාව :** 8.0 භාෂාව නිරවුල් ව හා නිවැරදි ව හා භාවිත කරමින් නිර්මාණාත්මක ලේඛනයේ යෙදෙයි.

**නිපුණතා මට්ටම :** 8.2 පාඨකයා ආකර්ෂණය වන පරිදි අදහස් ඉදිරිපත් කරමින් නිර්මාණාත්මක ව ලියයි.

**කාලච්ඡේද ගණන : 02 යි.**

**ඉගෙනුම් පල :**

- නිර්මාණාත්මක ලේඛනයක ලක්ෂණ පැහැදිලි කරයි.
- නිර්මාණාත්මක ලේඛනය කුසලතා ප්‍රදර්ශනය කරයි.
- කරුණු ගොනු කරමින් ලියයි.
- උචිත භාෂා ශෛලියක් භාවිත කරයි.
- සෙසු අය ආකර්ෂණය කර ගත හැකි වන පරිදි ලියයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස් :**

- නිර්මාණාත්මක ලේඛනයේ අවශ්‍යතාව හා ප්‍රයෝජන ශිෂ්‍යයන්ට පහදා දෙන්න.
- තෝරා ගත් පුවත් පත් ලිපි සහ වාර්තා කිහිපයක් ඇසුරෙන් නිර්මාණාත්ක ලිපියක හා වාර්තාවක වෙනස හා විශේෂතා පැහැදිලි කරන්න.
- පන්තියේ ශිෂ්‍යයන්ගේ නිර්මාණාත්මක හැකියාවන් හඳුනා ගෙන බිත්ති පුවත් පත සඳහා සංස්කාරක මණ්ඩලයක් පත් කර ගන්න. (මසකට වරක්/වාරයකට වරක් සංස්කාරක මණ්ඩලය අලුත් කරන්න.)
- බිත්ති පුවත් පතක් සංවිධානය කරන්න. එහි දී;
  - බිත්ති පුවත් පතේ ආකෘතිය සැකසීම
  - ලිපි නිර්මාණය කිරීම
  - සංස්කරණය
  - ගුරු අනුමැතිය ලත් නිර්මාණ පළ කිරීම
  - නිර්මාණ ඇගයීම

  සඳහා මඟ පෙන්වන්න.
- ළමා පුවත් පත් / ජාතික පුවත් පත් , සඟරා සඳහා ලිපි යොමු කිරීමට ශිෂ්‍යයන් උනන්දු කරවන්න.

**ගුණාත්මක යෙදවුම් :**

- පුවත් පත් / සඟරා ලිපි කිහිපයක්

**ඇගයීම හා තක්සේරුකරණය :**

- නිර්මාණාත්මක බස් වහරක් යොදා ගනිමින් පුවත් පත් ලිපි ලියයි.
- නිර්මාණාත්මක ලේඛනයේ දී ශිල්පීය කුසලතා භාවිත කරයි.
- මැනවින් කරුණු ගොනු කොට දක්වමින් පුවත් පත් ලිපි ලියයි.

## 20. රට වටා පද රටා (සිංහල ජන වහර)

**නිපුණතාව :** 5.0 භාෂාමය කාර්යයේ දී වාක්කෝෂය, භාෂා සම්ප්‍රදාය හා භාෂා ව්‍යවහාර පිළිබඳ දැනුම ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම :** 5.3 භාෂා ව්‍යවහාරයේ විවිධතා හඳුනා ගෙන භාෂාව භාවිත කරයි.

**කාලච්ඡේද ගණන :** 02 යි.

**ඉගෙනුම් පල :**

- උපභාෂා ව්‍යවහාර හඳුනා ගෙන නම් කරයි.
- විවිධ භාෂා ව්‍යවහාර පිළිබඳ ව අදහස් ප්‍රකාශ කරයි.
- ප්‍රාදේශීය හා පරිමිත භාෂා දැනුමෙන් සන්නිවේදනය පහසු කර ගනියි.
- විවිධ භාෂා ව්‍යවහාර පිළිබඳ අවබෝධයෙන් යුතු ව කටයුතු කරයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස්**

- විවිධ භාෂා ව්‍යවහාර සහිත ප්‍රකාශන කල් ඇතිව ශිෂ්‍යයන්ට සොයා ගැනීමට උපදෙස් දෙන්න.
- ප්‍රධාන භාෂක සමාජය තුළ ප්‍රාදේශීය වශයෙන් විවිධ ව්‍යවහාර පවතින බව පෙන්වා දෙන්න.
    - නුවර කලාවිය ජන වහර
    - දිගාමඩුලු ජන වහර
    - වෙල්ලස්ස ජන වහර
    - සත් කෝරළ ජන වහර
    - සතර කෝරළ ජන වහර
    - දකුණු පළාත් ජන වහර
    - වන්නි ජන වහර

    ආදිය නිදසුන් මගින් පැහැදිලි කර දෙන්න.
    (ඇමුණුම 1 භාවිතයට ගන්න.)
- කිසියම් වෘත්තියක නියැලෙන අතර හෝ ඇතැම් කාර්යයන් සිදු කරන අවස්ථාවේ පමණක් භාවිත කරන භාෂා ව්‍යවහාර (පරිමිත භාෂා) පවතින බව පෙන්වා දෙන්න. ඒවා නිදසුන් මගින් පැහැදිලි කර දෙන්න.
    - හේන් ගොවිතැන ආශ්‍රිත භාෂා ව්‍යවහාර
    - කමත ආශ්‍රිත භාෂා ව්‍යවහාර
    - ධීවර කර්මාන්තය ආශ්‍රිත භාෂා ව්‍යවහාර
    - පතල් කර්මාන්තය ආශ්‍රිත භාෂා ව්‍යවහාර
    - ශ්‍රී පාද වන්දනාව ආශ්‍රිත භාෂා ව්‍යවහාර
    - ආගමික ස්ථාන ආශ්‍රිත ව්‍යවහාර

    (ඇමුණුම 2 භාවිතයට ගන්න.)

- විවිධ භාෂා ව්‍යවහාර පිළිබඳ අවබෝධය තහවුරු වීම සඳහා වාක්‍ය නිර්මාණය කිරීමේ අභ්‍යාස ශිෂ්‍යයන්ට ලබා දෙන්න.

**ගුණාත්මක යෙදවුම් :**

- සිංහල ජන වහර - ජේ. බී. දිසානායක
- දිගාමඩුල්ලේ ආශ්චර්යය - මායා රංජන්

ගුරුභවතාගේ පරිශීලනය සඳහා-

- භාෂා අධ්‍යයනය හා සිංහල ව්‍යවහාරය- විමල් ජී. බලගල්ලේ
- භාෂාව හා සමාජය - කේ. එන්. ඕ. ධර්මදාස

ඇගයීම හා තක්සේරුකරණය :

- විවිධ භාෂා ව්‍යවහාරවලට අයත් වචන හඳුනා ගෙන නම් කරයි
- ප්‍රාදේශීය හා පරිමිත භාෂා ව්‍යවහාර හා සම්බන්ධ වචන භාවිතයේ හැකියාව අගය කරයි.
- ප්‍රාදේශීය හා පරිමිත භාෂා ව්‍යවහාර ඇතුළත් ලිපි ලේඛන එකතු කරයි.
- අවබෝධයෙන් යුතු ව විවිධ භාෂා ව්‍යවහාර භාවිත කරයි.

ඇමුණුම 1

උප භාෂා ව්‍යවහාර

- නුවර කලාවියේ ජන වහර
    - ආනම - උකුවට හැදූ හොද්ද
    - අහවර වෙලා - ඉවර වෙලා
    - අත්තම - ශ්‍රමය හුවමාරු කර ගැනීම
    - එකතු පාද වී - එක් රැස් වී
    - කිලි ගෙදර - අපිරිසිදු ගෙදර
    - ගිරහ දෝස - ග්‍රහ අපල
    - නිස්ස - සුදුස්ස
    - පෙත්මග - පටුපාර
    - මායියා - භාර්යාව
    - යාතිකාව - යාච්ඤාව
- දිගාමඩුලු ජන වහර
    - අංකොළ මිටියා - වළහා
    - කුඩිත්තිය - කුඩා ලබු කැටය
    - ගස් ගෝනා - වඳුරා
    - තනි කොටුව - හුදකලා වූ හේන
    - තුලාන - වසම/ප්‍රදේශය
    - දුවාබානව - තෙම්පරාදු කරනවා
    - පනං වෙනවා - යනවා
    - බුඩා - වයසක තැනැත්තා
- උඩරට ජන වහර
    - හෙල් මලු - කඳු බෑවුම්වල කුඹුරු
    - පහිනය - පණිවුඩය
    - අප්පල්ලෙ - ඇතිළිය
    - සෝමාරියා - කම්මැලියා
    - කුලිච්චම - වේට්ටිය
    - දෙකඩ හාල් - සුන් සහල්
    - සිරිප්පානිය - හිරිකිතය
    - අකම්පාල වෙනවා - කම්පාවට පත්වීම
    - සනුහරේ - පරම්පරාවේ අය
- දකුණු පළාතේ ජන වහර
    - පල්ල - පතුල
    - අච්චුව - දඬුවම
    - අත්බරුව - උදැල්ල
    - ආරෝව - රණ්ඩුව
    - කපන්නාව - පිහිය
    - ඇහැකි - පුළුවන්
    - ඔයනවා - ලෙලි ගහනවා
    - දොඩනවා - කතා කරනවා
    - සබුක්කුව - දඬුවම
    - හගිස්සනවා - විමසා බලනවා
- වන්නි ජන වහර
    - තාන්තුවාව - මංගල්‍යය
    - කැලේ ගහනවා - මළ සිරුරක් වළ දැමීම

- බහ දෙනවා - විවාහයට කැමැත්ත දෙනවා
- ලන්ද - පුංචි කැලෑව
- ඉරගල වැටෙනවා - ඉර බැස යනවා
- කටවහ - වචනයෙන් සිදු වන දෝෂ
- කිරිමුත්තා - පුල්ලෙයාර් දෙවියෝ
- නමෝ විත්තියෙං - මුලින් ම

ඇමුණුම 2 - **පරිමිත භාෂා ව්‍යවහාර**

- හේන් ගොවිතැන ආශ්‍රිත ව්‍යවහාර
    - යල-මහ - ගොවිතැන් කන්න
    - නෙළනවා - වල් පැළ ගැලවීම
    - බිං හීය - පළමුවන සී සෑම
    - හේන් කනත්ත - අතහැර දමූ හේන
    - වප්පන - වැපිරූ ගොවි බිම්
    - ඒණිය - ගසේ පැලට නගින ඉණිමඟ

- කමත ආශ්‍රිත ව්‍යවහාර
    - බැත - වී
    - යතුර - කුල්ල
    - යාල්ලනවා - කමතේ වී මැනීම
    - අට මගල - කමතේ ඇඳි යන්ත්‍රය
    - ගොන් කවඩියා - මයිනා
    - කටුපන් මල්ල - වී දමන මල්ල
    - කලවිට - කමත
    - කයිය - කුලී රහිත ව සමූහික ව වැඩ කිරීම

- ධීවර කර්මාන්තය ආශ්‍රිත ව්‍යවහාර
    - ඊත්තු බැලීම - මුහුදේ සුළං හමන දිසාව බැලීම
    - ලෙල්ලම - මාළු විකුණන තැන
    - රේන්දකාරයා - මාළු වෙළෙන්දා
    - පාන - ප්‍රදීපාගාරය
    - වාරකන් - මුහුදු රළ වේගවත් කාලය
    - ගැටිස්සා - ඉස්සා
    - දියඹෙ යනවා - ඈත මුහුදේ මසුන් මැරීමට යාම

- පතල් කර්මාන්තය ආශ්‍රිත ව්‍යවහාර
    - කුමතේරුවා - පතලේ කළමනාකරු
    - කරුහවුල - පතලේ හවුලෙන් බාගය
    - හණ පෝරුව - මැණික් කපන උපකරණය
    - දෝනාව - පතල් වළේ හරහට හාරන උමං මග
    - තරාසම - ඉරි තැලී ඇති මැණික
    - දබරය - පතලේ පස් ගොඩට ගන්නා උපකරණය

- ශ්‍රී පාද වන්දනාව ආශ්‍රිත ව්‍යවහාර
    - කරුණා කරනවා - ශ්‍රී පාදය නගිනවා
    - කිරිකෝඩු - පළමු වර ශ්‍රී පාද වන්දනාවේ යන දරුවා
    - සැහැල්ලුව - ගමන් මල්ල
    - දඩු කෝඩු - පළමු වර ශ්‍රී පාද වන්දනාවේ යන වැඩිහිටියා

- ආගමික ස්ථාන ආශ්‍රිත ව්‍යවහාර
    - වඩිනවා - යනවා
    - අපවත් වෙනවා - මිය යනවා
    - වළඳනවා - අනුභව කරනවා
    - සැතපෙනවා - නිදියනවා

## 21. සන්ධි

**නිපුණතාව** : **6.0** සම්මත භාෂා රීති අනුගමනය කරමින් ලේඛන කාර්යයේ යෙදෙයි.

**නිපුණතා මට්ටම** : **6.4** පද සන්ධි කිරීමේ හැකියාව ප්‍රදර්ශනය කරයි.

**කාලච්ඡේද** : 2 යි.

**ඉගෙනුම් පල** :

- විවිධ සන්ධි වර්ග හඳුනා ගෙන නම් කරයි.
- විවිධ ක්‍රම යටතේ පද සන්ධි වන අයුරු විස්තර කරයි.
- පද නිවැරදි ව සන්ධි කරයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස්**

- සන්ධි පිළිබඳ පෙර වසරවල දී උගත් කරුණු නැවත සිහිපත් කරන්න.
- විවිධ සන්ධි වර්ග පිළිබඳ දැනුම උදාහරණ ඇසුරින් නැවත අවදි කරන්න.
- පෙළ පොතේ 'සිංහල ජන වහර'පාඩම හා තවත් පාඩම් කිහිපයක් තෝරා ගෙන ඒවායේ ඇතුළත් සන්ධි පද හඳුනා ගැනීමේ අභ්‍යාසයක් ලබා දෙන්න. එම සන්ධි පද අයත් සන්ධි වර්ගය නම් කිරීමට යොමු කරන්න.

**ගුණාත්මක යෙදවුම් :**

- සන්ධි වර්ගීකරණය දැක්වෙන සටහනක්

**ඇගයීම හා තක්සේරුකරණය :**

- සන්ධි පදයක් යනු කුමක් දැ යි නිර්වචනය කරයි.
- සන්ධි වර්ග නම් කරයි.
- සන්ධි වර්ග දැක්වෙන සටහනක් පිළියෙල කරයි.
- අවස්ථානුකූල ලෙස පද සන්ධි කරයි.

## 22. සමාස

**නිපුණතාව** : **6.0** සම්මත භාෂා රීති අනුගමනය කරමින් ලේඛන කාර්යයේ යෙදෙයි.

**නිපුණතා මට්ටම** : **6.1** නාම පද සහ එහි ප්‍රභේද පිළිබඳ ව අවබෝධයෙන් යුතු ව ලේඛනයේ යෙදෙයි.

**කාලච්ඡේද** : 3 යි.

**ඉගෙනුම් පල** :

- සමාස නම් කරයි.
- විවිධ ක්‍රම යටතේ පද සමාස වන අයුරු විස්තර කරයි.
- පද සමාස කර දක්වයි.
- අවබෝධයෙන් යුතු ව සමාස භාවිත කරයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස්**

- සමාස යනු කුමක් දැයි උදාහරණ ඇසුරින් පැහැදිලි කරන්න.
- පද සමාස කිරීමේ අවශ්‍යතාව පැහැදිලි කරන්න.
- විවිධ සමාස පද වර්ග හඳුන්වා දෙන්න.
- දළ සටහනක් ඇසුරින් සමාස වර්ගීකරණය පැහැදිලි කරන්න. (මේ සඳහා ඇමුණුම 1 යොදා ගන්න.)
- පෙළ පොතේ පාඩම් කිහිපයක් තෝරා ගෙන ඒවායේ ඇතුළත් සමාස පද හඳුනා ගැනීමේ අභ්‍යාසයක් ලබා දෙන්න. එම සමාස පද අයත් සමාස වර්ගය නම් කිරීමට යොමු කරන්න.

**ගුණාත්මක යෙදවුම් :**

- සමාස වර්ගීකරණය දැක්වෙන සටහනක් (ඇමුණුමේ 1හි සඳහන් ආකාරයට)

**ඇගයීම හා තක්සේරුකරණය :**

- සමාස පදයක් යනු කුමක් දැ යි නිර්වචනය කරයි.
- සමාස වර්ග නම් කරයි.
- සමාස වර්ග දැක්වෙන සටහනක් පිළියෙල කරයි.
- අවස්ථානුකූල ලෙස සමාස භාවිත කරයි.

## ඇමුණුම 1

**සමාස**

1. අව්‍යය සමාසය - ප්‍රබල, යාවජීව
   උපනායක, අනුනායක
   අකුසල්, අනවසර
2. විශේෂණ සමාසය - අළුකෙහෙල්
   කහකුරුල්ලා
   අටසිල්, දසපනත
3. අන්‍යාර්ථ සමාසය - දසබල, සියපත්
   නැගෙනහිර
4. විභක්ති සමාසය - බුදුබණ, කම්කරු
   පොල්තෙල්, කිරිබත්
5. දකාර්ථ සමාසය - ගස්වැල්,
   පොත්පත්, අඹුදරු

## 23. ශෝකයත් රසයක් කළ මිනිසෙක් (විලියම් ශේක්ෂ්පියර්)

**නිපුණතාව :** 10.0 සාහිත්‍යික, දාර්ශනික විද්‍යාත්මක හා තාක්ෂණික තොරතුරු ඇතුළත් නිර්මාණ පරිශීලනයෙන් ලබා ගත් දැනුම විවිධ භාෂා කාර්යයන් සඳහා යොදා ගනියි.

**නිපුණතා මට්ටම :** 10.1 සාහිත්‍යික හා දාර්ශනික තොරතුරු ඇතුළත් ලිපි ලේඛන ඇසුරු කරයි.

**කාලච්ඡේද ගණන :** 02 යි.

**ඉගෙනුම් පල :**

- විලියම් ශේක්ෂ්පියර්ගේ චරිත කතාව කියවයි.
- විලියම් ශේක්ෂ්පියර්ගේ චින්තනය පිළිබඳ අදහස් ප්‍රකාශ කරයි.
- විලියම් ශේක්ෂ්පියර්ගේ සේවය අගය කරයි.
- කියවීමෙන් ලත් දැනුම උචිත පරිදි භාවිත කරයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස් :**

- විලියම් ශේක්ෂ්පියර් පිළිබඳ පෙළපොතේ සඳහන් පාඩම ශිෂ්‍යයන්ට කියවීමට අවස්ථාව ලබා දෙන්න.

- විලියම් ශේක්ෂ්පියර් බටහිර සාහිත්‍යකරුවෙකු වශයෙන් හඳුන්වා දෙන්න.
- විලියම් ශේක්ෂ්පියර් ඉංග්‍රීසි නාට්‍ය රචකයෙකු බවත් ඔහුගේ නිර්මාණ විශ්ව සාහිත්‍යයේ සලකුණු බවට පත් වී ඇති බවත් පෙන්වා දෙන්න.
- එම නාට්‍ය බොහොමයක් ශෝකාන්ත නාට්‍ය ගණයට අයත් බව පැහැදිලි කරන්න.
- විලියම් ශේක්ෂ්පියර් හා ඔහුගේ නිර්මාණ හඳුන්වා දෙන්න. ඒ සඳහා පහත සඳහන් කරුණු යොදා ගන්න.
  - උපන් දිනය - 1564 අප්‍රේල් මාසයේ දී
  - ස්ථානය - එංගලන්තයේ ස්ට්‍රැෆර්ඩ්හි දී
  - අධ්‍යාපනය - ස්ට්‍රැෆර්ඩ්හි පාසලෙනි. ලතින් භාෂාව ඉගෙන ගෙන ඇත. බොහෝ දේ ස්වභාව ධර්මයාගෙන් හා අත්දැකීම් මගින් ඉගෙන ගෙන ඇත. වයස 13 දී පාසලෙන් ඉවත් විය.
  - රැකියාව - කිරි දෙවීම, බැටළු ලොම් කැපීම, බටර් මත් ගෑම වැනි රැකියාවල යෙදී ඇත.
  - විවාහය - අසළ ගමක විසූ ඈන් නමැති කාන්තාවක සමග විවාහ විය. පුතෙක් සහ දූවරු දෙදෙනෙක් වූහ.
  - නිර්මාණකරණයට පිවිසීම - ලන්ඩනයට ගොස් විවිධ රැකියාවල නිරත වී ඇත. පසු ව ස්වාධීන ලේඛකයෙකු වශයෙන් කටයුතු කරමින් නාට්‍යකරණයට පිවිස ඇත. ඔහුගේ නිර්මාණ අතර,
    - මැක්බත්
    - හැම්ලට්
    - ඔතෙලෝ

    වැනි නාට්‍ය විශ්ව සාහිත්‍ය නිර්මාණ බවට පත් වී ඇත. කවියෙකු වශයෙන් ද ප්‍රසිද්ධියක් උසුලයි.
- ඇමුණුම 1හි සහ පෙළපොතෙහි සඳහන් අභ්‍යාසවල ශිෂ්‍යයන් නිරත කරවන්න.

**ඇගයීම හා තක්සේරුකරණය :**

- විලියම් ශේක්ෂ්පියර්ගේ සාහිත්‍ය නිර්මාණ හඳුනා ගෙන ඉදිරිපත් කරයි.

- ශේක්ෂ්පියර්ගේ දාර්ශනික අදහස් අගය කරයි.
- විලියම් ශේක්ෂ්පියර්ගේ සාහිත්‍ය සේවාව පිළිබඳ ව අදහස් ප්‍රකාශ කරයි.
- ඔහුගේ සාහිත්‍ය නිර්මාණ කියවා රස විඳියි.

ඇමුණුම 1

**පහත සඳහන් පදවලට විරුද්ධාර්ථ පද ලියන්න.**

- උගත්
- ධන
- උසස්
- කාර්යක්ෂම
- අවබෝධය
- නේවාසික
- සුලබ
- විශේෂ
- ආරෝහණ
- ආගමන

# 24. ප්‍රත්‍යයාර්ථ නාම

**නිපුණතාව** : **6.0** සම්මත භාෂා රීති අනුගමනය කරමින් ලේඛන කාර්යයේ යෙදෙයි.

**නිපුණතා මට්ටම** : **6.1** නාම පද පිළිබඳ අවබෝධයෙන් යුතු ව ලේඛනයේ යෙදෙයි.

**කාලච්ඡේද** : 04 යි.

**ඉගෙනුම් පල** :

- ප්‍රත්‍යයාර්ථ නාම හඳුනා ගෙන නම් කරයි.
- තද්ධිත පද සෑදෙන අයුරු විස්තර කරයි.
- කෘදන්ත පද සෑදෙන අයුරු විස්තර කරයි.
- තද්ධිත හා කෘදන්ත හඳුනාගෙන ලේඛනයේ යෙදෙයි

**පාඩම් සැලසුම සඳහා උපදෙස්**

- ප්‍රත්‍යයාර්ථ නාම යනු කුමක් දැයි උදාහරණ සහිත ව හඳුන්වා දෙන්න.
- ප්‍රත්‍යයාර්ථ නාම වෙනත් නාම පදවලින් වෙනස් වන අයුරු පැහැදිලි කරන්න.
- තද්ධිත නාම හා කෘදන්ත නාම අතර වෙනස පැහැදිලි කරන්න.
- තද්ධිත ප්‍රත්‍ය හා කෘදන්ත ප්‍රත්‍ය කවරේ දැයි හඳුන්වන්න.
- ඒවා වර්ග කර ලියා දැක්වීමට මග පෙන්වන්න.
- තද්ධිත නාම පදයක් හා කෘදන්ත නාම පදයක් සැකසෙන අයුරු පැහැදිලි කර දෙන්න.
- පෙළ පොතේ නියමිත අභ්‍යාසවල ශිෂ්‍යයන් නිරත කරවන්න.

**මූලික වදන්/ සංකල්ප** :

- ප්‍රත්‍යයාර්ථ - ප්‍රත්‍යය + අර්ථ - ප්‍රත්‍යයෙහි අර්ථය ප්‍රධාන වන නාම පද
- තද්ධිත - තද් + හිත - ධාතු ප්‍රකෘතියකට පසු ව තද්ධිත ප්‍රත්‍යයක් එක් වීමෙන් සකස් වන්නේ තද්ධිත යි.
- කෘදන්ත - කෘත් + අන්ත - 'කෘත් 'නමින් හැඳින්වෙන ප්‍රත්‍යයක් ධාතු ප්‍රකෘතියකට එක් කිරීමෙන් සකස් වන්නේ කෘදන්ත යි.

**ගුණාත්මක යෙදවුම්** :

- තද්ධිත ප්‍රත්‍ය හා කෘදන්ත ප්‍රත්‍ය දැක්වෙන පුවරුවක්
- තද්ධිත නාම හා කෘදන්ත නාම දැක්වෙන පුවරුවක්

**ගුරුභවතාගේ අතිරේක පරිශීලනය සඳහා**

- සිංහල භාෂා ව්‍යාකරණය - ඩබ්. එස්. කරුණාතිලක

**ඇගයීම හා තක්සේරුකරණය** :

- ප්‍රත්‍යයාර්ථ නාමයක් යනු කුමක්දැයි අර්ථ දක්වයි.
- කෘදන්ත නාමයක් හා තද්ධිත නාමයක් සැකසෙන ආකාරය ලියා දක්වයි.
- තද්ධිත ප්‍රත්‍ය හා කෘදන්ත ප්‍රත්‍ය වෙන් වෙන් ව හඳුනා ගෙන විස්තර කරයි.
- ප්‍රත්‍යයාර්ථ නාම භාවිත කිරීමේ වැදගත්කම ප්‍රකාශ කරයි.
- කෘදන්ත ප්‍රත්‍ය හා තද්ධිත ප්‍රත්‍ය වෙන වෙන ම වගු ගත කරයි.

## 25. මිහි ලිය නළලේ අංජන තිලකේ (දේශාභිමානී ගීතය)

**නිපුණතාව :** 9.0 සංස්කෘතිය හා සාරධර්ම හඳුනා ගනිමින් සහජීවනය හා ජාතිකාභිමානය ගොඩනගා ගැනීම සඳහා භාෂාව භාවිත කරයි.

**නිපුණතා මට්ටම :** 9.3 දේශාභිමානි හැඟීම් දනවන සාහිත්‍ය නිර්මාණ ඇසුරු කරයි.

**කාලච්ඡේද ගණන :** 02 යි.

**ඉගෙනුම් පල :**

- දේශාභිමානී ගීයට සවන් දී අදහස් ප්‍රකාශ කරයි.
- ගීතය ඇසුරෙන් දේශාභිමානී හැඟීම් දනවන භාෂාත්මක යෙදුම් හඳුනා ගනියි.
- හඳුනා ගත් භාෂාත්මක යෙදුම් භාවිත කරමින් අදහස් ප්‍රකාශ කරයි.
- දේශාභිමානි ගීය රස විඳියි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස් :**

- පෙළ පොතේ සඳහන් දේශාභිමානි ගීය සුදුසු ක්‍රමවේදයක් මගින් ශිෂ්‍යයන්ට සවන් දීමට හා ගායනය කිරීමට අවස්ථාව සලස්වන්න.
- දේශාභිමානී ගී රචනා වීමේ අරමුණු සාකච්ඡා කරන්න.
  - තම රට පිළිබඳ භක්තියක් ඇති කිරීම
  - තම මව් බිමෙහි සංස්කෘතිය පිළිබඳ ඇල්මක් ඇති කිරීම
  - රටේ අභිවෘද්ධිය සඳහා කටයුතු කිරීමට යොමු කිරීම
  - මව්බිම පිළිබඳ යහ ආකල්ප වර්ධනය කිරීම
- ගීත නිර්මාණය සඳහා යොදා ගෙන ඇති භාෂාවේ විශේෂතා හඳුනා ගැනීමට ශිෂ්‍යයන්ට මග පෙන්වන්න.
- මව්බිම පිළිබඳ උදාර හැඟීම් ඇති කරලීම සඳහා රචකයා යොදා ගෙන ඇති භාෂාව කොතරම් පොහොසත් වී තිබේ ද යන්න සාකච්ඡා කරන්න.

**ගුණාත්මක යෙදවුම් :**

- දේශාභිමානී ගී කිහිපයක්

**ඇගයීම හා තක්සේරුකරණය :**

- දේශාභිමානී ගීතවලට සවන් දී අදහස් දක්වයි.
- දේශාභිමානය දනවන භාෂාත්මක යෙදුම් හඳුනා ගෙන ප්‍රකාශ කරයි.
- දේශාභිමානය දනවන නිර්මාණ අගය කරයි.
- දේශාභිමානී හැඟීම්වලින් යුක්ත ව කටයුතු කරයි.

## 26. බලංගොඩින් ගැලූ පැණසර මෙත් ගඟුල (ආනන්ද මෛත්‍රේය හිමි)

**නිපුණතාව :** 9.0 සංස්කෘතිය හා සාරධර්ම හඳුනා ගනිමින් සහජීවනය හා ජාතිකාභිමානය ගොඩනගා ගැනීම සඳහා භාෂාව භාවිත කර ගනියි.

**නිපුණතා මට්ටම :** 9.5 විවිධ නායකයන්ගේ චරිත කතා පරිශීලනය කරයි.

**කාලච්ඡේද ගණන :** 02 යි.

**ඉගෙනුම් පල :**

- ආනන්ද මෛත්‍රේය චරිතාපදානය කියවයි.
- ආනන්ද මෛත්‍රේය හිමියන්ගේ ජාතික ආගමික හා ශාස්ත්‍රීය සේවාව අගය කරයි.
- ආනන්ද මෛත්‍රේය හිමියන්ගේ චරිතයේ සුවිශේෂ ලක්ෂණ හඳුනා ගෙන ඉදිරිපත් කරයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස් :**

- ආනන්ද මෛත්‍රේය චරිතාපදානය පිළිබඳ පෙළපොතේ පාඩම කියවීමට ශිෂ්‍යයන් යොමු කරන්න.
- පන්තිය කණ්ඩායම් හතරකට වෙන් කර පහත සඳහන් මාතෘකා යටතේ කරුණු රැස්කර ලැයිස්තු ගත කිරීමට පවරන්න.

  බලංගොඩ ආනන්ද මෛත්‍රය මහ නාහිමියන්ගේ,
  1. ජීවන තොරතුරු
  2. අධ්‍යාපනය හා ලබා ඇති පදවි
  3. චරිත ලක්ෂණ
  4. විදේශ ධර්මදූත සේවය හා ධර්ම ප්‍රචාර කටයුතු

- ඒ ඒ කණ්ඩායමට කරුණු ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- සමාලෝචනයක යෙදෙන්න.
- පෙළපොතේ අභ්‍යාසවල ශිෂ්‍යයන් නිරත කරවන්න.

**මූලික වදන් / සංකල්ප :**

- අග්ගමහා පණ්ඩිත - මියැන්මාර් රාජ්‍යයෙන් විදේශික භික්ෂූන්ට පිරිනැමෙන ශිෂ්‍යත්වයක්
- සඟරාජ - රටක සියලු සංඝයාට ප්‍රධාන වූ තෙරුන් වහන්සේ.

**ගුණාත්මක යෙදවුම් :**

- ආනන්ද මෛත්‍රේය මහනාහිමියන්ගේ ඡායාරූපයක්
- ආනන්ද මෛත්‍රය නාහිමියන් ගැන ලිපි

**ගුරුභවතාගේ අතිරේක පරිශීලනය සඳහා :**

- ආනන්ද මෛත්‍රේය මහ නාහිමියන්ගේ දින සටහන් - සමුද්‍ර වෙත්තසිංහ

**ඇගයීම හා තක්සේරුකරණය :**

- ආනන්ද මෛත්‍රේය මහනාහිමියන්ගේ ජීවන තොරතුරු විස්තර කරයි.
- ආනන්ද මෛත්‍රේය හිමියන්ගේ සුවිශේෂී චරිත ලක්ෂණ අගයමින් කතා කරයි.
- ආනන්ද මෛත්‍රය හිමියන්ගේ ජාතික හා ආගමික සේවය පිළිබඳ කරුණු ලැයිස්තුගත කරයි.

# 27. ක්‍රියා පද

**නිපුණතාව :** 6.0 සම්මත භාෂා රීති අනුගමනය කරමින් ලේඛන කාර්යයේ යෙදෙයි.

**නිපුණතා මට්ටම :** 6.2 ක්‍රියාපද හා එහි ප්‍රභේද පිළිබඳ ව අවබෝධයෙන් යුතු ව ලේඛන කාර්යයේ යෙදෙයි.

**කාලච්ඡේද :** 02 යි.

**ඉගෙනුම් පල :**

- ක්‍රියා පද හඳුනා ගෙන නම් කරයි.
- ක්‍රියාපදවල ප්‍රභේද ඇති බව පැහැදිලි කරයි.
- ක්‍රියාපද නිවැරදි ව භාවිත කර ලේඛන කාර්යයේ යෙදෙයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස් :**

- වාචික ප්‍රශ්න මගින් ක්‍රියාපද පිළිබඳ ශිෂ්‍යයන්ගේ දැනුම අවදි කරන්න.
  උදා :-
  - ක්‍රියා පද යනු මොනවා ද?
  - අවසාන ක්‍රියා යනු මොනවා ද?
  - අනවසාන ක්‍රියා යනු මොනවා ද?
- ක්‍රියා පද පිළිබඳ මින් පෙර ශ්‍රේණිවල දී උගත් කරුණු නැවත ආවර්ජනය කරන්න.
  - වචන භේදය අනුව ක්‍රියා පද යෙදෙන ආකාරය
  - කාල භේදය අනුව ක්‍රියා පද යෙදෙන ආකාරය
  - පුරුෂ භේදය අනුව ක්‍රියා පද යෙදෙන ආකාරය
  - ලිංග භේදය අනුව ක්‍රියා පද යෙදෙන ආකාරය
  - පූර්ව ක්‍රියා
  - මිශ්‍ර ක්‍රියා
  - විධි ක්‍රියා
  - ආශිර්වාද ක්‍රියා
  - ප්‍රයෝජ්‍ය ක්‍රියා
  - අසම්භාව්‍ය ක්‍රියා
- ඇමුණුමේ සඳහන් ප්‍රශ්න සහ ගුරුවරයා විසින් සකස් කරන ලද තවත් ප්‍රශ්න ශිෂ්‍යයන්ට ලබා දෙන්න.
- 'ආනන්ද මෛත්‍රේය චරිතාපදානය' පාඩමේ එන අභ්‍යාසවල ද ශිෂ්‍යයන් නිරත කරවන්න.

**ගුණාත්මක යෙදවුම් :**

- ඇමුණුමේ සඳහන් ප්‍රශ්න සහ සකස් කරන ලද ප්‍රශ්න කිහිපයක්

**ගුරුභවතාගේ අතිරේක පරිශීලනය සඳහා**
- සිංහල භාෂාවේ ව්‍යාකරණය - ඩබ්. එස්. කරුණාතිලක
- ව්‍යාකරණ විවරණය - මුනිදාස කුමාරතුංග

**ඇගයීම හා තක්සේරුකරණය :**

- ක්‍රියා පද ප්‍රභේද නම් කරයි.
- ක්‍රියා පද යෙදෙන අවස්ථා උදාහරණ සහිත ව විස්තර කරයි.
- වාක්‍ය ලිවීමේ දී ක්‍රියා පද නිවැරදි ව භාවිත කරයි.

- ක්‍රියා පද නිවැරදි ව යෙදීමේ වැදගත්කම පැහැදිලි කරයි.
- ක්‍රියා පද නිවැරදි ව භාවිත කර වාක්‍ය ලියයි.

<u>ඇමුණුම</u> 1

- පහත දැක්වෙන වාක්‍යවල තද කළු අකුරින් දැක්වෙන පද පූර්ව ක්‍රියා බවට හරවා තනි වාක්‍යයක් ලෙස ලියන්න.

01. වඩුවෝ ලී බඩු **සාදති.** විකුණති.

02. අපි සාප්පුවට **ගියෙමු.** බඩු මිලට ගත්තෙමු.

03. ගුරුතුමා අකුරු **ඉගැන්නුවේ ය.** විවේක ගත්තේ ය.

04. අම්මා මල් **කැඩුවා ය.** බුදුන් වැන්දා ය.

05. තාත්තා වැඩට **ගියේ ය.** ගෙදර ආවේ ය.

- පූර්ව ක්‍රියා පද යොදා වාක්‍ය සම්පූර්ණ කරන්න.

01. කම්කරුවෝ .................. ගෙදර ගියෝ ය.

02. අයියා අඹ .................. කෑවේ ය.

03. නළුවා වේදිකාවට .................. රඟ පෑවේ ය.

- පහත සඳහන් වාක්‍ය මිශ්‍ර ක්‍රියා පද යොදා සම්පූර්ණ කරන්න.

01. මල්ලී .................. බත් ඉල්ලයි.

02. මිනිස්සු කවි .................. නටති.

03. පුතා වතුර ................. කෑම කෑවේ ය.

- පහත සඳහන් ක්‍රියා පද විධි ක්‍රියා බවට පත් කරන්න.

1. එනවා 2. කනවා 3. නටනවා 4. කනවා 5. බොනවා

- ප්‍රයෝජ්‍ය ක්‍රියා පද යොදා පහත සඳහන් වාක්‍ය සම්පූර්ණ කරන්න.

01. ගුරුවරයා ශිෂ්‍යයා ලවා අභ්‍යාස .....................

02. අක්කා නංගී ලවා ගීයක් ..................

03. තාත්තා වඩුවා ලවා පුටුව ..................

- පහත සඳහන් ආශිර්වාද ක්‍රියා පද යොදා වාක්‍ය තනන්න.

ජය වේවා ! සෙත් වේවා ! සැරදේවා ! සුවපත් වේවා ! රකිත්වා !

- අසම්භාව්‍ය ක්‍රියාපද යොදා වාක්‍ය සම්පූර්ණ කරන්න.
  - වැසි .................. ගඟ පිරෙයි.
  - පාඩම් .................. විභාගය සමත් වේවි.
  - බත් .................. බඩ පිරෙයි.
  - බල්ලන් .................. සොරු පැන යති.
  - විදුලි .................. හෙණ හඬ පැතිරෙයි.

● ක්‍රියා පද නිවැරදි ව යොදා පහත සඳහන් වාක්‍ය සම්පූර්ණ කරන්න.

01. ලේඛකයෝ පොත් ..................

02. ගස් සුළඟට ..................

03. නුඹලා ගෙදර ..................

04. මම ඊයේ කොළඹ ..................

05. අපි හෙට මඟුල් ගෙදර ..................

06. බස් රියක් එනතුරු මගීහු ..................

07. ගංගාවෝ මුහුදට ගලා ..................

08. පියසේන ද සිරිසේන ද කුඹුරු ..................

09. පණ්ඩිතයන් වහන්සේ පැනය ..................

10. කාර්යාලයේ ලිපිකරුවෝ ..................

11. ලක්වැසියෝ බෞද්ධයෝ ..................

12. අයියා සමග මම ඊයේ නගරයට .................

## 28. අද්‍යතන සාහිත්‍ය නිර්මාණයන්හි භාෂාව

**නිපුණතාව :** 10.0 සාහිත්‍යික, දාර්ශනික, විද්‍යාත්මක හා තාක්ෂණික තොරතුරු ඇතුළත් නිර්මාණ පරිශීලනයෙන් ලබා ගත් දැනුම විවිධ භාෂා කාර්යයන් සඳහා යොදා ගනියි.

**නිපුණතා මට්ටම :** 10.3 අද්‍යතන සාහිත්‍ය නිර්මාණවලින් ප්‍රකට වන සුවිශේෂතා හඳුනා ගෙන බස හසුරුවයි.

**කාලච්ඡේද ගණන :** 02 යි.

**ඉගෙනුම් පල :**

- අද්‍යතන සාහිත්‍ය නිර්මාණ පරිශීලනය කර අදහස් ප්‍රකාශ කරයි.
- භාෂාවේ සුවිශේෂතා හඳුනා ගෙන ඉදිරිපත් කරයි.
- අර්ථාන්විත ව භාෂාව භාවිත කරයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස් :**

- පෙළ පොතේ පාඩම කියවීමට ශිෂ්‍යයන් යොමු කරන්න.
- පාඩමේ විස්තර කෙරෙන කරුණු ඇසුරෙන් අද්‍යතන සාහිත්‍ය නිර්මාණවල සුවිශේෂ භාෂා ලක්ෂණ හඳුනා ගැනීමට සලස්වන්න.
- එහි දී පහත සඳහන් කරුණු කෙරෙහි ද අවධානය යොමු කරන්න.
  - නිර්මාණයේ අනුභූතිය
  - රචකයාගේ අරමුණ
  - අර්ථාලංකාර භාවිතය
  - ශබ්දාලංකාර භාවිතය
  - ඖචිත්‍ය ගුණය
  - සංකල්ප රූප මැවීම
  - ධ්වනිතාර්ථවත් බව

- ඒ ඒ නිර්මාණයට සුවිශේෂ වූ භාෂා ලක්ෂණ පිළිබඳ සාකච්ඡා කරන්න.
- ඒ ඒ නිර්මාණවල රචකයන් යොදා ගෙන ඇති භාෂාව, එම නිර්මාණවල අරමුණ, අනුභූතිය හා අන්තර්ගතය ආදියට කෙතරම් ගැළපේ ද යන්න සාකච්ඡාවට බඳුන් කරන්න.
- හඳුනා ගත් සුවිශේෂ භාෂා ලක්ෂණ, ප්‍රායෝගික භාවිතය සඳහා ශිෂ්‍යයන් උනන්දු කරවන්න. (උදා: නිර්මාණකරණයේ දී, ලේඛන කාර්යයේ දී)
- වෙනත් අද්‍යතන සාහිත්‍ය නිර්මාණ පරිශිලනය සඳහා ශිෂ්‍යයන් යොමු කරන්න.

**ගුණාත්මක යෙදවුම් :**

- අද්‍යතන සාහිත්‍ය නිර්මාණ කිහිපයක්

**ගුරුභවතාගේ අතිරේක පරිශීලනය සඳහා :**

- සාහිත්‍ය විද්‍යාව - එදිරිවීර සරච්චන්ද්‍ර
- කල්පනා ලෝකය - එදිරිවීර සරච්චන්ද්‍ර
- නිර්මාණය හා විචාරය - ඒ. වී. සුරවීර

**ඇගයීම හා තක්සේරුකරණය :**

- සාහිත්‍ය නිර්මාණකරුවන් යොදා ගත් රචනා උපක්‍රම හඳුනා ගෙන නම් කරයි.
- නිර්දිෂ්ට සාහිත්‍ය නිර්මාණවල සුවිශේෂ භාෂා ලක්ෂණ අගය කරයි .
- හඳුනා ගත් භාෂා ලක්ෂණ අර්ථාන්විත ව භාවිත කරමින් ලේඛන කාර්යයේ යෙදෙයි.

## 29. අව්‍යය පද

**නිපුණතාව :** 6.0 සම්මත භාෂා රීති අනුගමනය කරමින් ලේඛන කාර්යයේ යෙදෙයි.

**නිපුණතා මට්ටම :** 6.3 අව්‍යය පද නිවැරදි ව භාවිත කරයි.

**කාලච්ඡේද ගණන :** 02 යි.

**ඉගෙනුම් පල :**

- අව්‍යය පද යනු මොනවා දැ යි නම් කරයි.
- නිපාත හා උපසර්ග හඳුනා ගෙන ඉදිරිපත් කරයි.
- නිවැරදි අවබෝධයෙන් යුතු ව නිපාත භාවිත කරයි.
- උපසර්ග අර්ථවත් ව පදවල යොදයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස්**

- අව්‍යය පද පිළිබඳ ශිෂ්‍යයන්ගේ පෙර දැනුම අවදි කරන්න. ('වෙනස් නොවන' යන අර්ථය ඇති අව්‍යය යන වචනය ඇසුරෙන් අව්‍යය පද හඳුන්වා දෙන්න.)
- නිපාත හා උපසර්ග වශයෙන් අව්‍යය පද දෙවර්ගයක් ඇති බව පෙන්වා දෙන්න.
- 'නිපාත', තනි ව වාක්‍යයක මුල, මැද, අග යෙදෙන අයුරු උදාහරණ ඇසුරෙන් සිහිපත් කරන්න.
- 'උපසර්ග' වචනයක මුලින් පමණක් යෙදෙන බව උදාහරණ සහිත ව පැහැදිලි කරන්න.
- අව්‍යය පද නාම පද හා ක්‍රියා පද මෙන් වර නො නැගෙන බව විස්තර කරන්න.
- සිංහල ව්‍යවහාරයේ ඇති අව්‍යය පද, උපසර්ග හා නිපාත වශයෙන් වෙන් වෙන් ව ලයිස්තු ගත කිරීමට යොමු කරන්න.
- වාක්‍යාර්ථ පළ වීමට හා වාක්‍ය රීති ගොඩ නැගීමට අව්‍යය පද ඉවහල් වන අයුරු පහදා දෙන්න.
- ඇමුණුමේ සඳහන් අභ්‍යාසවල ශිෂ්‍යයන් නිරත කරවන්න.

**ගුණාත්මක යෙදවුම් :**

- උපසර්ගවල විවිධ ප්‍රභේද සඳහා උදාහරණ ඇතුළත් වගුවක්.
- නිපාතවල විවිධ ප්‍රභේද සඳහා උදාහරණ ඇතුළත් වගුවක්.
- උපසර්ග හා නිපාත පද ඇතුළත් වාක්‍ය කිහිපයක්.

**ඇගයීම හා තක්සේරුකරණය :**

- වාක්‍යවල යෙදී ඇති උපසර්ග හා නිපාත වෙන් කොට දක්වයි.
- උපසර්ග යෙදීමෙන් වචනවල අර්ථ වෙනස් වන ආකාරය ප්‍රකාශ කරයි.
- නිපාත පද යොදා අර්ථවත් ලෙස වාක්‍ය ගොඩ නගයි.

ඇමුණුම

**01. පහත දැක්වෙන වචනවල යෙදී ඇති උපසර්ග වෙන් කරන්න.**

I. ප්‍රබල
II. ප්‍රතිසංස්කරණ
III. අපවාද
IV. සුදන
V. සත්පුරුෂ
VI. පිළිගැනීම
VII. සන්දේශය
VIII. අත්‍යවශ්‍ය
IX. නිෂ්පාදනය
X. අවතක්සේරුව

**02. පහත දැක්වෙන වාක්‍යවල යෙදී ඇති නිපාත පද කවර නිපාත වර්ගයකට අයත්දැයි සඳහන් කරන්න.**

01. මට ඔහු නිතර මුණගැසෙයි.
02. තාත්තා මා සමඟ කාර්යාලයට ගියේ ය.
03. අපි නගරය දක්වා දුම්රියෙන් ගමන් කළෙමු.
04. අනේ ඔවුන්ට කරදරයක් සිදු වෙයි ද?
05. ඉංජිනේරුවන් විසින් පාලම ඉදිකරයි.

## 30. වතුර මල (කෙටිකතාව)

**නිපුණතාව :** 11.0 රසඥතා වර්ධනය සඳහා සාහිත්‍ය නිර්මාණ පරිශීලනය කරයි.

**නිපුණතා මට්ටම :** 11.1 සාහිත්‍ය නිර්මාණ පරිශීලනයෙන් හඳුනාගත් මානව අත්දැකීම් ප්‍රකාශ කරයි.

**කාලච්ඡේද :** 02 යි.

**ඉගෙනුම් පල :**

- කෙටිකතාව කියවා අදහස් පළ කරයි.
- කෙටිකතා නිර්මාණයට පදනම් වූ මානව අත්දැකීම් විස්තර කරයි.
- සාහිත්‍ය නිර්මාණවලින් ප්‍රකට වන මානුෂීය ගුණාංග හඳුනා ගෙන ඉදිරිපත් කරයි.
- සාහිත්‍ය නිර්මාණ අගය කරයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස් :**

- ඇරැව්වල නන්දිමිත්‍රයන්ගේ 'වතුර මල' කෙටිකතාව කියවීමට ශිෂ්‍යයන් යොමු කරන්න.
- එම කෙටිකතාවෙහි ගැබ් වූ මානව අත්දැකීම හඳුනා ගැනීමට සලස්වන්න.
- එම අත්දැකීම කතුවරයා මානව දයාවෙන් යුතු ව ඉදිරිපත් කර ඇති ආකාරය ශිෂ්‍යයන් සමග සාකච්ඡා කරන්න.
- කෙතරම් සොඳුරු පුද්ගලයෙකු තුළ වුවද රුදුරු මිනිස් ගති පහළ වන ආකාරය කෙටිකතාවෙන් නිරූපණය වන අයුරු සාකච්ඡා කරන්න.
- 'වතුර මල' රසවත් කෙටිකතාවක් බවට පත්වීමට හේතු වූ කරුණු පහත සඳහන් කරුණු ඇසුරෙන් සාකච්ඡා කරන්න.
  - කෙටිකතාව යනු -
    - ජීවිතයෙන් පැතිකඩක්  - ජීවිත විවරණයක්
    - ජීවිතයෙන් පෙත්තක්  - ජීවිතයේ සමීපරූපයක්
  - කෙටිකතා ලක්‍ෂණ -
    - කතා ප්‍රවෘත්තිය
    - දෘෂ්ටි කෝණය
    - චරිත නිරූපණය
    - පසුබිම් නිරූපණය
    - යථාර්ථ නිරූපණය
    - සංකේත නිරූපණය
    - නිර්මාණාත්මක භාෂා ලක්ෂණ
    - ඒකාබද්ධතාව
- 'වතුර මල' කෙටිකතාවේ එන සිරිමාන්න මහතා, අබිලින් උන්නැහේ , ලොකු හාමුදුරුවෝ ආදි චරිත පිළිබඳ ශිෂ්‍යයන්ට අදහස් ප්‍රකාශ කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- තම ජීවිතයේ මුහුණ දී ඇති මෙවන් අත්දැකීම් පිළිබඳ අදහස් දැක්වීමට ශිෂ්‍යයන්ට අවස්ථාව ලබා දෙන්න.
- පෙළ පොතේ අභ්‍යාසවලට ශිෂ්‍යයන් යොමු කරන්න.

**මූලික වදන් / සංකල්ප :**

- ඒකාබද්ධතාව - කෙටිකතාවේ සියලු අංග අතර මනා බැඳීමක් පැවතීම.

**ගුණාත්මක යෙදවුම් :**

- සුදු කොඩි (කෙටිකතා සංග්‍රහය) - ඇරැව්වල නන්දිමිත්‍ර

**ඇගයීම හා තක්සේරුකරණය :**

- කෙටිකතාවක් යනු කුමක් දැයි පැහැදිලි කරයි.
- 'වතුර මල' කෙටිකතාවට පාදක වූ අත්දැකීම පිළිබඳ ව අදහස් පළ කරයි.
- කෙටිකතාවේ චරිත නිරූපණය පිළිබඳ කරුණු ඉදිරිපත් කරයි.
- 'වතුර මල' කෙටිකතාව සාර්ථක වීමට හේතු පැහැදිලි කරයි.
- වෙනත් කෙටිකතා රස විඳීමට පෙලඹෙයි.

## 31. නිර්මාණාත්මක ප්‍රබන්ධ රචනය (කෙටිකතා නිර්මාණය)

**නිපුණතාව :** 12.0 අත්දැකීම් පාදක කර ගනිමින් නිර්මාණ කාර්යයේ යෙදෙයි.

**නිපුණතා මට්ටම :** 12.2 නිර්මාණාත්මක ප්‍රබන්ධකරණයේ යෙදෙයි.

**කාලච්ඡේද :** 02 යි.

**ඉගෙනුම් පල :**

- කෙටිකතා නිර්මාණයට සුදුසු අත්දැකීම් තෝරා ගනියි.
- සාර්ථක කෙටිකතාවක තිබිය යුතු අංග පැහැදිලි කරයි.
- කෙටිකතාවේ තේමාවට උචිත ලෙස සිද්ධි හා චරිත ගොනු කරයි.
- කෙටිකතා නිර්මාණය කරයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස් :**

- ශිෂ්‍යයන් රස විඳි 'වතුර මල' කෙටිකතාව ඇසුරෙන් පහත සඳහන් කරුණු පිළිබඳ සාකච්ඡාවක් මෙහෙයවන්න.
  - කෙටිකතාව යනු කුමක් ද?
  - කෙටිකතාවක ලක්ෂණ මොනවා ද?
  - කෙටිකතාවක් රසවත් වීමට හේතු මොනවා ද?
- පන්තිය කණ්ඩායම් හතරකට වෙන් කර පහත සඳහන් කෙටිකතා හතර බෙදා දෙන්න.
  - අපටත් දවසක ඉර පායාදෝ
  - කලහය
  - අපේක්ෂා
  - තාත්තා
- ඒවා කියවීමට අවස්ථාව ලබා දෙන්න.
- ඒවායේ සාර්ථක භාවයට හේතු වූ කරුණු සටහන් කර ගැනීමට යොමු කරන්න.
- කණ්ඩායම් වශයෙන් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- ඉදිරිපත් කළ කරුණු සමාලෝචනයක යෙදෙන්න.
- කෙටිකතාවක් ලිවීමේ දී අනුගමනය කළ යුතු ක්‍රමවේද පිළිබඳ පැහැදිලි කරන්න.
  1. අත්දැකීමක් තෝරා ගැනීම
  2. අවස්ථා හා සිද්ධි ගොනු කිරීම.
  3. චරිත පෙළ ගැස්වීම
  4. නිර්මාණාත්මක බස්වහරක් භාවිත කිරීම
- කෙටිකතා නිර්මාණයට අවස්ථාව ලබා දෙන්න. නිරීක්ෂණයක යෙදෙන්න.
- ලියන ලද කෙටිකතා අගය කරන්න. බිත්ති පුවත් පත සඳහා යොමු කරන්න.

**ගුණාත්මක යෙදවුම් :**

- අපටත් දවසක ඉර පායාදෝ - ඒ. වී. සුරවීර
- කලහය - ජී. බී. සේනානායක
- අපේක්ෂා - පියසිලි විජයමාන්න
- තාත්තා - ජී. බී. සේනානායක

**ගුරුභවතාගේ අතිරේක පරිශීලනය සඳහා :**

- කෙටිකතා නිර්මාණය, අධ්‍යයනය හා මූලධර්ම - රංජිත් ධර්මකීර්ති

**ඇගයීම හා තක්සේරුකරණය :**

- කෙටිකතා නිර්මාණය සඳහා සුදුසු අත්දැකීමක් තෝරා ගනියි.
- තේමාවට අදාළ ව සිද්ධි ගොනු කරයි.
- චරිත නිරූපණය, අවස්ථා, භාෂාව පරිසර වර්ණනා ආදිය භාවිත කිරීමේ හැකියාව පෙන්වයි.
- රසවත් ලෙස කෙටිකතා නිර්මාණය කරයි.

# 32. පුවත්පත් වාර්තා රචනය

**නිපුණතාව :** 7.0 භාෂාව නිරවුල් ව හා නිවැරදි ව භාවිත කරමින් ලේඛනයේ යෙදෙයි.

**නිපුණතා මට්ටම :** 7.2 ප්‍රායෝගික අවශ්‍යතා සඳහා ලේඛන සකස් කරයි.

**කාලච්ඡේද :** 02 යි.

**ඉගෙනුම් පල :**

- විවිධ ප්‍රායෝගික ලේඛන වර්ග හඳුනා ගෙන ප්‍රකාශ කරයි.
- ප්‍රායෝගික ලේඛන සඳහා උචිත ආකෘති භාවිත කිරීමේ අවශ්‍යතාව පැහැදිලි කරයි.
- ශිල්පීය උපක්‍රම අනුගමනය කරයි.
- අවශ්‍යතා අනුව විවිධ ප්‍රායෝගික ලේඛන සකස් කරයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස් :**

- පුවත් පත්වලින් තෝරා ගත් වාර්තා කිහිපයක් ඇසුරින් විවිධ පුවත් පත් වාර්තා ඇති බව පෙන්වා දෙන්න.
- පුවත්පත් වාර්තාවක විශේෂත්වය සාකච්ඡා කරන්න.
- පුවත්පත් වාර්තාකරණයේ දී සැලකිය යුතු කරුණු අවධාරණය කරන්න.
- ආකර්ෂණීය මාතෘකාවක් යෙදීම පාඨක අවධානය දිනා ගැනීමේ එක් ක්‍රමයක් බව පැහැදිලි කරන්න.
- පුවත්පත් වාර්තාවක භාෂාව මනා සංමයෙන් ඉදිරිපත් කිරීමේ අවශ්‍යතාව පැහැදිලි කර දෙන්න.
- ඇමුණුමෙහි දී ඇති කරුණු ඇසුරු කර ගෙන පුවත්පත් වර්තා සකස් කිරීමට ශිෂ්‍යයන් යොමු කරන්න.

**ගුණාත්මක යෙදවුම් :**

- පුවත්පත්වලින් තෝරා ගත්, රැස්වීම්, සාමාන්‍ය සිද්ධි හා විශේෂ සිද්ධි පිළිබඳ වාර්තා

**ඇගයීම හා තක්සේරුකරණය :**

- පුවත්පතක දක්නට ලැබෙන විවිධ වාර්තා හඳුනා ගෙන ඉදිරිපත් කරයි.
- පුවත්පත් වාර්තාවක විශේෂතා හඳුනා ගෙන ප්‍රකාශ කරයි.
- පුවත්පත් වාර්තාකරණයේ දී සැලකිල්ලට ගත යුතු කරුණු සාකච්ඡා කරයි.
- විවිධ අවස්ථා පදනම් කර ගෙන පුවත්පත් වාර්තා ලියයි.

<u>ඇමුණුම</u>

**01. පහත සඳහන් සිදුවීම් ඇසුරු කර ගෙන පුවත්පත් වාර්තා ලියන්න.**

- ඔබ පාසලේ අලුතින් ඉදිකළ තාක්ෂණ විද්‍යාගාරය විවෘත කිරීම සම්බන්ධයෙන් පැවැති රැස්වීම අළලා පුවත්පත් වාර්තාවක් පිළියෙල කරන්න.
- සිංහල හා හින්දු අලුත් අවුරුද්ද නිමිති කර ගෙන ඔබ ගමේ පැවැත්වුණු අවුරුදු උළෙල පිළිබඳ ව පුවත්පත් වාර්තාවක් පිළියෙල කරන්න.
- කඳුකර ප්‍රදේශයක සිදු වූ නාය යාමක් නිසා එහි ජනතාව පීඩාවට පත් වී ඇති ආකාරය පිළිබඳ ව පුවත්පත් වාර්තාවක් ලියන්න.

## 33. ප්‍රායෝගික ලේඛන

**නිපුණතාව :** 7.0 භාෂාව නිරවුල් ව හා නිවැරදි ව භාවිත කරමින් ලේඛනයේ යෙදෙයි.

**නිපුණතා මට්ටම :** 7.2 ප්‍රායෝගික අවශ්‍යතා සඳහා ලේඛන සකස් කරයි.

**කාලච්ඡේද ගණන :** 02 යි.

**ඉගෙනුම් පල :**

- විවිධ ප්‍රායෝගික ලේඛන වර්ග හඳුනා ගෙන ප්‍රකාශ කරයි.
- ප්‍රායෝගික ලේඛන සඳහා උචිත ආකෘති භාවිත කිරීමේ අවශ්‍යතාව පැහැදිලි කරයි.
- ප්‍රායෝගික ලේඛනයේ දී ශිල්පීය උපක්‍රම අනුගමනය කරයි.
- අවශ්‍යතා අනුව විවිධ ප්‍රායෝගික ලේඛන සකස් කරයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස් :**

- ප්‍රායෝගික අවශ්‍යතා සඳහා භාවිත කරන ලේඛන වර්ග පිළිබඳ පෙර දැනුම අවදි කරන්න.
- එහි දී පහත සඳහන් ලේඛන පිළිබඳ නිදර්ශන ඇසුරෙන් සාකච්ඡා කරන්න.
    - සුබ පැතුම් පත්
    - ආරාධනා පත්
    - පෞද්ගලික, රාජකාරි හා ව්‍යාපාරික ලිපි
    - ආකෘති පත්‍ර
    - වාර්තා
    - අත් පත්‍රිකා
    - න්‍යාය පත්‍ර
    - දැන්වීම්
- පන්තියේ ශිෂ්‍යයන් කණ්ඩායම් කිහිපයකට බෙදන්න. ඉහත සඳහන් වූ ප්‍රායෝගික ලේඛන වර්ගවලින් එකක් එක් කණ්ඩායමකට සැකසීමට පවරන්න. පෙර පන්තිවල දී උගත් ප්‍රායෝගික ලේඛන පිළිබඳ දැනුම මෙමගින් තහවුරු කරන්න.
- ශිෂ්‍යයන්ට තනි තනි ව ද මෙම ප්‍රායෝගික ලේඛන එකිනෙක සකස් කිරීමට අවසථාව ලබා දෙන්න.
- විවිධ ආකෘති පත්‍ර ලැයිස්තුවක් ඉදිරිපත් කර එවැනි ආකෘති පත්‍ර සොයා ගෙන එන ලෙස ශිෂ්‍යයන්ට දැනුම් දෙන්න.
- එම ආකෘති පත්‍ර නිවැරදි ලෙස පිරවීමට උපදෙස් හා අවස්ථාව ලබා දෙන්න.
- රැකියා අයදුම්පතක් සඳහා ජීව දත්ත පත්‍රිකාවක් සකස් කරන ආකාරය පිළිබඳ උපදෙස් ලබා දී ජීව දත්ත පත්‍රිකාවක් සකස් කිරීමට යොමු කරන්න.

**ගුණාත්මක යෙදවුම් :**

- සති අන්ත පුවත් පත්වල දැන්වීම් අතිරේක
- සිංහල රචනය හා රසාස්වාදය - පී. තේනබදු
- බැංකු, තැපැල්, ආදි ආයතනවල විවිධ ආකෘති පත්‍ර

**ඇගයීම හා තක්සේරුකරණය :**

- විවිධ ප්‍රායෝගික ලේඛන වර්ග හඳුනා ගෙන නම් කරයි.
- එක් එක් ප්‍රායෝගික ලේඛනවල විශේෂතා පැහැදිලි කරයි.
- ප්‍රායෝගික ලේඛන සකස් කිරීමේ දී ශිල්පීය උපක්‍රම අනුගමනය කරයි.
- නිවැරදි ආකෘති අනුව විවිධ ප්‍රායෝගික ලේඛන සකස් කරයි.

## 34. සුභාෂිතය

**නිපුණතාව :** 9.0 සංස්කෘතිය හා සාරධර්ම හඳුනා ගනිමින් සහජීවනය හා ජාතිකාභිමානය ගොඩනගා ගැනීම සඳහා භාෂාව භාවිත කරයි.

**නිපුණතා මට්ටම :** 9.2 පොත පත පරිශීලනයෙන් සාරධර්ම වර්ධනය කර ගනියි.

**කාලච්ඡේද ගණන :** 03 යි.

**ඉගෙනුම් පල :**

- සාහිත්‍ය නිර්මාණවල ප්‍රකට වන යහ සිරිත් හඳුනා ගෙන ඉදිරිපත් කරයි.
- යහ සිරිත් අනුගමනය කිරීම අගය කරයි.
- පොතපතින් හඳුනා ගත් යහ සිරිත් අනුගමනය කරයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස්**

- යහ සිරිත් අන්තර්ගත පද්‍ය නිර්මාණ අතර සුභාෂිතයේ සුවිශේෂත්වය සාකච්ඡා කරන්න.
- සුභාෂිතයෙන් සුදන ගුණ රැසක් හඳුනා ගත හැකි බව පෙන්වා දෙන්න.
- පද්‍යවලට සවන් දීමට ගායනා කිරීමට ශිෂ්‍යයන්ට අවස්ථාව ලබා දෙන්න.
- පද්‍යවල අර්ථය පැහැදිලි කර ගැනීමටත් පද්‍යවලින් ලබා දෙන උපදේශ හඳුනා ගැනීමටත් මග පෙන්වන්න.
- එම සදුපදේශ යහපත් ජීවිතයකට උපකාරී කර ගත හැකි අයුරු පැහැදිලි කර දෙන්න.
- ලෝකෝපකාරය - ලෝවැඩ සඟරාව වැනි උපදේශ ග්‍රන්ථවල මෙවැනි අදහස් පළවන බව පෙන්වා දෙන්න.
- වෙනත් උපදේශ ග්‍රන්ථ කියවීමට ශිෂ්‍යයන් යොමු කරන්න.
- ඇමුණුම 1හි සඳහන් අභ්‍යාස ශිෂ්‍යයන්ට ලබා දෙන්න.

**ගුණාත්මක යෙදවුම් :**

- සුභාෂිතය
- ලෝකෝපකාරය
- ලෝවැඩ සඟරාව
- සිරිත් මල්දම

**ඇගයීම හා තක්සේරුකරණය :**

- සුභාෂිතයේ පද්‍යවල ඇතුළත් යහසිරිත් හඳුනා ගෙන ඉදිරිපත් කරයි.
- යහසිරිත් ඇගයීමට ලක් කරයි.
- යහපත් සිරිත් විරිත් අනුගමනය කරයි.

# 35. අත්දැකීම් ප්‍රතිනිර්මාණය (පද්‍ය නිර්මාණය)

**නිපුණතාව :** 12.0 අත්දැකීම් පාදක කර ගනිමින් නිර්මාණකරණයේ යෙදෙයි.

**නිපුණතා මට්ටම :** 12.1 පද්‍ය නිර්මාණය කරයි.

**කාලච්ඡේද ගණන :** 02 යි.

**ඉගෙනුම් පල :**

- පද්‍ය නිර්මාණය සඳහා සුදුසු අත්දැකීම් තෝරා ගෙන ඉදිරිපත් කරයි.
- උචිත කාව්‍ය සම්ප්‍රදායක් තෝරා ගනියි.
- පද්‍ය නිර්මාණ සඳහා උචිත භාෂා ව්‍යවහාර යොදා ගනියි.
- ඖචිත්‍යයෙන් යුතු ව කාව්‍ය උපක්‍රම භාවිත කරයි.
- පද්‍ය නිර්මාණයේ යෙදෙයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස්**

- ශිෂ්‍යයන් කණ්ඩායම්වලට බෙදා ඇමුණුමේ දැක්වෙන කවි පන්ති බෙදා දෙන්න.
- එම කවි පන්තිවලට අදාළ ව පහත සඳහන් මාතෘකා යටතේ කරුණු රැස් කිරීමට ශිෂ්‍යයන්ට අවස්ථාව ලබා දෙන්න.
  - අත්දැකීම
  - කාව්‍ය සම්ප්‍රදාය
  - කාව්‍යෝක්ති
  - භාෂාව
  - විරිත්
  - ඖචිත්‍යය
- රැස් කළ කරුණු ඇසුරෙන් ශිෂ්‍යයන් සමඟ සාකච්ඡාවක් ගොඩනගන්න.
- පද්‍ය නිර්මාණයක් රසවත් වීමට ඉවහල් වන කරුණු සාකච්ඡා කරන්න.
  - සුදුසු තේමාවක් (අත්දැකීමක්) තෝරා ගැනීම.
  - තේමාවට උචිත ආකෘතියක් හා විරිතක් තෝරා ගැනීම.
  - නිර්මාණාත්මක ලෙස බස හැසිරවීම.
  - කාව්‍යෝක්ති භාවිත කිරීම.
- සුදුසු තේමාවක් ඔස්සේ කවි නිර්මාණය කිරීමට ශිෂ්‍යයන් යොමු කරන්න.
- තෝරා ගත් පද්‍ය නිර්මාණ බිත්ති පුවත් පතේ පළ කිරීමට කටයුතු කරන්න.

**මූලික වදන් /සංකල්ප :**

- කාව්‍යෝක්ති - කාව්‍යයක රසවත් බව හා අර්ථවත් බව සඳහා යොදන උපමා, රූපක, දීපක ආදිය.
- ඖචිත්‍යය - උචිත බව, සුදුසු බව, ගැළපෙන බව
- කාව්‍ය ආකෘති - ඉදිරිපත් කරන ස්වභාවය උදා : සිව්පද , නිසදැස්

**ගුණාත්මක යෙදවුම් :**

- ඇමුණුමේ සඳහන් කවි පන්ති
- සාහිත්‍ය විද්‍යාව - එදිරිවීර සරච්චන්ද්‍ර
- නවකවි සරණිය - විමල් දිසානායක

**ඇගයීම හා තක්සේරුකරණය :**

- කවි නිර්මාණයේ දී සැලකිය යුතු කරුණු විස්තර කරයි.

- පද්‍ය නිර්මාණය සඳහා සුදුසු අත්දැකීම් තෝරා ගනියි.
- පද්‍ය නිර්මාණයේ දී කාව්‍යෝපක්‍රම උචිත පරිදි යොදා ගනියි.
- රසවත් ලෙස පද්‍ය රචනා කරයි.

ඇමුණුම 1

### ආරච්චිරාල

අලියා වැටුණු වැව ආරච්චිරාල ට
මුව මස් ඌරුමස් හිඟ නොමැත කෑම ට
මුළු ගං ගොඩම හිටියත් ඔහුගෙ වාල ට
ඔහු වැඩිපුරම බය ලොකු සයිබු නාන ට

වට්ටක්කා වැලකි ඒ ගෙයි වහල ම ත
එරඬු වැටේ වැඩිපුර ලොකු කපොලු නැත
කුරහන් බිස්ස යට බල්ලට සෙවණ ඇ ත
ඔහුගේ ගෙදර මට හොඳටම මතක ඇ ත

පස් බානක්ම ඔහු හට හොර හරක් ඇ ත
ගමනට පිදුරු දමු බර බාගයක් ඇ ත
නියඟත් අවත් ඉන් වැඩිපුර බයත් නැ ත
වැව කිට්ටුවම වෙල 'ඉස්සර' හයක් ඇ ත

ඉදිකඩ ළඟම සිට ගත් මහලු පලු ග සේ
පොඩි පෙට්ටියක පානට මැසි පොකුරු නැ සේ
එළියක් දුටිමි ඒ එළියෙන් ඔහුගෙ හි සේ
මට මේ ලියන විට තව ඒ එළිය දි සේ

රජයේ සේවයෙන් කෙහෙ පැදුණු තට් ටේ
පොල්තෙල් ගෑ වැනිය අමු පොලයක කට් ටේ
තැවරුණ බවක් පවසන ගොම මුසු මැට් ටේ
කොණ්ඩය කුහුඹු ගුලියකි පොළයක නැට් ටේ

කෙස් නැති හිසට නැඟ ගන්නට බලන මෙ නි
කම්මුල් දෙසට රළු උඩු රැවුල කැරකු නි
හතරට බිඳුණු බැම රළු ලොම් ගනව ග නි
අලියා වැටුණු වැව මේ හැම ලකුණු ද නි

රජයේ සේවයට දිවි කැප කරන මෙ නී
රෑ දාවල් යයි ගංගොඩ දෙසට වැ නී
කන බොන වෙලාවට අඹුවට හොඳට බ නී
අලියා වැටුණු වැව මේ හැම ලකුණු ද නී

වී බුසලකට සිතුවොත් කුඹුරකුදු ග නී
රුපියල් දෙකක් දෙන විට පස්වරක් ග නී
සමහර විටදි ඉදිකඩ වැට උඩින් ප නී
අලියා වැටුණු වැව මේ හැම ලකුණු ද නී

මොහුගේ රාජකාරියෙ ඇති මහගු ගු     ණෝ
ගැමියන් මුහුණ බැලුවොත් හොඳ හැටිම පෙ     නේ
අසරණ අහිංසකයන්ගේ කුඹුරු අ     නේ
මොහුටය කොහොම හරි කෙළවර ගොදුරු වු     ණෝ

මොහුගේ මහගු සේවයෙ හැටි මෙයටට වැ     ඩී
යම්කිසි විටක හරකකු තැබු පසුව වෙ     ඩී
නැගෙන හරක් හොරුගේ කර උඩට දෑ     ඩී
පස්සා කකුල් දෙක ඔහුගේ ගෙයට ව     ඩී

රැළි යුතු නළල පළලින් අඩුවිය බෝ     සේ
මුගටියෙකුගෙ පැහැය ඇත වලවූ දෑ     සේ
සුදුමැලි දෙතොල උඩ බැලු කොට මොට නා     සේ
දිග ඇති පළල් කට කම්මුල සහ පෑ     සේ

මුළු රෑ ලැගී හිඳ පලු ගහක මැස්ස     ක
ලැබගෙන අහිංසකයකු පිදුව මස්ටි     ක
වළඳා අදට වූවත් වසර විස්ස     ක
පුදුමයි බලන්නට අද ඔහුගෙ රැස්ටි     ක

කිසිවෙක් නොවේ කෙරුමට මොහු සමඟ හ     බේ
වෙහෙසක් නැතුව යළ මහ අස්වනුද ලැ     බේ
කුරහන් වියෙන් බිහි තුන ඉදිමුණ ද ඉ     බේ
යම්කිසි බියක් ඔහුගේනෙත් අතර ති     බේ

දවසින් දවස වන පෙත ගංගොඩෙහි කැ     පේ
ඔහුගේ ගෙදර ළඟ කළුවර බුරුත කැ     පේ
ගැමියන් පිහිට ලැබ ගිනි ඇවිළුණ ද ලි     පේ
හැම ගැමියෙක් ම ඔහුගේ පාමුලෙහි හැ     පේ

**රන් එතනාට කියන කවි**

රන් එළියට හැන්දෑවේ මුදු කෙහෙ     දිලිසෙ න්නේ
රන් ගෝමර පෙති ඉහිලා ළමැද බබුළුව     න්නේ
රන් වන් වී කරලක් මෙන් බිමට නැමී ඉ     න්නේ
රන් එතනා ඉපනැල්ලේ මොනවද අවුල     න්නේ

උදේ ඉඳන් වැඩ කරලා දැනුයි ගොඩට එ     න්නේ
වෙලේ තමයි ජීවිතයම අවුවට කර වෙ     න්නේ
උඹේ කැකිරි සිනා පොදක් මා වෙත හෙළමි     න්නේ
හිතේ තියෙන දුක මඳකට දුරු කරවාප     න්නේ

මාස ගණන් වැස්ස නැතිව දිගටම පාය     න්නේ
වේලි ලියදි දිය හිඳිලා ඉරි තැලිලා ය     න්නේ
වේළුණු බිම ගිනියම් වී අවුව කැකෑරෙ     න්නේ
පාළු කුඹුර ගැන සිහිවන කලට පපුව ද     න්නේ

බැන්ද වරල පීරා ගෙන හෙමින් සැරේ එ න්නේ
හැන්දෑවේ සිහිල් සුළඟ ඇඟ වට නලිය න්නේ
අන්දකාර දුරු කරවන මැණික් පාන වැ න්නේ
කින්ද පාළු කුඹුරේ තව තනියම පසු ව න්නේ

කාලෙට මහ වැහි වැහලා සාගත දුරු වෙ න්ටයි
වෙලි, ලියදි, ගං ඇල, දොල පිරී ගලා ය න්ටයි
වේළුණු වැලි බිම තෙත් වී නැවුම් සුවඳ එ න්ටයි
සාරව මුළු පොළොව එයින් ජීවය උතුර න්ටයි

ළා ගොයමේ නිල්ල ඇවිත් පොළොව වසා ග න්ටයි
හිනා කිරෙන් කිරි වැදිලා කරලින් බර වෙ න්ටයි
ඇගේ පාට රන් කරලෙන් අස්වනු පීදෙ න්ටයි
හිතේ සියලු දුක් කරදර අමතක කරල න්ටයි

රන් එළියට හැන්දෑවේ මුදු කෙහෙ දිලිසෙ න්නේ
රන් ගෝමර පෙති ඉහිලා ළමැද බබුළුව න්නේ
රන් පාටට එකතු වෙලා අඳුර ගලා එ න්නේ
කින්ද පාළු කුඹුරේ තව තනියම පසු ව න්නේ

-මහගම සේකර -

**ලොකු බේබි කියයි**

මගේ ළඟින් ඉඳගෙන උඹ රෑට කියන පුංචි කතා
මල් වැට අයිනේ හිඳිනා මට සිහි වෙනවාය ලිසී

උඹේ කතාවල ඉන්නා රජ කුමරුන් කුමාරියන්
මහපාරේ යනවාදැයි බලා හිඳින්නෙමිය ලිසී

සන්තෝසෙන් පියඹා යන රන් සමනලයන් වාගේ
කුමාරයන් කුමාරියන් මා දුටුවේ නැතිය ලිසී

බඩු පොදි මලු හිසින් අරන් තෙල් බෝතල් අතින් අරන්
උඹ වාගේ අය විතරයි මහ පාරේ යන්නෙ ලිසී

ගාට ගාට අඩි තියමින් යන මග වට පිට බලමින්
උඹ වාගේ අය විතරයි මහ පාරේ යන්නෙ ලිසී

කුමර කුමරියන්ගෙ කතා මින් පසු නො කියන්න ලිසී
පුංචි කතාවක් උඹ ගැන අදම කියා දෙන්න ලිසී

- මොනිකා රුවන් පතිරණ -

**දෑසේ නිල් පැහැය**

ඔබ වෙනුවෙන් ඉදෙන බතේ
සිනා හඬට කන් දී ගෙන
පිඟ මොලවන විට ලිප ගිනි
දෙව් බොජුනක රස මැවෙන්න
දෑසේ නිල් පැහැය දැවී
සෙමෙන් තුරන් විය නොදැනිම

නැවතත් එන බව නොකියා
හිරු අවරින් නැව් නැඟි පසු
තනිව හඬන ලොවක් සමඟ
රැයට මුහුණ ලා ඉඳගෙන
ඔබ එනතුරු මඟ බලමින්
දිවි ගණනක් ගෙවනා විට
දෑසේ නිල් පැහැය සෙමෙන්
අඳුරට දිය විය නොදැනිම

බත් දෙකටක් උපයන්නට
අටු කොටු පුරවා දවසෙම
මඳ සැනසිල්ලක් ලබමින්
නිදි පැදුරේ වැජඹෙන ඔබ
නඟන සුසුම් කෙඳිරිලි හඬ
හද මිරිකා හළ කඳුළට
දෑසේ නිල් පැහැ සේදී
ගලා නිමා විය නොදැනිම

නිල් ඉඳුවර නිලේ අරුම
ඈත දියඹ නිලේ වරුණ
යොවුන් වියේ නිල් දෑසට
උවම් නැතැයි කී හිමියනි
අතීතයක් ගැන සිතමින්
මගේ දෑස දෙස නො බලා
අනාගතය දෙස යොමු වූ
දුවගෙ දෑස දෙස බලන්න.

- දයාසේන ගුණසිංහ -

## 36. ශ්‍රී ලංකාවේ පුරාසික යුගය (භූ ගවේෂණය)

**නිපුණතාව :** 10.0 සාහිත්‍යික, දාර්ශනික, විද්‍යාත්මක හා තාක්ෂණික තොරතුරු ඇතුළත් නිර්මාණ පරිශීලනයෙන් ලබා ගන්නා දැනුම විවිධ භාෂා කාර්යයන් සඳහා යොදා ගනියි.

**නිපුණතා මට්ටම :** 10.2 දැනුම ලබා ගැනීම සඳහා විද්‍යාත්මක හා තාක්ෂණික තොරතුරු ඇතුළත් පොත පත පරිශීලනය කරයි.

**කාලච්ඡේද ගණන :** 02 යි.

**ඉගෙනුම් පල :**

- පොත පත පරිශීලනයෙන් ලබා ගත් තොරතුරු ඉදිරිපත් කරයි.
- පාරිභාෂික වචනවල අර්ථ පැහැදිලි කිරීමට යොමුවෙයි.
- පාරිභාෂික වචන අර්ථවත් ව භාවිත කරයි.
- විද්‍යාත්මක හා තාක්ෂණික තොරතුරු ඇතුළත් වෙනත් පොතපත කියවීමට පෙලඹෙයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස් :**

- පෙළපොතේ දැක්වෙන භූ ගවේෂණ පිළිබඳ පාඩම කියවීමට ශිෂ්‍යයන් යොමු කරන්න.
- ශිෂ්‍යයන් සුදුසු පරිදි කණ්ඩායම් කරන්න.
- භූ ගවේෂණය පිළිබඳ පාඩමේ සඳහන් වන විශේෂ කරුණු හා වචන වෙන වෙන ම ගොනු කිරීමට උපදෙස් දෙන්න.
- ගොනු කරගත් කරුණු පන්තියට ඉදිරිපත් කිරීමට අවස්ථාව සලසා දෙන්න.
- පාඩමේ ඇති පාරිභාෂික වචන තෝරා ගැනීමට ශිෂ්‍යයන් යොමු කරන්න.
- එම පාරිභාෂික වචන අර්ථවත් ලෙස යොදමින් වාක්‍ය නිර්මාණය කිරීමට ශිෂ්‍යයන්ට මග පෙන්වන්න.
- භූ ගවේෂණය පිළිබඳ ලියැවුණු වෙනත් පොත පත කියැවීමට ශිෂ්‍යයන් යොමු කරන්න.

**ගුණාත්මක යෙදවුම් :**

- භූ ගවේෂණය ගැන ලියැවුණු පොත පත / ඡායාරූප

**ඇගයීම් හා තක්සේරුකරණය :**

- පාරිභාෂික වචන හඳුනා ගෙන ඉදිරිපත් කරයි.
- පාරිභාෂික වචනවල අර්ථ පැහැදිලි කිරීමට යොමුවෙයි.
- එම වචන යොදා වාක්‍ය නිර්මාණය කරයි.
- පාඩමේ සඳහන් වැදගත් කරුණු පන්තියට ඉදිරිපත් කරයි.
- භූ ගවේෂණය පිළිබඳ තොරතුරු රැස් කරයි.

# 37. විරාම ලකුණු

**නිපුණතාව :** 4.0 ශිල්පීය දක්ෂතා ඉස්මතු කරමින් නිවැරදි ව ලේඛන කාර්යයේ යෙදෙයි.

**නිපුණතා මට්ටම :** 4.1 විරාම ලකුණු නිවැරදි ව භාවිත කරමින් ලියයි.

කාලච්ඡේදඃ 02 යි.

**ඉගෙනුම් පල :**

- විරාම ලක්ෂණ නිවැරදි ව හඳුනා ගෙන නම් කරයි.
- විරාම ලක්ෂණ නිවැරදි ව යෙදීමේ වැදගත්කම පැහැදිලි කරයි.
- විධිමත් ලේඛනයේ දී නිවැරදි ව විරාම ලකුණු භාවිත කරයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස් :**

- ලේඛනයේ දී නිවැරදි ව විරාම ලකුණු භාවිත කිරීමේ අවශ්‍යතාව පැහැදිලි කර දෙන්න.
- පසුගිය ශ්‍රේණිවල දී ඉගෙන ගත් විරාම ලකුණු නැවත ආවර්ජනය කරන්න.
- එම විරාම ලකුණු සහිත වාක්‍ය පෙළ පොතෙන් උපුටා ගෙන ලිවීමට උපදෙස් දෙන්න.
- විරාම ලකුණු නිසි පරිදි නොයෙදීමෙන් අර්ථයට හානි වන අයුරු පහදා දෙන්න.
- ඇමුණුමෙහි දැක්වෙන අභ්‍යාසවල යෙදීමට ශිෂ්‍යයන් යොමු කරන්න.
- අභ්‍යාස පරීක්ෂා කිරීම සඳහා සාකච්ඡාවක් මෙහෙයවන්න.

**ඇගයීම හා තක්සේරුකරණය**

- විරාම ලකුණු හා ඒවා යෙදිය යුතු තැන් ප්‍රකාශ කරයි.
- විරාම ලක්ෂණ යෙදීමේ අවශ්‍යතාව පැහැදිලි කරයි.
- විරාම ලක්ෂණ නිසි පරිදි යොදමින් අභ්‍යාස සම්පූර්ණ කරයි.
- ලේඛනයේ දී විරාම ලක්ෂණ යොදා ලිවීමේ හුරුව ප්‍රදර්ශනය කරයි.

<u>ඇමුණුම</u>

**වරහන් තුළ දී ඇති විරාම ලක්ෂණ නිවැරදි ව යොදා පහත සඳහන් වාක්‍ය නැවත ලියන්න.**

( . , ඃ , ' , ' , ' , " " , ? , ! , / , - )

1. වරාය සහ ගුවන් තොටුපොළ රටක සංවර්ධනය සඳහා ඍජුව බලපාන ආයතන දෙකකි
2. වික්ටෝරියා රන්ටැඹේ මාදුරු ඔය කොත්මලේ රන්දෙණිගල යන ජලාශ රටේ කෘෂිකාර්මික සංවර්ධනයට මහත් පිටුබලයකි
3. නිවේදක සිංහල සාහිත්‍යයට ඔබෙන් සිදු වූ සේවය ප්‍රශංසනීය යි ඔබ ලේඛනයට පිවිසුනේ කෙසේ ද
4. ඔබ වහන්සේට ඔබතුමාට ඔබතුමියට ඉතාමත් ගෞරවයෙන් ආරාධනය කරන්නෙමු
5. දියණියනි ඔබගේ සියලු පැතුම් ඉටුවේවා
6. අහෝ අපට සිදුවූ විපත කුමක් ද
7. පොත් ප්‍රදර්ශනය සැප්තැම්බර් මස 10 20 දින දක්වා බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලාවේ දී පැවැත්වේ
8. සියලු සත්වයෝ සුවපත් වෙත්වා යි භික්ෂූන් වහන්සේ ආශිර්වාද කළ සේක
9. හත්පණ මගුල් කැම හීන්සැරය යන ළමා කතා කුමාරතුංග මුනිදාස සූරීන්ගේ විශිෂ්ට නිර්මාණ ලෙස හඳුන්වා දිය හැකි ය
10. දෙමවුපියෝ ඔවුන් සතු සියලු දේපළ දරුවන් අතර සමසේ බෙදා දුන්හ

# 38. මුස්ලිම් ජනතාවගේ සිරිත් විරිත්

**නිපුණතාව :** 9.0 සංස්කෘතිය හා සාරධර්ම හඳුනා ගනිමින් සහජීවනය හා ජාතිකාභිමානය ගොඩනගා ගැනීම සඳහා භාෂාව භාවිත කර ගනියි.

**නිපුණතා මට්ටම :** 9.4 විවිධ ජන කොටස්වලට අයත් සිරිත්විරිත් හඳුනා ගැනීම සඳහා ලිපි ලේඛන ඇසුරු කරයි.

**කාලච්ඡේද :** 02 යි.

**ඉගෙනුම් පල :**

- මුස්ලිම් ජනතාවගේ සිරිත් විරිත් පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි.
- මුස්ලිම් ජනතාවගේ යහ සිරිත් අගය කරයි.
- සිරිත් විරිත් හඳුනා ගෙන සහජීවනයෙන් යුක්ත ව කටයුතු කරයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස් :**

- මුස්ලිම් ජනතාව පිළිබඳ පෙළපොතේ සඳහන් පාඩම ශිෂ්‍යයන්ට කියවීමට අවස්ථාව ලබා දෙන්න.
- ඉස්ලාම් ආගමේ විවිධ සිරිත් විරිත් පිළිබඳ සාකච්ඡා කරන්න.

  <u>මුස්ලිම් සිරිත් විරිත්</u>
  - ඉස්ලාම් ආගමේ ප්‍රධාන වගකීම් පහ
  - මුස්ලිම් විවාහ ක්‍රම
  - ගනුදෙනුවල දී පොලිය තහනම් බව
  - සමාජ චාරිත්‍ර
- පන්තිය කණ්ඩායම්වලට බෙදා එක් එක් කණ්ඩායම ඉහත සඳහන් එක් එක් මාතෘකා යටතේ කරුණු ගොනු කිරීමට යොමු කරන්න.
- මුස්ලිම් යහ සිරිත්වල අගය ශිෂ්‍යයන් සමග සාකච්ඡා කරන්න.
- පෙළපොතේ අභ්‍යාසවල ශිෂ්‍යයන් නිරත කරවන්න.

**මූලික වදන් සංකල්ප :**

- හලාල් - කිරීමට සුදුසු දෙය
- හරාම් - කිරීමට නුසුදුසු දෙය
- හජ් - වන්දනාව
- මක්කම - සවුදි අරාබියේ ශුද්ධ වූ නගරයක්
- රාමළාන් මාසය - උපවාස මාසය
- නෝම්බි - උපවාස කිරීම, උදේ හිරු නැගෙන වෙලේ සිට හිරු බැස යන තෙක් නිරාහාර ව සිටීම.

**ගුණාත්මක යෙදවුම් :**

- මුස්ලිම් ආගමික සිරිත් විරිත්වලට අදාළ ලිපි / චිත්‍ර / ඡායාරූප

**ගුරුවරයාගේ අතිරේක පරිශීලනය සඳහා**

- යෝනකයා සහ බිරියන් සිව් දෙනා - එම්.එස්.එම්. අයුබ්

**ඇගයීම හා තක්සේරුකරණය :**

- මුස්ලිම්වරුන්ගේ සිරිත් විරිත් හඳුනා ගෙන ප්‍රකාශ කරයි.
- මුස්ලිම් යහ සිරිත් විරිත් අගය කරයි.
- මුස්ලිම් ජනතාවගේ සිරිත් විරිත් පිළිබඳ තොරතුරු එක් රැස් කරයි.
- සංහිඳියාවෙන් යුක්ත ව කටයුතු කිරීමට පෙළඹෙයි.

ඇමුණුම 1

**පහත සඳහන් පදවලට සමානාර්ථ පද ලියන්න.**

- සිරිත්
- උත්කෘෂ්ට
- වැඩිහිටි
- දුර්ලභ
- අවබෝධය
- කාර්යය
- ප්‍රබල
- විශේෂ
- බාහිර
- ආගමන

## 39. නාට්‍ය පිටපත් රචනය ('තල මල පිපිලා' නාට්‍යය ඇසුරින්)

**නිපුණතාව** : 12.0 අත්දැකීම් පාදක කර ගනිමින් නිර්මාණ කාර්යයේ යෙදෙයි.

**නිපුණතා මට්ටම** : 12.3 නාට්‍ය පිටපත් රචනයේ යෙදෙයි.

**කාලච්ඡේද ගණන** : 02 යි.

**ඉගෙනුම් පල** :

- නාට්‍ය රචනය සඳහා උචිත කතා වස්තුවක් තෝරා ගනියි.
- නාට්‍යෝචිත අවස්ථා මතු කර ගනී.
- නාට්‍ය රසය කුළු ගැන්වෙන පරිදි සිද්ධි පෙළ ගස්වයි.
- උචිත දෙබස් භාවිත කරමින් නාට්‍ය පිටපත් රචනා කරයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස් :**

- ඇමුණුම අංක 1හි සඳහන් සෝමලතා සුබසිංහගේ නාට්‍ය නිර්මාණය ඇසුරෙන් නාට්‍ය පිටපතක මූලික ස්වරූපය හඳුනා ගැනීමට සලස්වන්න.
  - නාට්‍යෝචිත සිද්ධියක් / කතාවක් / තේමාවක් යොදා ගැනීම. (ජනකතාවක්, ජාතක කතාවක්, අසා ඇති සිද්ධියක් හෝ තමන්ගේ පරිකල්පනයක් හෝ ඇසුරින්)
  - තෝරා ගත් සිද්ධියට / කතාවට / තේමාවට ගැළපෙන ලෙස චරිත යොදා ගැනීම
  - චරිතවලට උචිත ලෙස දෙබස් රචනය
  - නාට්‍යයේ ගලා යාමට උචිත පරිදි ජවනිකා වෙන් කිරීම
  - රංග විධාන/ උපදෙස් ඇතුළත් කිරීම
- පෙළ පොතෙහි ඇතුළත් 'තලමල පිපිලා' නාට්‍යයේ නිර්දිෂ්ට කොටස කියවා රස විඳීමට හා නැරඹීමට ශිෂ්‍යයන්ට අවස්ථාව ලබා දෙන්න.
- ඒ ඇසුරින් නාට්‍ය පිටපත් රචනය ගැන තව දුරටත් සාකච්ඡා කරන්න.
- නාට්‍ය දෙබස් ලිවීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු පෙන්වා දෙන්න.
  - චරිත නම් කිරීම.
  - චරිතයට උචිත බස් වහරක් භාවිත කිරීම.
  - දෙබස්වල සාරවත් හා ප්‍රාණවත් බව රැක ගැනීම.
  - දෙබස්වල නාට්‍යෝචිත බව ආරක්ෂා කර ගැනීම.
- කුතුහලය දනවන පරිදි සිද්ධි පෙළ ගැස්වීමෙන් ප්‍රේක්ෂකයා ආකර්ෂණය කර ගත හැකි බව පෙන්වා දෙන්න.
- නාට්‍ය රචනයේ දී රංග විධාන පිටපතට ඇතුළත් කිරීම නාට්‍ය අධ්‍යක්ෂකවරයාට මෙන් ම නළුවන්ට ද පහසුවක් බව පැහැදිලි කරන්න.
- තවත් නාට්‍ය පිටපත් කිහිපයක් පරිශීලනය කිරීමට ශිෂ්‍යයන්ට අවස්ථාව ලබා දෙන්න.
- ජනකතාවක්, ජාතක කතාවක්, තමන් ඇසූ දුටු සිද්ධියක් හෝ තම පරිකල්පනය හෝ ඇසුරින් නාට්‍ය පිටපතක් රචනය කිරීමට ශිෂ්‍යයන්ට මග පෙන්වන්න.

**ගුණාත්මක යෙදවුම් :**

හිමකුමාරි - සෝමලතා සුබසිංහ
තලමල පිපිලා - ජයලත් මනෝරත්න

ඇගයීම හා තක්සේරුකරණය :

- නාට්‍ය පිටපත් සකස් කිරීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු විස්තර කරයි.
- නාට්‍ය පිටපත් රචනය සඳහා උචිත කතා වස්තුවක් තෝරා ගනියි.
- චරිත නිරූපණය සඳහා උචිත බස් වහරක් යොදා ගනියි.
- නාට්‍යෝචිත අවස්ථා භාවිත කරමින් නාට්‍ය පිටපත් රචනා කරයි.

ඇමුණුම 1

## පස් වන ජවනිකාව

*(රජ මාලිගාවේ දර්ශනයකි. වේදිකාව ආලෝක වන විට රජු, බිසව, මහ ඇමති සහ සේවක පිරිස වේදිකාවේ සිටිති. බිසව රෙදි වෙළෙන්දෙකුගෙන් රෙදි තෝරමින් සිටියි. මව් බිසව ගෙතුමක් කරයි.)*

රජු - කෙසේද මැණියනි දූන් දූ කුමරියගේ වැඩ කටයුතු. උනන්දුවෙන් පාඩමේ යෙදෙනව ද ? සංගීත, නැටුම් පාඩම් හෙම කොහොම ද? පසුගිය කාලයේ රාජ්‍ය කටයුතු වැඩි වූ නිසා මට ඒ සොයන්න බැරිවුණා.

*(දේවිය අමනාප වේ යැයි සිතා)*

දේවිය ඒ වග හොඳින් බලන බව මං දන්නවා. මං හොයන්න ඕන නැහැ. කෝ දූ කුමරිය පේන්න නැත්තෙ ?

මව් බිසව - දූ කුමරිය ඉතා ආශාවෙන් සෑම දෙයක් ම ඉගෙන ගන්නව කියල ඇගේ සෑම ගුරුවරයෙක් ම කියනව ඈ කොතරම් උනන්දුවෙන් පාඩමේ යෙදෙනව ද කීවොත් ඔවුන්ට පාඩම නවත්වන්න පවා හිත දෙන්නේ නැතිලු.

මහ ඇමති - කුමාරිකාව, ඉතිහාසය, රාජ්‍ය පාලනය වගේ විෂයයන් ගැන ඉතා උනන්දු බව පේනවා. පුංචිකමට බලන්න එපායැ, මගෙන් අහන ප්‍රශ්න. පිය රජ්ජුරුවො රට හොඳින් පාලනය කරනව ද ? රට වැසියන් පිය රජ්ජුරුවන්ට කැමති ද?

රජු - මහ ප්‍රශ්න ඇති වෙන්නයි යන්නෙ. එහෙනං මගේ රාජ්‍ය කටයුතු ගැන බලන්න පුංචි පරීක්ෂකවරියක් හැදිල. හරි අගෙයි ! බොහොම හොඳයි.

දේවිය - ඒ වුණාට පුංචි අයට ඕන දේවල් නොවෙයි ඒ. ඒව ගැන දැනගන්න ඕන නෑ කොහොමටවත් ගෑනු දරුවො. මං හිතන්නේ හොඳයි ඇයව ගේ දොර වැඩපල ඉගෙන ගන්න යොදවන්න. ගෑනු දරුවො වුණාම ඒවා හොඳින් දැනගන්න ඕන. අපි හැදුනෙ වැඩුනෙත් එහෙමයි.

මව් බිසව - ඒව එහෙම තමයි. ඒත් දූ කුමරිය තවම පුංචියි. අනෙක හරි දක්ෂයි. ඒ වගේ දේ නං බොහෝ ඉක්මනට ඉගෙන ගනියි. ඉතිං පස්සෙ බැරියැ....දේවිය - දැං පුංචි වැඩි නෑ... දැං තමයි පටන් ගන්න ඕන. පහු වුණාම ඒවට කම්මැලි වෙනවා. කොහෙ ද අප්පච්චිලාට, අත්තම්මලාට තාම ඈ කිරි දරුවෙක්නෙ.

**- හිම කුමරිය, සෝමලතා සුබසිංහ -**

## 40. සාම්ප්‍රදායික යෙදුම්

**නිපුණතාව :** 5.0 භාෂාමය කාර්යයේ දී වාක්කෝෂය භාෂා සම්ප්‍රදාය හා භාෂා ව්‍යවහාර පිළිබඳ දැනුම ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම :** 5.2 සාම්ප්‍රදායික යෙදුම් භාෂාමය කාර්යයේ දී උචිත පරිදි භාවිත කරයි.

**කාලච්ඡේද ගණන :** 02 යි.

**ඉගෙනුම් පල :**

- සාම්ප්‍රදායික යෙදුම් හඳුනා ගෙන ඉදිරිපත් කරයි.
- සම්ප්‍රදායික යෙදුම් භාවිතයෙන් අදහස් රසවත් ව ඉදිරිපත් කළ හැකි අයුරු විස්තර කරයි.
- අදහස් ප්‍රකාශනයේ දී සාම්ප්‍රදායික යෙදුම් භාවිත කරයි.
- සාම්ප්‍රදායික යෙදුම් එක් රැස් කිරීමට පෙලඹෙයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස් :**

- සාම්ප්‍රදායික යෙදුම් පිළිබඳ ශිෂ්‍යයන්ගේ පෙර දැනුම අවදි කරන්න.
    - ප්‍රස්තාව පිරුළු
    - රූඩී (ඉඟිවැකි)
    - යුගල පද
- සාම්ප්‍රදායික යෙදුම්වල ප්‍රයෝජන සාකච්ඡා කරන්න.
    - අදහස් ඉතා රසවත් ව පැවසීමට
    - සිත් ගන්නා ලෙස ඉදිරිපත් කිරීමට
    - අදහස වඩාත් උද්දීපනය කිරීමට
    - ව්‍යවහාරයේ දී මෙන් ම නිර්මාණකරණයේ දී භාවිත කිරීමට

- 'තලමල පිපිලා' පාඩමෙන් උදාහරණ ඉදිරිපත් කරමින් සාම්ප්‍රදායික යෙදුම් හඳුනා ගැනීමට සලස්වන්න.

- එක් එක් සාම්ප්‍රදායික යෙදුම් වර්ග සඳහා තව දුරටත් උදාහරණ ඉදිරිපත් කරමින් දැනුම තහවුරු කරන්න.

<u>ප්‍රස්තාව පිරුළු</u>

අවස්ථාවට ගැළපෙන පරිදි බස රසවත් කිරීමට යොදන කියමන්

උදා : බල්ලොත් එක්ක නිදා ගත්තොත් නැගිටින්න වෙන්නෙ මැක්කොත් එක්ක
ඉබ්බා දියේ දැම්මා වගේ
ආඬි හත්දෙනාගේ කැඳ හැලිය වගේ
කළුවා මාරපන ගියා වගේ
බළල්ලු මරල හොයන සල්ලි ඤාව් ඤාව් ගානවයැ

<u>ඉඟි වැකි</u>

- මතුපිටින් පෙනෙන අර්ථයට වඩා වෙනත් අර්ථයක් ලබා දෙන යෙදුම්
- දීර්ඝ ව කිව යුතු අදහසක් කෙටියෙන් පැවසීමට යොදන යෙදුම්

උදා :- සායම ගියා - ගෞරවය කෙලෙසී ගියා
බඩේ පාර - අලාභය
ඇහැට වැලි ගහලා - වංචනික ලෙස
ඉහේ මලක් පිපුණා - දැඩි සතුටක් ඇතිවුණා

එලොව පොල් පෙනුණා - බියට හෝ තැතිගැන්මට හෝ ලක් වුණා
මළ ඉලව්ව - නොවැදගත් දෙය / කරදරකාර දෙය

<u>යුගල පද</u>

- පද දෙකක් එකට යෙදී අර්ථ ප්‍රකාශ කිරීම.

| | | |
|---|---|---|
| උදා :- | ඉවුම් - පිහුම් | අඩු - පාඩු |
| | මිල - මුදල් | ගහ - කොළ |
| | ළමා - ළපටි | එළි - පෙහෙළි |

- ඇමුණුමේ සඳහන් අභ්‍යාසවල ශිෂ්‍යයන් නිරත කරවන්න.

**ගුණාත්මක යෙදවුම් :**

- යුගල පද වර්ග කරන ලද පුවරුවක්
- ප්‍රස්තාව පිරුළු වර්ග කරන ලද පුවරුවක්
- තලමල පිපිලා නාට්‍යය - ජයලත් මනෝරත්න

**ඇගයීම හා තක්සේරුකරණය :**

- සාම්ප්‍රදායික යෙදුම් හඳුනා ගෙන විස්තර කරයි.
- සාම්ප්‍රදායික යෙදුම්වල අගය පැහැදිලි කරයි.
- සාම්ප්‍රදායික යෙදුම් එක් රැස් කරයි.
- අදහස් රසවත් ව ප්‍රකාශ කිරීම සඳහා සාම්ප්‍රදායික යෙදුම් භාවිත කරයි.

## ඇමුණුම 1

'අ' කොටසේ සඳහන් ඉඟිවැකිවලට ගැළපෙන අර්ථ 'ආ' කොටසෙන් තෝරන්න.

| 'අ' | 'ආ' |
|---|---|
| මුහුණේ දැලි ගෑවා | විපතට පත් කළා |
| හැටට හැටේ | තැතිගැන්මට පත් වුණා |
| ලුණුවක් කාලා | අධික වේගයෙන් |
| දවල් තරු පෙනුණා | ගෞරවය කෙලෙසුවා |
| බත් පතේ වැලි දැම්මා | උපායකට හසු වී |

පහත සඳහන් යුගල පද සම්පූර්ණ කරන්න.

ඉවුම් - ..................
.................. - පුදුම
ඔප්පු - ..................
තරහ - ..................
ඉඩම් - ..................

පහත සඳහන් ප්‍රස්තාව පිරුළු සම්පූර්ණ කරන්න.

ආඬි හත් දෙනාගේ .................................
රයිගමයයි .................................
ඉබ්බන්ගෙන් .................................
අට්ටික්කා ගහේ .................................
අනුන්ට කළ දේ.................................
යුද්දෙට නැති .................................